# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.07.23

වර්ෂ 2019 ක් වූ ජූලි මස 23 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජූලි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.06.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.06.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න නැත්නම් 2019.06.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019.06.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි,

38 පිටුව

"හේතුව තමයි සභාවට දක්වන විරෝධතාවය" ඒක "හේතුව තමයි සභාපතිවරයාට දක්වන විරෝධතාවය" ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එසේ ප්‍රකාශ කරනවානම් අපි ඒක පිළිගන්නම්, අදාළ නිලධාරියා පවසා සිටිනවා සභාවට දක්වන විරෝධතාවය ලෙස තමයි කියලා හඬ පටයේ සඳහන් වෙන්නේ. ඔබතුමා එහෙම කියනවානම් ඒක සංශෝධනය කරන්නම්. වෙනත් සංශෝධන තියෙනවාද?.

ඇත්තටම තිබුණ ලොකු ගැටළුවක්, ලොකු අර්බුදයක් තමයි මේක. ඒක 99% ක් සම්පූර්ණ වීම පිළිබඳව අදාළ නිලධාරිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. නරක කියනවා වගේම හොඳ වෙලාවේ හොඳයි කියලා කියන්නත් අපි පැකිලෙන්න නරකයි. ඒ නිලධාරිතුමාට සභාව විදියට අපි ස්තුතිවන්ත වෙනවා. සැහෙන්න මහන්සියක් දරනවා. මන්ත්‍රීවරු දකින්න ඇති එනකොට එතුමා සැහෙන්න කැපවීමෙන් ඒ කාරණය ඉෂ්ඨ කරනවා. සභාපතිතුමා විදියට මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් වැඩේ හරියට කරගෙන යන්න කියලා කියනවා. මෙහෙම ස්තුති කරන කොට ඊළඟ සැරේ වෙන්නේ මේ පිළිබඳ අවධානය අඩු වෙන එක.

2019.06.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධනය ඇතුළත්ව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශේෂ නිවේදන යටතේ මට කියන්න තියෙන්නේ ලබන වර්ෂයේ අයවැය සඳහා අපි ඔබතුමන්ලාගෙන් යෝජනා ඉල්ලලා තියෙනවා. ඒවා ලබා දෙන්න. ස්වේච්ඡා සංවිධාන කීපයක යෝජනා මේ වන විට ලැබිලා තියෙනවා. ඉතිං ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ලබන වර්ෂයේ අයවැය සඳහා යෝජනා ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම ඉල්ලා සිටිනවා පසුගිය සංවර්ධන යෝජනාවලින් නොකෙරුණු සංවර්ධන යෝජනා අයවැය සකස් කිරීමේදී ඇතුළත් කරන්න කියලා. අවශ්‍යම සංවර්ධන යෝජනා තමයි පසුගිය කාලේදී ඉදිරිපත් කලේ. නොකෙරුණු සංවර්ධන යෝජනා ඊළඟ අයවැයට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවා පසුගිය කාලේ යෝජනා කරපු ඒවාගෙන් නොකෙරුණු සංවර්ධන යෝජනා නැවත යෝජනා කරන්න කියලා. මම අහන්න කැමතියි එහෙම කිවුවේ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගෙන්ද කියලා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනා කරන්න නෙමෙයි මම කිවුවේ අයවැයට ඇතුළත් කරන්න කියලා.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ඉතිං ඇත්තටම විශේෂ යෝජනා අයවැයට දාලා වැඩක් නෑ. අපි ගියපාර කරපු යෝජනා කෙරිලා නැනේ. බලමු ඉතිං. ඒක ප්‍රශ්නයක් නෑ. ඔබතුමාලා අපි මේ ප්‍රශ්නය පිළිබඳව වෙනම සාකච්ඡා කළ යුතුයි.

නමුත් මේක අවස්ථාවක් කියලා මම හිතා ගන්නවා. මොකද හේතුව අපි විශේෂ යෝජනා අයවැයට දාලා ගේන ඒවා නෙමෙයි, අපේ මැති ඇමතිවරුන්ගෙන් හම්බවෙන ගම්පෙරලිය වැඩසටහනට

යෝජනා දාලා වැඩ කරන්න යනකොටත් බාධාවක් තියෙනවා. මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි අදින් පස්සේවත් මේ ක්‍රමය වෙනස් කරන්න කියලා.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද තියෙන බාධාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බාධාව තමයි, ඔබතුමා දන්නවා මේකේ ඉතිහාසය. රංගනී මන්ත්‍රීතුමියගේ ඒ පාර හදන කොටත් වුනා. මේකේ පාරවල් ඕන තරම් තියෙනවා හදන්න. එහෙම තියෙද්දි එතනට ගිහින් දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නොකෙරුණාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන ටික අහලා උත්තර දෙන්න ඔබතුමා. ඉවසීම තියාගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට මේ අවස්ථාවේ කාලය ලබා දෙන්න බෑ. නමුත් දෙන්නම් කියන්න ඉක්මනට. මගේ මූණ බලලා උත්තර බලාපොරොත්තු වෙන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන වෙලාවට මම කියන්න ලැස්ති නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මගේ මූණ බලලා උත්තරය බලාපොරොත්තු වෙලා මම උත්තර දෙන්න යනකොට වෙන මොකක් හරි කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ කතාවට බාධා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තමයි කියාගෙන යන්න හදන්නේ. ඔබතුමානේ පටන් ගන්න හදන්නේ. අපි ආවේ සභාව කරගෙන යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාගෙන යන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියාගෙන යන්න තමයි හදන්නේ. ඒක තමයි කරන්න හදන්නේ. අහගෙන ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාව දැනගන්න ඕන. තමුන්නාන්සේලා හැමදෙනාටම ගෞරවයක් එනවා මේ සභාවේ තියෙන පාරවල් හැදිලා ගහකොළ හොඳට තියෙනවා නම්. හැමකෙනාටම ගෞරවයක් එනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව හොඳයි කියලා. නමුත් අද කෙරෙන වැඩේ තමයි බොහොම පැහැදිලිව, මම ගලගාවද්දුව වත්ත හරහා යන පාරට ඇස්තමේන්තුවක් හදවලා තාක්ෂණ නිලධාරිතුමාට කියලා එක දවසින් භාරදුන්නා ඇස්තමේන්තු දෙකක්, මීපාවල පතිරගෙවත්ත පාරටයි, ගලගාවද්දුව වත්ත හරහා යන පාරටයි. නමුත් මේක අබේසේකරගේ එකක් නිසා යැවුවේ නෑ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට. අපි බලන් ඉන්නවා එහෙන් අනුමැතිය එනකම්. මොකද අවුරුද්ද අන්තිම වෙනකොට සල්ලි යනවා. අන්තිමට බලනකොට අතනට ගිහින් දාලා තියෙනවා ප්‍රීමික්ස් ටිකක්.

ඊළඟට මොකක්ද, උළුවිටිකේ හතරේ කණුව ලඟින් යන්න තියෙන පාරට මනූෂ නානායක්කාර මැතිතුමාගෙන් ප්‍රතිපාදන හම්බ වුනා සංවර්ධනය කරන්න. ඒ පාරට ප්‍රීමික්ස් ගිහින් දැම්මා. ගරු සභාපතිතුමනි, අපි සහයෝගයෙන් සභාව ගෙනියමු. සභාවේ වැඩ ටික කෙරිලා තිබුණම ඔබතුමාට වෙනම ගෞරවයක් එනවා. මේ ආරෝව මෙහෙම ගන්න එපා. අපි කවුරුත් ආවේ සේවයක් කරන්නනේ. මේ ටික අපි ඉස්සරහටත් නිවැරදි කරගෙන කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒ පාරවල් දෙක ප්‍රීමික්ස් දාපු?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊරියගහ හන්දියේ ඉඳලා මීටර් 200 ක් විතර එහාට යනකොට වම් අත පැත්තට තියෙනවා ගලගාවද්දුව හරස් පාර. ඒ පාරට ඇස්තමේන්තු සකස් කරලා තිබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** අබේසේකර මන්ත්‍රීතුමා, අපිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒ මාර්ගය ගැන දැනුවත් කරලා නෑ. වෙනදට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සකස් කරන මාර්ග සියල්ලම අපිට දන්වනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** **:-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නෙමෙයි මේ ප්‍රාදේශීය සභාවෙන් කරන්නේ. තාක්ෂණ නිලධාරිතුමා ඒ පාරවල් දෙකේ ඇස්තමේන්තු හදලා මෙහෙට භාර දුන්නා. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් එව්වා මේකට ඇස්තමේන්තු සකස් කරලා එවන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා වැඩසටහන් නිලධාරි ගාමිණි හෙට්ටිආරච්චි මහතාට මේ ගැටළුව පිළිබඳව සභාව දැනුවත් කිරීමට.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී වැඩසටහන් නිලධාරි ගාමිණි හෙට්ටිආරච්චි මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ගලගාවදූව වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත යොමු කළ බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** **:-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා** **:-** ගුණවති මිස් මගින් මගට ඉල්ලීමක් කරා කවුරුවත් මේ පාර හදන්නේ නෑ කියලා. ප්‍රීමික්ස් ලැන්ඩ් මාස්ටර් දෙකක් විතර ගියේ ඒ පාර හදන්න. ඒ පාර අලුතෙන් හදන්න අවශ්‍ය පාරක් නෙමෙයි. ඕන තරම් පාරවල් තියෙනවා ඔපාත ගමේ, මීපාවල ගමේ අලුතෙන් හදනවානම්. මේක තේරුම් අරගෙන ඔබතුමා ඕන විදියකට තීන්දු තීරණ අරගන්න. මම දැනුවත්ව නම් ඒකට සභාවේ යෝජනාවක් ඇවිත් තාක්ෂණ නිලධාරිතුමා වාර්තාවක් හැදුවේ නෑ. ඕනනම් තාක්ෂණ නිලධාරිතුමාගෙන් අහන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** **:-** මොකද නැත්තේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** **:-** පළාත් පාලන අමාත්‍යාංශයෙන් දන්වනවා ඇස්තමේන්තු එවන්න කියලා. ඒ අනුව තාක්ෂණ නිලධාරිතුමා ගිහින් බලලා ඇස්තමේන්තුවක් හැදුවා. ඒක පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට යවලා තියෙනවා.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය** **:-** මම අනන්තවත් යසරත්න මන්ත්‍රීතුමාට කිවුවා මේ පාර හදලා දෙන්න කියලා. එතුමා කිවුවේ තව පාරවල් හදන්න තියෙනවා ඒ නිසා පස්සට බලමු කියලා. එහෙම තමයි හැමදාම කිවුවේ. ඒ නිසා තමයි ඒ පාර ප්‍රීමික්ස් කරේ. මමත් යන්නේ පයින්. මටවත් යන්න බෑ. ඒ තරම් අපහසුතාවයක් තිබුණේ. ඒ නිසා තමයි ප්‍රීමික්ස් දාලා ඒ වලවල් ටික වැහුවේ. අපි ඇත්තටම දන්නේ නෑ ඒ පාර සංවර්ධනය කරන්න ඉන්නවා කියලා. කරන්නේ නැති නිසා තමයි ඒ පාර ප්‍රීමික්ස් කරේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** **:-** ඒක ඇත්ත සභාපතිතුමනි, මෙතුමිය ඉල්ලීම කරා. මගේ ප්‍රතිපාදන නැති නිසා අබේසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන යොදවන්න හැදුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** **:-** මම ඒකට යෝජනාවක් දැම්මා මන්ත්‍රීතුමිය.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය** **:-** ඔබතුමාලා දැන් මෙහෙම කිවුවට අපිට කලින් කිවුවේ නැනේ. කලින් කිවුවානම් ඒක කරන්නේ නෑ. කිවුවේ නෑ යෝජනාවක් දැම්මා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** **:-** දැන් සාමාන්‍යයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන කොට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලියුමක් එවනවා මේ සභාවට මේ පාරවල් ටික හදන්න ඇස්තමේන්තු ටික එවන්න කියලා. තාක්ෂණ නිලධාරිතුමා දන්නවානේ ඒ පාරට ඇස්තමේන්තුවක් හැදුවා කියලා. ඒක දැන් යවලා තියෙනවා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය** :- මම එහෙම දැනුවත්භාවයක් තිබුණේ නෑ. මම ඒ පාර ප්‍රීමික්ස් කරන්න කියලා කිවුවා තාක්ෂණ නිලධාරිතුමාට. එහෙම නම් මට කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඕක ගැන අපි තාක්ෂණ නිලධාරිතුමාගෙන් ඇහුවම කිවුවා ඇස්තමේන්තුව හැදුවේ මේ පාරේ ඒ කොටසට නෙමෙයි කියලා. ඒ පාරට තමයි නමුත් ඒ කොටසට නෙමෙයි කියලා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** :- මම හදපු පාරටත් ඇස්තමේන්තු දෙපැත්තෙන්ම හැදුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- එහෙම නම් ප්‍රශ්නයක් නෑ. හදන්න ඉන්න පාරක් ප්‍රීමික්ස් කරනවා නම් වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අපි ගලගාවදූව වත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කරන එකේ ඇස්තමේන්තුව යවලා තියෙන්නේ 2019.05.16 වෙනිදා. අද 2019.07.23 මාස දෙකකට වැඩියි. ඔය ගොල්ලෝ කරනකන් අපි බලන් ඉන්නද කියන්නේ මාස දෙක තුනක් යනකම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- එහෙම කියන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එහෙම කියන්න එපා නෙමෙයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- මම මේක හොයලා බැලුවා මේ ඇස්තමේන්තුව යැවුවට පස්සේ. පහුගිය කාලේ මතකද මම ලක්ෂ 60 ක සංවර්ධන වැඩ කරා. ඔබතුමා මට බැන්නා සභාවේදී. සභාවේ මට බැන්නට මම වැඩ කරා. යෝජනා ටික යැවුවට පස්සේ බකන් නිලන් හිටියට වැඩ කෙරෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- තියෙන ප්‍රශ්නේ ඉවර කර ගත්තනේ. මේ ඇස්තමේන්තු යවලනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- ඇස්තමේන්තු යැවුවට පස්සේ අපි පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට ගිහින් හොයලා බලන්න ඕන. මේ 2019.05.16 වෙනිදා යවපු ඇස්තමේන්තු ටික මම පළාත් පාලනයට ගිහින් බැලුවහම කිවුවා මේ පාරවල් ටික බලන්න යන්න සභාව දැනුවත් කරා කියලා වාහනයක් එවන්න. පාරවල් මනින්න යන්න වාහනයක් එවුවේ නැහැලු ඉංජිනේරු මහත්තයට. ඊට පස්සේ මම දවසක් ගිහින් තාක්ෂණ නිලධාරිතුමාට කෝල් කරලා තමයි ඇස්තමේන්තු ටික ආයෙම පරීක්ෂා කර ගත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- මන්ත්‍රීතුමා අපි කතාකරාම එහෙන් කියන්නේ අපිට සභා විස්සක වැඩ කරන්න තියෙනවා. ඔබතුමාලා කියන ඉක්මනට අපිට වැඩ කරන්න බෑ කියලා. අනිත් එක ඉංජිනේරු මහත්තයට වාහනයක් තියෙනවා. අපේ වාහනය යවලා පාරවල් මනින්න ගෙන්නන්න ඕන නෑ. ප්‍රාදේශීය සභා ඔක්කොම බලන්න ඉන්නේ එක නිලධාරියයි. මේ රජයේ පළාත් පාලන විෂයභාර ඇමතිතුමා ඔබතුමාලගේ පක්ෂයේනේ. එතුමට කියල නිලධාරීන් වැඩි කර ගන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- ඒක මෙතුමට අයිති නෑ. ඒක අයිති පළාත් සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- දැන් පළාත් සභාවක් නෑ නේ. නිලධාරීන් වැඩි කරන්න කියන්න. සභා ඔක්කොම බලන්න ඉන්නේ එක නිලධාරියයි. ඒ නිලධාරියාට වාහනයක් තියෙනවා. වාහන දීලා නිලධාරීන්ව ගෙන්වන්න බෑ. අඩුම තරමේ ඔබතුමන්ලා ඒ සම්බන්ධීකරණයවත් කරන්න ඕන. ඔබතුමන්ලා එහෙම නොකර මේක පරක්කු වුනාම චෝදනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** :- ඔබතුමා එහෙම කියන්න එපා. මම ගියපු දවසෙම ඒ වැඩේ කෙරුනනේ. මම ගිහින් කතා කරා. එදාම ලේකම්තුමාට කතා කරා. ඔබතුමාටත් කතා කරා. තාක්ෂණ නිලධාරිතුමාටත් කතා කරා. ඊළග දවසේ ගිහින් පාරවල් ඔක්කොම පරීක්ෂා කරා. වැඩේ ඉවරයි දවස් දෙකයි ගියේ. වැඩ කරන ක්‍රමයක් තියෙනවා. අපිට උනන්දුවක් තියෙන්න ඕන. ඒ නිසා තමයි මේක වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මතුවුණු කාරණාව නෙමෙයි යන්නේ. ප්‍රශ්නේ ඉවරයක් කරන්නකෝ. දැන් අබේසේකර මන්ත්‍රීතුමා කිව්වා ගලගාවද්දුව පාරේ ඇස්තමේන්තුව යවලා නෑ කියලා. මේ යවලා තියෙන්නේ. දැන් ඒකට මොකද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පහුවෙලා යවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුවෙලා මොකක්ද? 2019.05.16 යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පතිරගෙවත්ත පාරේ ඇස්තමේන්තුව කවදද යවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් එදාම යවලා තියෙන්නේ. එක ලැයිස්තුවට යවලා තියෙන්නේ. දැන් මොකක්ද ඔබතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පතිරගොඩ පාරේ ඇස්තමේන්තුවේ පොඩි වෙනස්කමක් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තු දෙකම එක ලැයිස්තුවෙන් යවලා තියෙන්නේ. වැරදි ඔළුවේ තියාගෙන වැරදි විදියට චෝදනා කරන්න එපා. සභාපතිවරයා විදියට මම කිසි පාරක් නවත්වලා නෑ. රංගනී මන්ත්‍රීතුමියගේ පාර කෙරුණේ නැද්ද?. ලක්ෂ 10 න් ඒ පාර කෙරුණේ නැද්ද?. බොරු හේතු කියන්න එපා. ඒ පාර සභාවේ සල්ලි ලක්ෂ 10 නුත් කෙරුණා. ආණ්ඩුවෙන් එන රුපියලක්වත් හරවලා යවන්නේ නෑ. නමුත් වෙනත් සභාවල බලන්න සම්පූර්ණයෙන්ම සභාපතිවරයා අධීක්ෂණය කරනවා. ලඟ ඉන්නවා. සභාපතිවරයාගේ බෝඩ් එකත් ගහන්න ඕන. අපි කවදාවත් එහෙම මැදිහත් වෙන්නේ නෑ. රත්ගම, බද්දේගම වගේ ප්‍රාදේශීය සභාවල බලන්න. සභාපතිවරයාගේ රූපෙත් දාන්න ඕන බෝඩ් එක ගහන කොට. නැත්නම් බෝඩ් ගහන්න දෙන්නේ නෑ. පාරවල් වලට එහෙම බකල් කරන්න පුළුවන් හැම දේම කරනවා. ඔය මට්ටමෙන් චෝදනා කරන්න එපා. අනෙක් එක තමයි ප්‍රීමික්ස් දාලා අපි රුපියල් පනස්දාහට ලක්ෂයට අඩුවෙන් පාරවල් ප්‍රතිසංස්කරණය කරනවා. මම කියන්නේ මහජන මුදල් විනාශ කරන්න එපා. ප්‍රීමික්ස් කරන්න බැරි, යන්නම බැරි පාරවල් තියෙනවා නම් හදන්න. ඒ පාරවල් වලට තමයි මුදල් වෙන් කරන්න ඕන. ප්‍රීමික්ස් කරන්න බැරි පාරවල් තියෙනවා. අලුතෙන් හදන්න ඕන පාරවල් තියෙනවා. පස් තියෙන පාරවල් තියෙනවා. ඒවා හදන්න.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒක හරි. ඒක පිළිගන්නවා. පාරක් හදන කොට හදන්න ඕන අන්තිමට අබලන් පාරවල්. මම පාරවල් දහයක් දොළහක් විතර දැනට හදලා තියෙනවා. තව පාරවල් දෙකක් විතර තියෙනවා ඒ වගේ වලවල් දෙකක් තුනක් තියෙන්නේ. ඒ නිසා මම හැදුවේ නෑ අපරාදේ. ඒ පාරවල් තව කැඩෙන්න කලින් ප්‍රීමික්ස් ටිකක් දාලා හදලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාරවල් දෙක ලියලා දෙන්න. ප්‍රීමික්ස් දාලා දෙන්නම්. පක්ෂ විපක්ෂ භේදයක් නැතුව මන්ත්‍රීවරු යෝජනා දෙන්න. ප්‍රීමික්ස් දාන්න ඕන පාරවල් ගැන, කරලා දෙන්නම්. ලක්ෂ ගණන් සල්ලි වියදම් කරලා නාස්ති කරන්න එපා. අපරාධයක් ඒක.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට පොඩි අදහසක් ප්‍රකාශ කරන්න ඕන. මම පහළට ගිය අතරේ එතන එක මනුස්සයෙක් හිනා වුනා. හිනාවට කාරණාව බැලුවහම සභාවේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම කියලා මට තේරුණා. මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් හා සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් මීට වඩා විනීතව අපි හැසිරුනොත් හොඳයි කියලා සභා කටයුතු වලදී. මයික්‍රෆෝනයෙන් කතා කරන එක පහළට හොඳටම ඇහෙනවා. මම පහළට යන අවස්ථාවේ ගෑණු කෙනෙක් අතින් කට වහගෙන හිනා වුනා. අබේසේකර මන්ත්‍රීතුමා කිව්වා "අහගනින්" කියලා. ගරු සභාපතිතුමා කිව්වා "කියපන්" කියලා. ඒවගේ වචන භාවිතා කරන එක හොඳ නෑ. පහළට හොඳට ඇහුණා. රෙකෝඩින් එක බැලුවොත් අහන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඔබතුමාගේ රාජකාරිය කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම කියන්නේ මීට වැඩිය විනීතව හැසිරෙන්න කියලා. මන්ත්‍රීවරු වුනහම ආවේගෙට එහෙම කියවෙන්න පුළුවන් ඇත්තටම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ කිවුවේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කිවුවේ නැත්නම් ගැටළුවක් නෑ. මම හිතන්නේ මීට වැඩිය විනීතව සියලු දෙනා හැසිරිය යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙහෙමයි සභාපතිතුමා අපේ පක්ෂයේ මගේ සහෝදර මන්ත්‍රීතුමා කියපු නිසා කියන්න ඕන. මම ඒ වෙලාවේ සහභාගි වෙලා හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආවේගශීලීව කතා කරා. ඔබතුමත් කිවුවා. මාත් කිවුවා. ඒකට කිට්ටුවෙන් යන මොකක් හරි කියවුනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමාට ''කට වහනවා'' කිවුවා. සභාපතිතුමා ''කියනවා'' කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරියට හරි. ඒක තමයි කිවුවේ. ''කට වහනවා'' කිවුවා. මම ''කියනවා'' කිවුවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක ටිකක් පරීක්ෂා කරන්න ඒ වගේ දෙයක් ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ''ගනින්'' කියලා කිවුවේ නෑ මන්ත්‍රීතුමා. එහෙම කිවුවේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒ වචනය ඒ වෙලාවේ පිටවෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ ඔය විදියට තමයි කිවුවේ. මම වගකීමෙන් කියනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඊට වැඩිය සංවරව හැසිරෙන්න ඕන කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊටත් වැඩිය සංවරව හැසිරෙන්න ඕන කියලා මම කියනවා.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-** නැත

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-** නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

**01.** දේපල තහනම් කිරීමේ නිලධාරීන් තිදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිඟ බදු මුදල් සෑහෙන්න ප්‍රමාණයක් අය වෙන්න තියෙනවා. අපි ජංගම සේවා කීපයකුත් කරලා උත්සාහ දැරුවා අය කර ගන්න. නමුත් අයවීම බොහොම අඩුයි. ඒ අනුව තමයි කොමිස් පදනම මත දේපල තහනම් කිරිමේ නිලධාරීන් බඳවා ගන්න තීරණය කරේ. කොමිස් මුදල 10% ක් ලබා දෙනවා චක්‍රලේඛ අනුව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාවෙන් වැටුපක් ගෙවන්නේ නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. කොමිස් මුදල විතරයි. හැම එකකටම නෙමෙයි වරෙන්තු නිකුත් කරපු හිඟ වරිපනම් මුදල් එකතු කරන්න තමයි බඳව ගන්නේ. ඒ එකතු

වෙන මුදලින් 10% ක් දෙන්නේ. හිඟ නැති අය ගෙවන ඒවාට නෑ. මේ දේපල තහනම් කිරීමේ නිලධාරීන් ඒකට තමයි බඳවා ගන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** වරෙන්තු නිකුත් කලා කිවුවේ?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රතු නිවේදන නිකුත් කරනවා. දැනටත් නිකුත් කරගෙන යනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒවා එනකම් ඉන්න ඕන නේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් එක්ක සමගාමීව යන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තුන්දෙනෙක් ගන්නේ නැතුව මුලින් එක්කෙනෙක් අරගෙන බලමුද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ බෝපෙ පෝද්දල මුළු බල ප්‍රදේශයටම ප්‍රධාන කාර්යාලයට විතරක් නෙමෙයි, උප කාර්යාලයටත් එක්ක. අපිට තුන්දෙනෙක් නෙමෙයි දහදෙනෙක් ගත්තත් ගැටළුවක් නෑ. කොමිෂන් එකක් ගෙවන්නේ. මෙහෙන් ශත පහකවත් මුදලක් යන්නේ නෑ. දහ දෙනෙක් ගත්තොත් අපිට කාලය ඉක්මන් වෙනවා. ගෙවන්නේ කොමිස් මුදලක්. එකතු කරන මුදල් වලින් ගෙවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා තනියෙන් යනවට වැඩිය කණ්ඩායමක් ඉන්න එක හොඳයි. එකතු කරන මුදල් වලින්නේ කොමිස් මුදල ගෙවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තැන්පත් මුදලක් තියා ගන්නවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඒක චක්‍රලේඛන අනුව තියෙන්නේ රුපියල් පන්දාහයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවේ ඔබතුමා දන්නවා ඔහොම අමාරුවේ වැටුණා කට්ටිය. අන්තිමට ඉඩම් පවා නැතිවුණා. මම දන්නේ නෑ කවුරුත් හිතලා තීන්දුවක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එදිනෙදා එකතු වෙන මුදල් සභාවට බඳින්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්නේ නෑ. දවසකට රුපියල් පන්දාහක් එකතු කරන කතාවක් නෙමෙයි නේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පහුගිය දවස්වල මෙහෙම දෙයක් සිද්ධ වුනා. සල්ලි එකතු කරන කෙනා ගියාම ගමේ අය දන්නවානේ මුල් මාසේ ගියාම. වරිපනම් එකතු කරන්න දාලා තියෙනවා කියලා දන්නවානේ. දැනුවත් කරනවානේ මෙහෙම දාලා තියෙනවා කියලා. එයා සල්ලි එකතු කරනවා. ඊට පස්සේ ගිහිල්ලා එයා පෞද්ගලිකවත් එකතු කරලා තියෙනවා. එහෙම දේවල් ගිංතොට සිද්ධ වුනා. ගෙවල් වලින් ඇහුවම එයාලට දුන්නා කියනවා. නමුත් බොරුවට බිලක් දීලා තියෙනවා. එහෙම දේවල් සිද්ධ වුනා. පහුගිය දවස්වල එකතු කරන කෙනා ගිහින් සල්ලි ටික එකතු කරනවා. සල්ලි මෙහෙට ලැබිලත් නෑ. සල්ලි එකතු කරාම රිසිට් එකක් දෙනවානේ. එහෙම දීලත් නෑ. වෙන මොකක්ද එකක් දීලා තියෙන්නේ. එහෙම සිද්ධි වෙලා තිබුණා. සභාවට පැමිණිලි ආවා. ඒ පිළිබඳව හොයලා බලන්න. හොඳට විශ්වාසවන්ත කෙනෙක් වෙන්න ඕන. එහෙම නැත්නම් බඳවාගන්න කෙනාගෙන් තැන්පත් මුදලක් ගන්න ඕන සභාවට. යම් කිසි ප්‍රශ්නයක් වුනාම ඒක රඳවා ගන්න පුළුවන්. එහෙම නැතුව කරලා අමාරුවේ වැටෙන්නත් පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි නම් මේකේ වගකීම ගන්නේ නෑ. අපිට මේක අනුමත කරලා ඒ වගකීම ගන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඉතිං වරිපනම් එකතු නොකර තමයි ඉන්න වෙන්නේ. ගන්න කෙනා පිළිබඳව අපි අධ්‍යයනය කරන්න ඕන. හැම කෙනා ගැනම ඒ මට්ටමෙන් කරන්න බෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියැලි ඉන්න කෙනෙක් යටතේ මේ අයව පත්කරන්න බැරිද?. එතකොට ඒ නිලධාරියාට වගකීම තියෙනවානේ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතකොට වගකීම ගන්නේ කවුද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලේකම්තුමාගේ කාලයේ ඒක කරා. ඒක සාර්ථකයි. මාසෙකට රුපියල් විසිපන්දාහක මුදලක්වත් එන්නේ නෑ කියලා තමයි එයා නැවතුනේ. ඒ වෙනකොට ගැටළුවක් වුණේ නෑ.

ඕකට සභා අරමුදලින් වැටුප් ගෙවන කෙනෙක් යෙදෙව්වොත් ඊට වැඩිය ප්‍රශ්නයක්. සභාවේ මුදලකුත් වැය වෙනවා. එයා කරත් නැතත් අපි ඒ මුදල ගෙවන්න ඕන. ඊට වැඩිය කොමිස් එකක් තියෙනකොට එයා බලනවා මෙතනට වැඩිපුර මුදලක් එකතු කරගෙන එන්න. ඔය කියන විදියට මුකුත්ම කරන්න බෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ කොමිස් ලබන නිලධාරීන් දෙදෙනෙක් එක්ක සභාවේ නිලධාරියෙක් යවන්න බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රමාණවත් නිලධාරීන් නැනේ. එහෙම යවනවානම් කොමිස් දීලා කෙනෙක් යවන්න ඕනත් නැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාවේ වගකීමක් නැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නිවාඩු දවස් වලට යවන්න බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයට අතිකාල දීමනා ගෙවනකොට කරන්න බෑනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඕනම දේකට බිලක් ගෙවන්න පහසුකම් තියෙන කොට තමයි පාරිභෝගිකයෝ ඒ බිල ගෙවන්නේ. පහසුකම් තියෙනවානම් ඒ අය ඉක්මනට ගෙවනවා. අපිට බැරිද සභාපතිතුමා ග්‍රාමීය බැංකු සම්බන්ධ කරගෙන ගෙවීම් කරන්න පුළුවන් ක්‍රමයක් හදා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජංගම සේවාවල් තිබුණනේ. ඒත් අයවීම බොහොම අඩුයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වතුර බිල්, ලයිට් බිල් මිනිස්සු ඉක්මනට ගෙවනවා. තැපැල් කන්තෝරු, ග්‍රාමීය බැංකු තියෙනවනේ. ඒ වගේ ක්‍රමයක් හදා ගත්තා නම් ලේසියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීලා තිබුණේ. ඔන්ලයින් ගෙවන්න. ඒ වැඩසටහනත් දැන් නැවතිලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා වගකීම අරගෙන ඒ කාර්යය කරන්න. අපි සභාවේ අනුමැතිය ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම කියන්නේ ඒක ජනවාරි මාසේ ඉඳගෙන පටන් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට විරුද්ධ අය ඉන්නවාද?. එහෙනම් බෙදීමකට යමු. කවුරුහරි විරුද්ධද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි විරුද්ධ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වගකීම කොහොමත් ලේකම්තුමාට තියෙනවා. හැබැයි මෙහෙම දෙයක් තියෙනවා. මේකට විරුද්ධ වෙන්න. සංවර්ධන කටයුතු ඇණහිටිනවා. මුදල් නැත්නම් සංවර්ධන කටයුතු කරගන්න බෑ. රවුලුයි, කැඳයි දෙකම බේරගෙන ගේම් ගහන්න එපා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කවුරුවත් විරුද්ධ වෙන කතාවක් නෙමෙයි මේ කියන්නේ. මේකේ වගකීම ගන්න කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා හැමකාලේම තිබුණ මේක. පද්මසේන සභාපතිතුමාගේ කාලේ වක්වැල්ලේ බන්දුසේන වීරක්කොඩි මහත්තයව පත්කරලා මේ කාර්යය කරා. හැම කාලේකදිම මේක කෙරුණා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කිසිම මන්ත්‍රී කෙනෙක් විරුද්ධයි කියන්නේ නෑ මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැම කාලේකදිම මේක කෙරුණා. අරුමයක් නෙමෙයි මේක. දවසින් දවස එකතු වෙන මුදල් ගෙනල්ලා සභාවට බදිනවා. දවසට ලක්ෂ 10 ක් 15 ක් එකතු වෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එයාගේ දීමනාව ගෙවන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා එකතු කරගෙන ගේන මුදලින් 10% ක් දෙනවා කොමිස් එක. ඒකත් හිග ඒවායේදී විතරයි. අනිත් ඒවාට ගෙවන්නේ නෑ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා පොඩි බාධාකිරීමක් කරනවා. මෙතන හරි දෙයක් වෙලා තියෙනවා. ඒක කරොත් මේ ප්‍රශ්න මතුවන්නේ නෑ. සුගත් කලංසූරිය මන්ත්‍රීතුමාගේ යෝජනා යටතේ තියෙනවා පියදිගම සිට ඇළබඩ දක්වා මාර්ගය ප්‍රීමික්ස් යොදා සකස් කර දෙන ලෙස. ඒක මම දැන් දැක්කේ. ඇත්තටම මෙහෙම තිබුණම අපි මන්ත්‍රීවරු විදියට දැනුවත්. එතකොට අපිට ඒ පාරවල් අත ඇරලා වෙන පාරවල් හදන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඒ යෝජනාව වෙලාවේදී කතා කරමු. ඇයි හදිස්සිය. ඒ යෝජනාව ආවහමත් ඕක ගැන කතා කරනවා. දැනුත් ඕක ගැන කතා කරනවා. මට තේරෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ දේ කරොත් දැන් වෙලා තියෙනවා වගේ අර්බුද වෙන්නේ නෑ කියලා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 02.** 127/ඒ, හිරිඹුරගම ග්‍රාම නිලධාරි වසමේ ජස්ටින් කන්ද ගමේ අංක 335, ජස්ටින් කන්ද, කරාපිටිය, ගාල්ල යන ලිපිනයෙහි පදිංචි සෝමවතී කලංසූරිය මහත්මිය වෙත ඇය පදිංචි මු.ගා.පි. 2971 හි කැබලි අංක 01 ඉඩම පදිංචිය සඳහා දිගුකාලීන බදු ලබා දීමට 18 පරිශිෂ්ඨය අනුව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරපු ඉල්ලීමක්. අපේ නිර්දේශය අවශ්‍යයි ඒකට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරපු ඉල්ලීම් ලිපිය ලබා දීලා ඇති.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සභාව සතු ඉඩමක්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකේ ක්‍රමවේදය තියෙන්නේ මෙහෙමයි. රජයේ ඉඩමක් දිගුකාලීන බදු පදනම මත ලබා දෙන කොට පදිංචිය සඳහා සභාවේ වගකීමක් තියෙනවා අපේ බලප්‍රදේශයේ නිවැසියන් සම්බන්ධව. අපෙන් අවසර ඉල්ලන්නේ ඒකයි දිගුකාලීනව ඒ ඉඩම පදිංචියට බදු ලබා දෙන්න. ඒක පරිහරණය කරලා එළදාව ගන්න නෙමෙයි. පදිංචිය සඳහා භාවිතා කරන්න. ඒක තමයි ක්‍රමවේදය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විතරක් තනි තීරණ ගන්න බෑ මේක සභා බලප්‍රදේශයේ නිවැසියෙකුගේ ප්‍රශ්නයක් නිසා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බලය තියෙනවා එයාලගේ ඉඩම් එළදාව සඳහා හෝ පදිංචිය සඳහා බදු දෙන්න. මේකෙන් අපිට බලපෑමක් නැත්නම් අපිට පුළුවන් සභා තීන්දුවක් අරගෙන මේකට අවසර දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොට්ඨාශයේ මන්ත්‍රීතුමා විදියට ගයාන් මන්ත්‍රීතුමාගේ මතය මොකක්ද ?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ජස්ටින් කන්දේ මේ ඉඩම තියෙන්නේ. මේක රිසවේෂන් තිබුණ ඉඩමක්. ඒ මිනිස්සු දීර්ඝ කාලයක්, අවුරුදු 60 ක් විතර නිවසක් තනාගෙන පදිංචි වෙලා ඉඳලා තියෙනවා. ඉඩම් ලබා දීමේදී ඔප්පුව දෙනකොට ගැටළුවක් තියෙනවා මේක රිසවේෂන් ඉඩමක් නිසා. ඒ හින්දා මෙයාලට ඔප්පුවක් ලබා දෙන්න බෑ. ඒ නිසා මේ ඉඩම 99 අවුරුදු බද්දට ලබා දෙන්න හදනවා මේ මිනිස්සු පදිංචි වෙලා ඉඳපු නිසා. මේ බිම් කොටස පමණයි ලබා දෙන්නේ මෙතනින් ඉහළත් තියෙනවා බිම් කොටසක්. ඒක අත ඇරලා මේ බිම් කොටස ලබා දුන්නට ගැටළුවක් නෑ. දීර්ඝ කාලයක් මේ මිනිස්සු මෙතන පදිංචි වෙලා ඉඳපු හින්දා. අපිට බලපෑමක් නෑ. අපේ ඉඩමකුත් නෙමෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් මේක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ඉල්ලුවම අපි දවසින් ලබා දෙනවා. අපේ ගසක් කපන එකට අවසර ලබා ගන්න මාස ගණනාවක් ගියා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ආයතනත් එක්ක ගැටළුවක් ඇති කරගෙන වැඩක් නෑ. ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක්. ඒ අයට අයිතිය තියෙනවා 99 අවුරුදු බද්දට ඒ ඉඩම ලබා දෙන්න. ඒ ඉඩමේ මිනිස්සු අවුරුදු 60ක් විතර ගෙයක් හදාගෙන ඉඳලා තියෙනවා. ඒක නීත්‍යානුකූලව දෙන්න බැරි නිසා තමයි 99 අවුරුදු බදු දෙන්න හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සේවය කරනු ලබන මදුරු මර්දන සහායක කණ්ඩායමේ මෝටර් බයිසිකල් හිමි සමාජිකයන් තිදෙනා හට මසකට රු.1000.00ක උපරිමයට යටත්ව ඉන්ධන දීමනාවක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ ලිපිය ලබා දීලා ඇති. ඒ අනුව තමයි මේ යෝජනාව කරලා තියෙන්නේ. මේක අද තීරණය කරත් පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ අරගෙන තමයි ක්‍රියාත්මක වෙන්නේ. මේකට සභාවේ කැමැත්ත හෝ අකමැත්ත අවශ්‍යයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක සාමාන්‍ය දීමනාවක් විදියට ලබාදීම සුදුසුයි කියලා මගේ යෝජනාව. මොකද ඒ අයගේ පුද්ගලික යතුරුපැදි වලින් යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ වෙනස් මතයකුත් තියෙනවා. අපි මේක ලබාදෙනවා නම් අපිට මොකක් හරි වාර්තාවක් එන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මමත් ඒක තමයි කියන්න හැදුවේ. ඒ අය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනිපු අය. ඒ අය එවපු ලියුමේ ඒක පැහැදිලිව තියෙනවා. එහෙම ගෙවීමක් කරනවා නම් මෙහෙට ඒ ගෙවීම ලබා ගනිපු බව සහතික වෙන්න ඕන. නැත්නම් ඒක පසුව ගැටළුවක් වෙනවා. ඒක හොඳ විදියකට කරන්න සභාවේ අනිත් මන්ත්‍රීවරුන්ගෙත් අදහස් අරගෙන. මේක අත්‍යවශ්‍ය දෙයක් ඩෙංගු ව්‍යාප්ත වෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මුලින් යම් කාලයකට ලබාදීලා බලමු. මේ අය ඒ කාර්යය කරනවා කියලා තහවුරුවක් අපිට ලැබෙන්න ඕන. ඩෙංගු නැති කාලෙට අවශ්‍ය වෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකේ ප්‍රගතිය අපිට ලැබෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉන්නෙත් ඒ මතයේ මෙතනදි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ඒක ලබාදිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුලින් මාස හයකට ලබාදිය යුතුයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඩෙංගු සක්‍රීය කාලයට තමයි මේක වැදගත් වෙන්නේ. ඒ කාලය තුල තමයි මේ මෙහෙයුම් සිදු කරන්නේ. ඒ නිසා අපිට අවබෝධයක් තියෙන්න ඕන ඉදිරි මාස තුන හරි, ඉදිරි මාස හය ගැන හරි. වැහි කාලයටනේ මේක තියෙන්නේ. ඒ කාලය ඉලක්ක කරලා අපි මේක දෙමු. ඒ ප්‍රගතිය අපි ඒ අයගෙන් ඉල්ල ගමු. මුදල් රෙගුලාසි අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ අවසරය ගන්න ඕන නම් අපි ඒක ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** උළුවිටිකේ, වැවේවත්ත, අංක 113/4 ලිපිනයෙහි පදිංචි ඩී.පී ලියනගේ මෙය හට අප ප්‍රාදේශීය සභාවට අයවිය යුතු හිඟ වරිපනම් මුදල් ගෙවීමට හැකියාවක් නොමැති බවට ඉල්ලීම් කර ඇති බැවින් දිළිඳුකම හේතුවෙන් එම වරිපනම් බදු මුදල් පොත් වලින් කපාහැර වරිපනම් බදු අයකිරීමෙන් නිදහස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් ඒකට ලිපියක් සභාගත වෙලා යෝජනා සම්මත වුනා. ඒකට සභා සම්මුතියක් අරගෙන එවන්න කියලා ඉල්ලලා තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** අක්මීමණ, ලබුදූව වී පර්යේෂණ ආයතනයේ කඩා ඉවත් කර ඇති අංක 10/4, 10/5, 10/7, යන දේපල වලට අදාල හිඟ වරිපනම් බදු මුදල් පොත් වලින් කපා හැරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කාටද ඒ ඉඩම දැන් අයිති ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දක්ෂිණපාය හදලා තියෙන්නේ ඒ ඉඩමේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 06.** නරාවල කැස්ටල්හිල් ගම්මානය අසල ඉදිකරන ලද සන්නිවේදන කුළුණ පිළිබඳ කඩිනම් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්න හේතුවුනේ අකුණු සහිත කාලසීමාව තුල ඒ ප්‍රදේශයේ අකුණු වැදිලා ගෙවල් කීපයකට අලාභහානි සිද්ධ වුනා. ඒ පිළිබඳව ගම්වාසීන් අක්මීමණ පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා ඒක විභාග කරන්න යෙදුණා. ඒ ආයතනය සඳහන් කරන්නේ ඔවුන්ගෙන් කිසි බලපෑමක් වෙලා නෑ කියලා. මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරුවරයෙකු ඇවිත් පරීක්ෂණයක් පවත්වලා කිවුවා ඒ කුළුණ නියමිත ප්‍රමාණයට සකස් කරලා නෑ කියන කාරණාව. ඒ කාරණාව අපි ගම්වාසීන් විදියට හෙවුවා. නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර අරගෙන තියෙනවද කියලා. ඒ අය කියනවා අවසර අරගත්තා කියලා. අපිට ලියවිල්ලක් ඉදිරිපත් කරන්නේ නෑ. නාගරික සංවර්ධන අධිකාරියට කතාකරාම කියනවා ඒ අයට අවසර ලබාදීලා නෑ කියලා. ඒ අය එහෙම කියනවා නම් ඒකට අදාළ ලියවිල්ලක් ඉල්ල ගන්න කිවුවා. එහෙම ලියවිල්ලක් දෙන්නේ නෑ. මේ ඉදිකිරීම සම්බන්ධයෙන් කොහේ හරි තැනක වරද්දගෙන තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට වහාම පරීක්ෂණයක් කරලා ඒ අවශ්‍ය අවසර ලබාගෙන නැත්නම් නීතිමය කටයුතු කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒකට අදාළ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි නාගරික සංවර්ධන අධිකාරියට දන්වන්නම්. අවසර ලබා දීලද නැද්ද බලන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ලේකම්තුමාටත් පෙන්වලා තිබුණා ලියවිල්ලක්. ඒක නිකන් ලියවිල්ලක් කියන එක විතරයි මම දන්න විදියට. ලියුමක් විතරයි. ඉහළ නිලධාරීන් යම් ක්‍රමවේදයකින් ඒක ලබා දීලද කියලා දන්නේ නෑ. ඒකට කඩිනම් පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සභා බල ප්‍රදේශයනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ප්‍රදේශය එක නාගරික සංවර්ධන අධිකාරියට අයිති. අධිවේගී මාර්ගයේ ඉඳගෙන මීටර් 300ක ප්‍රදේශය අයිති නාගරික සංවර්ධන අධිකාරියට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියට අයිතියි කියලා කතාවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා අනුමැතියක් නෑ ඒකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභා අනුමැතියක් නැතුව බෑනේ ඒවා ඉදිකරන්න. මම මේ ප්‍රශ්නය මීට ඉස්සරත් ගෙනාවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉදිකිරීම් සම්බන්ධව බලතල තියෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියට. උදාහරණයක් මම කියන්නම්. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනය ගන්න. ඒකට අපි දඩ අයකරොත් ඒ දඩ මුදල් යන්නේ නාගරික සංවර්ධන අධිකාරියට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සන්නිවේදන කුළුණු සම්බන්ධව මේ සභාවේ කීප පාරක්ම කතා කරා විවිධ කාරණා යටතේ. මේ සන්නිවේදන කුළුණ පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ තියෙන්නේ. නමුත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලේ සිදුවන මහජන පීඩාවක් සම්බන්ධ කාරණාවක් නිසා සභාවට මැදිහත්වීමේ අයිතියක් තියෙනවා. මේ සම්බන්ධයෙන් මහජන පීඩාවක් සිදු වෙනවා නම් ඒකට ක්‍රියා මාර්ග ගන්න පුළුවන්. නීතිමය ක්‍රියා මාර්ග අපි ගත යුතුයි. ඒ ඉදිකිරීම නීත්‍යානුකූලව හා නියමිත තාක්ෂණයට ඉදිකරලා නැත්නම් ඒ සම්බන්ධව අපි හොයලා බලලා යම් ක්‍රියා මාර්ගයක් ගන්න ඕන. ඒක සභාවේ වගකීමක්. අපි මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා ඒ පරීක්ෂණය කරලා එවැනි දේවල් වලට මින් ඉදිරියටවත් අනුමැතිය දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි නාගරික සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධව කියන්නේ මොකද කියලා බලමුකෝ. අපි ඉල්ලීමක් කරමු නාගරික සංවර්ධන අධිකාරියෙන් මේ සම්බන්ධ තොරතුරු අපිට නීත්‍යානුකූලව ලබා දෙන්න කියලා. එතකොට දේවී. මේකට අවසර ලබා දීලද, නැද්ද, මොකක්ද තත්වය කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැත්නම් මෙහෙම ගැටළුවක් තියෙනවා මහ ජනතාවට, ඒ ගැටළුව විසඳගන්න අපිට මැදිහත් වෙන්න පුළුවන්. දැනට වැඩ ඉවරයි මම හිතන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 07.** වලවත්ත ග්‍රාම නිලධාරී වසමේ පියවර ගම ගම්මානයේ පිවිසුම් මාර්ගය මිනුම් කටයුතු කර මාර්ගයේ නියමිත ප්‍රමාණය සලකුණු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පියවරගම පිවිසුම් මාර්ගය සම්බන්ධව සභාවට පැමිණිල්ලක් ලැබිලා තියෙනවා. එක නිවසකින් මාර්ගයේ කොටසක් කඩලා ගල් බැම්මක් දාන්න ලැහැස්ති කරලා තියෙනවා. ඒක තාක්ෂණ නිලධාරිතුමා ගිහින් නැවැත්තුවා. නැවැත්තුවට විටින් විට ඉදිකිරීම් කටයුතු සිදු කරනවා. අධිවේගී මාර්ගය අසල ඉඩමක් තමයි පියවරගම කියන්නේ. ඒකේ සම්පූර්ණ සැලැස්ම සභාවට භාරදීලා කියලා සඳහන් වෙනවා කොළඹ නාගරික සංවර්ධන අධිකාරියෙන්. ඒ සැලැස්ම අරගන්න. ඒ සැලැස්මේ ඇති මාර්ගයේ පළල. ඒ මාර්ගය මැනලා දෙන්න. ලොකු ගැටළුවක් වෙලා තියෙන්නේ මේ පිවිසුම් මාර්ගයේ ගැටළුව ඒ ප්‍රදේශයේ ජනතාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇත්තටම අතපසුවීමකින් මාධ්‍යවේදීන් සඳහා තේ පැන් සංග්‍රහයේදී අඩුවක් වෙලා තියෙනවා. මන්ත්‍රීවරු හැටියට අපි කණගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, වෙච්ච දේ වුනා. අපි සභාවක් විදියට සියලුම මන්ත්‍රීවරුන්, සභාපතිතුමා, සියලු කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාව අයදිනවා. ඒක හිතාමතා කරපු දෙයක් නෙමෙයි. අද සහභාගි වෙච්ච කාර්ය මණ්ඩලය අනුව ඒ අඩුපාඩුව වෙලා තියෙන්නේ. මින් ඉදිරියට තේ පැන් සංග්‍රහය සූදානම් කරන අපේ සේවක මහත්වරුන්ගෙන් ඉල්ලන්නේ පළමුවෙන්ම අපේ මාධ්‍යවේදීන්ට ඒ සැලකිලි කරන්න. අඩුපාඩුවක් වුනොත් අපිට ඒක බෙදා හදා ගන්න පුළුවන්. බලවත් කණගාටුව හා සමාව අයදිනවා. මන්ත්‍රීවරු විදියට ඔබතුමන්ලා දෙපළගෙන් මම සමාව අයදිනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මටත් තියෙනවා ඒ සම්බන්ධව යමක් කියන්න. තේ පැන් සංග්‍රහය වේලාවේදී සීනි දාලා තේ නොබොන මන්ත්‍රීවරු කීපදෙනෙක් ඉන්නවා. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන්ගේ තේ එක රිටන් කරනවා. ඒ මන්ත්‍රීවරුන්ට ආයේ තේ එකක් ලැබෙන්නේ නෑ. ඊළඟ සභාවාරයේදී ඉඳගෙන ඒ මන්ත්‍රීවරු ගැන දැනුවත් වෙලා සීනි නොදා ඒ මන්ත්‍රීවරුන්ට තේ සපයන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමනි, මෙතෙක් මාධ්‍යවේදීන්ට සභාව තියෙන දවස දැනුවත් වෙන්නේ නෑ. ලියුමක්වත් යන්නේ නැහැලු. ඒ මහත්වරු අපිට විටින් විට දැනුවත් කරා. ඒ අය හොයාගෙන දැනගෙන තමයි එන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් දවසේ අපිට සම්බන්ධ වෙන මාධ්‍යවේදීන්ව දැනුවත් කරන්න. ඒ අයගේ විස්තර ලබා ගන්න. අතපසුවීමක්, අඩුපාඩුවක් සිදු වුනානම් සභාපතිවරයා විදියට මමත් කණගාටුව ප්‍රකාශ කරනවා. සභාවට සහභාගි වූ නිලධාරීන් වැඩිවීම නිසයි ඒ ගැටළුවට මුහුණ පෑවේ. ඉස්සෙල්ලම මේ මාධ්‍යවේදීන්ට සංග්‍රහ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ පළවෙනි අවස්ථාව නෙමෙයි. මෙහෙම වුන දෙවැනි අවස්ථාව. ඒ නිසා මින් ඉදිරියට මෙවැනි අතපසුවීමක් නොවෙන්න වැඩ බලාගන්න කියලා සියලු දෙනාගෙන්ම මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ- 08.** බෝගහදූව වත්ත ගම්මානයේ මාර්ගය කොරිපස් දමා සංවර්ධනය කිරීමට රුපියල් ලක්ෂ 05 ක මුදලක් යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** බෝගහදූව වත්ත ගම්මානයේ ගෙවල් 09 ක් තියෙනවා. ඒ ගෙවල් 09 ට මෝටර් සයිකලයකින්, වාහනයකින් යන්න තියෙන පාර තමයි ලද්දුහෙට්ටි කන්ද වත්ත පාර. ඒ පාර අවම තරමේ කොරිපස් යොදා සංවර්ධනය කරන්න යෝජනා කරේ. කොන්ක්‍රීට් දාන්න බෑ ඒ පාරට ගිලා බහින නිසා. කුඹුර මැදින් ඒ පාර තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොරිපස් ද ඒ.බී.සී ද?.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** කොරිපස්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොරිපස් ඒ තරම් මුදලක් වියදම් කරලා දාන ඒක ප්‍රායෝගික නෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** පාරේ දිග තියෙනවා මීටර් 750 ක් විතර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා තාක්ෂණ නිලධාරිතුමාට මේ සම්බන්ධව වගේම ගලගාවදූව වත්ත මාර්ගය හා උළුවිටිකේ හතරේකණුව මාර්ගය ප්‍රීමික්ස් කිරීමේ ගැටළුව පිළිබඳව සභාව දැනුවත් කිරීමට.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- බෝගහදූව වත්ත මාර්ගය කොරිපස් දමා සංවර්ධනය කළ යුතු ආකාරය පිළිබඳ විස්තර.
- හතරේ කණුව මාර්ගය ප්‍රීමික්ස් කරන ලද්දේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එවන ලද මාර්ග සංවර්ධන ලැයිස්තුවේ එම මාර්ගය ඇතුළත්ව නොතිබුණු නිසා බව.
- ගලගාලදූව වත්ත මාර්ගයේ ඇස්තමේන්තු සකස් කරන ලද මාර්ගය නොව ඒ අසල ඇති වෙනත් මාර්ගයක් ප්‍රීමික්ස් කළ බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝගහදූව වත්ත ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ- 09.** පෝද්දල කන්ද සුසාන භූමියේ මාර්ගය බැකෝ යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාවේ බැකෝ යන්ත්‍රය දැන් අළුත්වැඩියා කරලා තියෙනවා. ඒ නිසා සභාවේ බැකෝ යන්ත්‍රය භාවිතා කරලා ඒ පාර සුද්ධ කරන්න අවශ්‍යයි. මාදුගොඩ මන්ත්‍රීතුමා ඒ පාර සුද්ධ කරා. ඒ ටික නැවත සුද්ධ කළ යුතුයි කියලා තමයි මම යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පෝද්දල සුසානභූමිය පාර චමින්ද මන්ත්‍රීතුමා බැකෝ එක දාලා සුද්ධ කරනවා කියන එකේ තේරුම මොකක්ද?. දැනට ඔබතුමාලා ලැස්ති වෙනවා තාප්පයක් හදන්න. මීට වඩා කරන්න වැඩ ගොඩක් තියෙනවා. ඒකේ වැටක් ගැහුවහම හොඳටම ඇති.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** හරි වැට ගහමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හරි ඒක කරන්නම්. දැන් වැඩේ තියෙන්නේ මිනිස්සුන්ගේ ලොකු විරෝධතාවයක් තියෙන වෙලාවක් මේක.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ තියෙන්නේ ඔබතුමාලා හදපු විරෝධය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි විරෝධයක් හැදුවේ නෑ. අපි ඇත්තටම බැකෝ යන්ත්‍රය ගැන වෙනම කතා කරන්න ඕන. බොහොම පැහැදිලි විශාල වැඩ කොටසක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත් තේරෙන්නේ නෑ අබේසේකර මන්ත්‍රීතුමා. ඉඩමේ වැට ගහනවටත්, තාප්පය ගහනවටත් ඔබතුමාලා විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වැට ගහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි අපි ඒක වෙනස් කරමු වැට ගහන්න කියලා. පාර සුද්ධ කරන එකටත් විරුද්ධයි. මට තේරෙන්නේ නෑ ඒක. සභාවේ බැකෝ යන්ත්‍රය භාවිතා කරන්නේ. මුදලක් වැය වෙන්නේ නෑ ඒකට. ඒ ඉඩම සභාව සතු ඉඩමක්. ඒ ඉඩමට සභාවේ වාහනයක්වත් යන්න පාර කපන එකට විරුද්ධ ඇයි කියලා මට තේරෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරක් තියෙනවා නම් පාර සුද්ධ කරන්න. ඒක අපිට ගැටළුවක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාව සතු පාරක්ද ඒක?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ පාර මීට පෙර මාදුගොඩ සභාපතිතුමා ඉන්නකොට බැකෝ යන්ත්‍රය යොදවලා පාර කපලා තියෙනවා. ඒ දේපලේ

අයිතිය සභාව තහවුරු කර ගන්න. ඒ ඉඩම මැනුම් කටයුතු කරලා වැට මායිම් ගහලා සභාවේ දේපලක් විදියට පවත්වා ගෙන යනවා. ඒක සුසානභූමියක් විදියට පවත්වා ගෙන යන්න අපි සැලසුම් කරලා තියෙනවා. ඒ නිසා ඒක ගැටළුවක් නෑ. පාර නැවත සුද්ධ කිරීමක් කරන්න හදන්නේ. ඒ කටයුතු කරනකන් ඔබතුමා කලබල නොවී ඉන්න. සභාවේ දේපලේ අයිතිය තහවුරු කර ගන්න මේ වැඩ කටයුතු කරන්නේ. ඒකට ඉඩ දෙන්න කරුණාකරලා. ඔබතුමාලා හැමදේටම බාධා කරනවානේ. මේ දේට ඉඩ දෙන්න එච්චරයි කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තවත් නඩුවක් දාගන්න එපා. ඒක සභාවේ පාරක්නම් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් මේ කාරණාව සභාව පටන් ගන්න කොටම ආපු යෝජනාවක් එක්ක ආවේ. ඒ යෝජනාව ආපු වෙලාවේ පැහැදිලිව කතා කර ගත්තා. ඒක රජයේ ඉඩම. ඒ ඉඩම සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් සභාවේ කාගේවත් විරෝධතාවයක් තිබුණේ නෑ. මුළු සභාවම එකඟයි සභාවට වත්කමක් එකතු වෙනවානම්. ප්‍රජාවගේ පරිහරණයට ඒක භාවිතා කරන්න පුළුවන්නම් ඒක හොඳයි. ප්‍රශ්නය පැන නැගුනේ එතන නෙමෙයි. එතනට යෝජනා වුන ආදාහනාගාරය නිසා. ඒ ප්‍රශ්නය දැන් නිරවුල් වෙලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම ප්‍රශ්නෙකුත් ආවනේ මන්ත්‍රීතුමා. දැන් ඔබතුමන්ලා, අබේසේකර මන්ත්‍රීතුමාත් පුන පුනා කිවුවා අපිට ලබා දෙන්න අපි ඉක්මනට කරල දෙන්නම් ඔයතරම් කල් යන්නේ නෑ කියලා කිවුවේ නරාවල සිට්ටුස් වත්තේ ඉඩම සම්බන්ධව. අපි කොළඹ පවා ගියා ඒකට. ඇමතිතුමා සමඟ සාකච්ඡා කරා. සති දෙකෙන් ඉඩම දෙන්නම් කිවුවා. සියලු දේ කරා. නැවත දැන් කියනවා අපිට ඉල්ලීමක් කරන්නලු පළාත් පාලන කොමසාරිස්තුමාගෙන්. පළාත් පාලන කොමසාරිස්තුමා ඉල්ලන්න ඕනලු ප්‍රධාන ලේකම්තුමාගෙන්. ප්‍රධාන ලේකම් ඉල්ලන්න ඕනලු අමාත්‍යාංශ ලේකම්ගෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට කල් යන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට තව ක්‍රමවේදයක් තියෙනවා. ඒ ලිපිය ඒ මාර්ගයෙන් කෙලින්ම යොමු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ ආයෙම ඇක්වයර් කරන්න ඕන. ඇක්වයර් කරන කොට නැවත අවුරුද්දක් විතර පස්සට යනවා. මේක නොකෙරෙන තැනට කරපු කතාවක් මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පවරා ගැනීම සඳහා ඒ තරම් කාලයක් යන්න හේතුවක් නෑ. රජයේ ඉඩම පරිපාලනය සඳහා සමාගමට පවරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව සභාවේ දුර්වලතාවයක් තියෙනවා. ඉඩමක් අත්පත් කර ගන්න අපි එක පාර ඉල්ලුවා කියලා ලැබෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි එකග වුනා පෝද්දල කන්දේ ඉඩම සභාවට පවරා ගන්න. මේකේ වටේ ඉන්න අය ඉඩම අල්ල ගෙන ඒ ප්‍රශ්න නිසා තමයි ඔබතුමා ගැටුනේ. හැබැයි මැනුමේදී සභාව සතු භූමිය පිට අය අල්ල ගෙන ඉඳලා නැවත අත්පත් කර ගත්තේ නෑ. ඒ භූමිය වෙන් කරන කොට වැඩිපුරත් ඉඩම් එළියට ගියා. ඒක තමයි ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් කොටසක් අපිට ආවා. අසේල කියන කෙනාගේ ඉඩමෙන් කොටසක් ආවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයාගේ නිවසේ ඉදිකිරීම් වලට අත්ඇරලනේ අපි ගත්තේ. ගේ හදපු ප්‍රමාණය රජයේ ඉඩමට ඇවිත් තිබුණා. ඉඩමේ ප්‍රමාණය අඩුවක් වුනේ නෑ මනින කොට. දැන් මැනුම අරගෙන බලන්න. ඒ ලැබිච්ච වපසරිය අඩු වෙලා තියෙනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොටසක් අතඇරලා මැන්නම අඩුවෙන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයා කැමති වුනානේ ඒ ටික එයාගේ ඉඩමේ ඉස්සරහින් දෙන්න. එතකොට අඩු වෙන්නේ නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද දැන් තියෙන ප්‍රශ්නේ. මොකක්ද දැන් කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කිවුවේ සභාව පවරාගන්න ඉඩම. පාරක් තියෙනවානම් ඒ පාර සුද්ධ කරන්න. පාර කපන්න එපා කියලා කවුරුවත් කිවුවේ නෑ. වෙන ප්‍රශ්න හදාගන්න ඕන නෑ මේකට. තාම ඉඩම පවරලත් නෑ. සභාවේ බැකෝ එක යොදවනවා කියන්නේ තමුන්නාන්සේලා ඒ ඉඩමට පාර කපන්න, ඒ පාර සභාවේ පාරක්ද?. ඒවා නිරවුල් කරගන්න. ඒවා නිරවුල් කරලා ඉවර වෙලා ඒකට මැදිහත් වෙන්න. කඩිමුඩියේ තදියමට ඒකට මැදිහත් වෙලා ප්‍රශ්න හදා ගන්න එපා ආපහු. ඒකයි අපේ යෝජනාව. ඒක නිරවුල් කර ගන්න. ඔබතුමා රජයේ ඉඳපු නිලධාරියෙක් හින්දා ඔබතුමාට තේරෙනවානේ රාජකාරි කරන ආකාරය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉතිං නිරවුල් කරගෙන තමයි කරන්නේ. යෝජනා සම්මත කරලා තිබුණට හදිසි වෙන්න එපා. අපි ඒ ක්‍රමවේදය අනුව වැඩ කරන්නේ. ඔබතුමාට බොහොම ස්තූතියි. ප්‍රාදේශීය ලේකම්තුමා අපිට ලිඛිතව දීලා තියෙනවා මේක සභාව සතු ඉඩමක් කියලා. සුසානභූමි කියන්නේ සභාව සතු ඉඩමක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මමත් ඉඩම් කටයුතු සම්බන්ධව කටයුතු කළා. මේ ප්‍රශ්නයට මැදි වුන ඉඩමේ අයිතිය තිබුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. අරගෙන බලන්න ඉඩමේ අයිතිය. පවරලා තියෙනවානම් ඉඩමේ අයිතිය අපිට තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම වුනත් මන්ත්‍රීතුමා නීත්‍යානුකූලව තමයි ඒ වැඩ කටයුතු ටික සිද්ධ වෙන්නේ. ඒකේ ගැටළුවක් නෑ ඔබතුමාට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නීත්‍යානුකූලව කරනවානම් අපිට ගැටලුවක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙතනදී සඳහන් වුනා සිට්ටුස් වත්තේ ඉඩම පවරා ගැනීම සම්බන්ධව. ඉඩමක් සභාවට පවරා ගැනීමට අවශ්‍යනම් මුලින්ම පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලීමක් කරන්න ඕන. කොමසාරිස් කාර්යාලයෙන් ඊට පස්සේ පළාත් පාලන අමාත්‍යාංශයට යවනවා. වජිර අබේවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශයට යන්නේ. ඊට පස්සේ ඒ අමාත්‍යාංශයෙන් ඉඩම් අමාත්‍යාංශයට යනවා. ගයන්ත ඇමතිතුමාට යන්නේ. ගයන්ත ඇමතිතුමා බලතල අනුව ඒක පවරලා දේවී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ විදියට කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කොහෙද එහෙම කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අදාළ ආයතන වලට යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ යවපු ලියුම්වල පිටපත් මට ලබා දෙන්න. පළාත් පාලන අමාත්‍යාංශයට තාම හිහිල්ලා නෑ. කොමසාරිස් කාර්යාලයෙන් පළාත් පාලන අමාත්‍යාංශයට ගියහම වජිර ඇමතිතුමා ඉඩම් ඇමතිතුමාට යවනවා මේක ලබා දීමට කටයුතු කරන්න කියලා. ඊට පස්සේ ඉඩම් අමාත්‍යාංශයෙන් යවනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඒක පවරා ගන්න කියලා. ඒක කරන්න ඕන. කරලා නැතේ තාම. අද උදෙත් අපි ඒක ගැන කතා කරා. මේ වැඩේ කෙරෙන්නේ නැතුව ඉඩම ගන්න බෑ. නිකං අපි ඉඩම ඉඩම කිය කිය හිටියට ඉඩම ලැබෙන්නේ නෑ. ඒකට මැදිහත් වෙන්න. කැබ් එක දීලා නිලධාරියෙක් යවන්න. කොමසාරිස් කාර්යාලයෙන් ලියුම අතේ අරගෙන ගිහින් කොළඹ අමාත්‍යාංශයට යන්න. අපේ කෙනෙක් එක්ක යන්න. එතකොට ඉඩම ගන්න පුළුවන්. එහෙම නැතුව ඉඩම හම්බ වෙන්නේ නෑ. අපේ මන්ත්‍රී කෙනෙක් එක්ක යවන්න ලියුම අරගෙන පළාත් පාලන අමාත්‍යාංශයට. එතකොට වැඩේ කෙරෙනවා. එතකොට මාසයක් යන්න කලින් වැඩේ කරගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මන්ත්‍රීතුමා මම අහන්නේ, එහෙමනම් ඇයි අපිව, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා, අමාත්‍යතුමා, ලේකම්වරු, ඩඩ්ලි විජේසිංහ මන්ත්‍රීතුමා කැඳෙව්වේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක යොමු කරනවා. එහෙම යනකොට ප්‍රමාද වැඩියි. එතුමා කියන්නේ අපිට මැදිහත් වෙලා ඇමතිවරු දෙන්නම ගාල්ලේ නිසා, වජිර ඇමතිතුමත් ගාල්ලේ. ගයන්ත ඇමතිතුමත් ගාල්ලේ. ඒක නිසා මේක ඉක්මනින් කරගන්න පුළුවන්. ඔය ගොල්ලෝ

ගිහින් ලියුම අරගෙන වජිර ඇමතිතුමා හම්බවෙන්න. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලියුමක් යවලා ඉඩම පවර ගනීවි. ඒක කරන්න කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක කවුද කරන්න ඕන. මොකක්ද ඔබතුමාට ඒකට කෙරෙන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට කොළඹ යන්න අවස්ථාව ලබලා දෙන්න. ඔබතුමාලගේ මන්ත්‍රී කෙනෙකුත් එන්න. ලේකම්තුමත් එන්න. අපේ මන්ත්‍රී කෙනෙකුත් යාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාහනය දෙන්නම් ඕන නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි ලෑස්තියි. ලබන සතියෙම අපි ලෑස්ති කරන්නම් අපිට දෙන්න ලියුම් ටික. ඒ යවපු ලියුම් එහෙම තියෙනවනම් ඒ ලියුම්වල පිටපත් අපිට දෙන්න. ඉතුරු ටික අපි කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ගියත් නොගියත් වාහනය ලබා දෙන්නම්. අපිත් ඕනනම් එන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි දිගින් දිගටම කතා කරපු කාරණයක් තමයි මේ පොදු සුසාන භූමිය සම්බන්ධ කාරණය. මම හිතන්නේ අපි ප්‍රමුඛතාවය දෙන්න ලෑස්තිවුනා සිට්ට්‍රස්වත්ත වේවා, පෝද්දල කන්ද වේවා, දෙකෙන් ඉක්මනට ලැබෙන එකට පහුගිය මහ සභාවකදී. ඉතිං මම අහන්නේ ගරු සභාපතිතුමාගෙන් මේ සුසාන භූමිය සකස් කරන්නේ පෝද්දල කන්දෙද?, සිට්ට්‍රස් වත්තේද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට දැනට තියෙන අරමුණනම් සිට්ට්‍රස් වත්තේ හදන්න. නමුත් අපිට තව මාස හයකින් හතකින්වත් කරගන්න බැරි වුනොත් සිට්ට්‍රස් වත්තේ වැඩේ වෙනුවට අපිට වෙන විකල්පයක් හොයන්න වෙනවා. එතනදී පෝද්දල කන්ද තමයි ප්‍රධාන. මාස 06 ක් වත් ඇතුළත කරගන්න බලන්නේ. නැත්නම් අපිට හැමදාම බලාගෙන ඉන්න බෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම හිතන්නෙත් එහෙම. දීර්ඝ කාලයක් යන නිසා පෝද්දල කන්දට ප්‍රමුඛතාවය දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තව උදව්වක් කරන්නම් ඕන නම්. ඔබතුමාට සුසාන භූමිය හදන්න මුදලුත් අපි ලබා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වෙන කොට නම් බඩු හම්බ වෙලා තියේවි ආණ්ඩුවට. කමක් නෑ අපි ඒ ඉඩම ගමුකෝ. මොකද අපේ ඇමතිවරු කවුරු පත්වේවිද දන්නේ නෑ. පළාත් පාලන අමාත්‍යාංශය අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙකුට යාවිද දන්නේ නැනේ. ඒ නිසා මේක ලොකු අවස්ථාවක්. මොකද එක්සත් ජාතික පක්ෂයේ වුනත් ඉඩම් ඇමතිතුමා ඉන්නේ ගාල්ලේ. පළාත් පාලන ඇමතිතුමා ඉන්නේ ගාල්ලේ. ඒක ලොකු වාසියක්. ඉතිං ආයේ අපේ ආණ්ඩුවක් යටතේ මේ අමාත්‍යාංශ දෙක ගාල්ලට ඒවිද දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** 2035 වෙනකන් අපේ ආණ්ඩුවක් තමයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවස්ථාවේ මම ඉල්ලා සිටිනවා අපි වාහනෙත් දෙන්නම්, ඕන දෙයක් දෙන්නම්. ඒක කරලා දෙන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 10.** ගිංතොට ජලයිවුඩ් සංස්ථාවේ ඉඩම පෞද්ගලික පරිහරණය සඳහා ඉතා අවම මුදලකට ලබා දී ඇත. මෙම ඉඩම ලබාදෙන ලද ගැසට් පත්‍රය අහෝසිකර අප සභාවට එම මුදල අයකර පවරා දෙන මෙන් ජනාධිපතිතුමාගෙන්, අගමැතිතුමාගෙන්, කථානායකතුමාගෙන් හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඉල්ලා යවන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- විපක්ෂ නායකතුමාටත් යවන්න ඒ ලිපිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- විපක්ෂ නායකතුමාට යැව්වා කියලා වැඩක් නැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- එතුමා කතාකරාවී ඒ ගැන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාට ඉල්ලීමක් කරන්න අපේ ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකතුමාගේ ඉල්ලීමක් හැටියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- විපක්ෂ නායකතුමාටත් යවන්න ඕන. තව මාස තුනකින් අපි ආණ්ඩුව ගන්න හින්දා වටිනවා. එතකොට එතුමා අගමැතිනේ. ඒ හින්දා වටිනවා. ඔබතුමාලම එහෙම කියන එක හොඳයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- පස්සෙන් එන්න ඔන්න වැටෙයි ඔන්න වැටෙයි කිය කිය. වැටෙන හැටි බලන් ඉන්නකෝ. 2035 වගේ වෙනකොට පොඩ්ඩක් වැටෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- **11.** බලප්‍රදේශයේ ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් වර්ධනය වන බැවින් හඳුනාගත් ප්‍රදේශවල තත්ත්වය පාලනය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකසා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- ගාල්ල දිස්ත්‍රික්කයේ 4200 ක් පමණ ඩෙංගු රෝගීන් ඉන්නවා. ගාල්ල නගර සභා බලප්‍රදේශයේ 1300 ක් පමණ ඩෙංගු රෝගීන් ඉන්නවා. අප බලප්‍රදේශයේ 311 ක් පමණ ඩෙංගු රෝගීන් ඉන්නවා. මගේ කොට්ඨාශයේ ඩෙංගු රෝගීන් 59 දෙනෙක් ඉන්නවා. උළුවිටිකේ කොට්ඨාශයේ ඩෙංගු රෝගීන් 58 දෙනෙක් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැනට මන්ත්‍රීතුමා අපි ඒකට වැඩපිළිවෙලක් හදලා තියෙන්නේ. හැම මාසෙම එක් වරක් හෝ දෙවරක් රැස්වෙනවා ඒ කමිටුව මගෙත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාගෙත් ප්‍රධානත්වයෙන්. එතනදී අපි මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගෙන් ලබා ගත් මාර්ග හා කාණු පද්ධති පිළිබඳ විස්තර තියෙනවා අවධානම් කලාප වල. ඊළඟ ප්‍රගතිය වෙනකොට ඒ ටික සුද්ධ කිරීමේ වගකීම අපි අරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- පහුගිය මාස එකහමාරක කාලය තුළ මගේ කොට්ඨාශයේ එක කාණුවක්වත් සුද්ධ කරේවත්, ඩෙංගු රෝගීන් පිළිබඳ කිසි දෙයක් කෙරුනෙත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක ඔබතුමාගේ වගකීම. ඔබතුමාට ලබා දෙනවා සේවකයෝ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- ගිය මාසෙටම ලබා දුන්නද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමාට තිබුනේ පෙරේදා දවස. නමුත් ඔබතුමා එපා කියලා තිබුණා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- සේවකයෝ දෙන්නෙක් ලබා දීලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එදා හිටියේ අට දෙනයි. තුන්දෙනෙක් ප්‍රීමික්ස් වලට යැව්වා. ඉතුරු පස් දෙනා ඔබතුමාට ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- උදේ පාන්දර කතා කරලා කිවුවේ. දහ දෙනෙක් ඉන්නවා කියනවා. ඒත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් දහ දෙනෙක් නැනේ. දැන් ඉන්නේ අට දෙනයි. එක්කෙනෙක් JCB එකට යොදවලා තියෙනවා. අනෙක් කෙනා ලයිට් වාහනයට යොදවලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය කාලේ දුන්නේම නෑ. ඒ හින්දා වගකීම සභාව අරගෙන කරන්න. මම එහෙම කරන්න අවශ්‍යතාවයක් නෑ. දෙන්නේ නැත්නම් බලෙන් ගන්නද?. සභාව ඒ වගකීම ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට ඔබතුමාට නේද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම දන්නේ නෑ. මගේ දින තිබුණා. එදා දවසේ දුන්නේ නෑ. මම ගමේ මිනිස්සුන්ට ගිහින් කියනවා ඔන්න අද ඔය කාණුව සුද්ධ කරන්න දානවා කියලා. ඒත් දෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමාගේ වැඩ කරලම නැද්ද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය මාසේ වැඩ කෙරුනෙම නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුගිය මාසෙයි, මේ මාසෙයි වැඩ කරලම නැද්ද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගිය කණ්ඩායම් රැස්වීමෙන් පස්සේ ගියේ නෑ. ඒ නිසා මම මේ පාර කණ්ඩායම් රැස්වීමටවත් ආවේ නැත්තේ. ගිය කණ්ඩායම් රැස්වීමෙන් පස්සේ මට දිනයක් ලැබුණේ නෑ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අපිට ලැබුණෙත් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙමනම් ඉතිං මේ කට්ටිය කාටවත් දිනයක් ලැබිලා නෑ. එතකොට මේ වැඩ කරන කට්ටිය වැඩ කරලා නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරු තුන්දෙනෙකුට ලැබුණේ නෑ. ගයාන් ගීතික මන්ත්‍රීතුමා, කාංචනා මන්ත්‍රීතුමිය, වාසනා මන්ත්‍රීතුමියටත් ලැබුණේ නෑ. මාදුගොඩ මන්ත්‍රීතුමාගේ ඇසළ කලාපයේ ප්‍රශ්නය තිබුණේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මගේ කොට්ඨාසයේ පාරවල් සුද්ධ කරනවට වඩා ඩෙංගු රෝගය ගැන මම කතා කරේ. ඒකට අවශ්‍ය වැඩපිළිවෙලක් හදන්න. දැන් ඩෙංගු රෝගීන් 311 දෙනෙක් ඉන්නවා මේ බල ප්‍රදේශයේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මට ලැබුණෙත් නෑ. මගේ දවස මාදුගොඩ මන්ත්‍රීතුමාට දානවා ගියලා විජේපාල මහත්තයා කතා කරලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමාට දෙන්න බැරිවුන බව මම දන්නේ දැන්. අද වාසනා මන්ත්‍රීතුමියගේ දවස. හෙට දවස ගයාන් ගීතික ලියනගේ මන්ත්‍රීතුමාගේ. අනිද්දා දවස කාංචනා මන්ත්‍රීතුමියගේ, ඊළඟ දවස ලබා දෙන්නම් චනක මන්ත්‍රීතුමාට. මට හම්බවුනේ සේවකයන්ට දෙමළ පන්ති තිබුණ දවස්. තුන්දෙනයි හම්බවුනේ. අනිත් අය ඔක්කොම දෙමළ පන්ති ගිහින්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ කොට්ඨාසයේ ඩෙංගු රෝගීන් නෑ. කාණු නෑ සුද්ධ කරන්න. ඒ නිසා අපේ කොට්ඨසයට අවශ්‍ය නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය අවට ඩෙංගු රෝගීන් 120 කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා.

**ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** අපේ කොට්ඨාසයේත් ඩෙංගු රෝගීන් 4 දෙනෙක් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 12.** දීර්ඝ කාලයක සිට ගොඩකන්ද කුකුළගහ ඇළ පිරිසිදු නොකිරීම නිසා ගොවීන් දැඩි අපහසුතාවයකට පත්ව ඇත. මෙය කඩිනමින් පිරිසිදු කර දෙන මෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවටත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත්, දන්වා යවන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ ඇළ සුද්ධ කරා නේද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කුකුළගහ ඇළ නමින් ආවත් සුද්ධ කරේ වෙනත් ඇළ මාර්ගයක්. මේ ඇළ මාර්ගය අවුරුදු පහකින් හයකින් සුද්ධ කරේ නෑ. අබේසේකර මන්ත්‍රීතුමා අවුරුදු ගාණකට කලින් ඒ ඇළ සුද්ධ කෙරෙව්වා. ඊට පස්සේ මේ වන තෙක් කෙරුණේ නෑ. කලවිටි, ගොවිතැන් කිසිම දෙයක් කෙරෙන්නේ නෑ. මේ ඇළ පිරිසිදු නොකිරීම නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 13.** හිරිඹුර ගැමුණු මාවත හා ගොඩකන්ද සිරිපාල ලියනගේ මාවත ගොඩකන්ද සංස්කෘතික මධ්‍යස්ථානය අසල මාර්ගයට හා විදුලි රැහැන් වලට බාධාවන අයුරින් ඇති ගස් අදාළ අයිතිකරුවන්ට ඉවත් කරන ලෙස දන්වා යැවීමටත්, එසේ නොකරන්නේ නම් වෙන්දේසි කර ඉවත් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක විදුලිබල මණ්ඩලයට කිවුවහම විදුලි බල මණ්ඩලයෙන් කියනවා ගහ වයර් එකට වැටුණහම කපලා ඉවත් කරන්නම් කියලා. හැබැයි ගෑවී නොගෑවී වගේ මේ ගස් ටික තියෙන්නේ. විශාල අනතුරුදායක තත්ත්වයක් පාරේ යන අයට. ඉදිරියේදී මම ඒ ගස් හිමිකරුවන්ගේ ලිපින ටික ලබා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 14.** කරාපිටිය ගොඩකන්ද මාර්ගය කාපට් කිරීමේදී මාර්ගය දෙපස පිහිටි නිවාස වලට ජලය ගලා යෑම වැළැක්වීම සඳහා ජලය එක් රැස්වන ස්ථානයන්හි ජලය බැස යාමට විධිමත් කාණු පද්ධතියක් ඉදිකරන ලෙස අදාළ ආයතනයන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇත්තටම ඒක හොඳ වැඩක්. ඒ කාපට් කිරීමේදී මඟ දෙපස ජලය එක් රැස්වන ස්ථාන කීපයක් තියෙනවා. නිවාස තියෙනවා පාරට වඩා ගොඩක් පහතින්. මේ මාර්ගය කාපට් වීම නිසා නව මාර්ගය අඟල් 06 ක් විතර ඉස්සෙනවා. ඒ නිසා එක ස්ථානයක වතුර බොන ළිඳට පවා යනවා. ඉතිං ඒ ස්ථාන තුන හඳුනාගෙන ජලය බැස යාමේ ක්‍රමවේදයක් සකසන්න ඕන. ඒක අදාළ ආයතනයන්ට දන්වා යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 15.** නාවින්න විද්‍යාලයේ උසස් පෙළ දරුවන්ට දෙමළ භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරයෙකු නොමැතිවීම මහත් ගැටළුවක්ව පවතී. මෙම ගැටලුව විසඳීම සඳහා දකුණු පළාත් ආණ්ඩුකාරතුමාට සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 16.** උළුවිටිකේ කොට්ඨාසයේ ඇල්හේන්ගොඩ ටී. එල්. කේ. ලංකාකුමාරි මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** සභාපතිතුමා මේ අතරේ මට තවත් ප්‍රශ්නයක් තියෙනවා උළුවිටිකේ කෝට්ටේ වත්ත මාර්ගයත්, බොකරමුල්ලගොඩ නරිදූව මාර්ගයත් හදාගෙන යනවා. දෙපැත්ත පස් දාලා පුරවලා නෑ කියලා දෙපස ඉන්න නිවැසියන් ගොඩක් දෙනා චෝදනා කරනවා. ඒ සම්බන්ධව මට යසරත්න මන්ත්‍රීතුමාගෙන් දැන ගන්න කැමතියි ඒ පාරවල් වල දෙපසට පස් දමා පුරවනවද කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කෝට්ටේ වත්ත පාර කොන්ක්‍රීට් දාලා හැදුවා.

**ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** නිවැසියන්ට වාහනයක්වත් ගන්න විදියක් නෑ කියලා කිවුවා පස් යොදා පුරවලා නැති නිසා. ඔබතුමා ඒක කරනවාද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කරන්න දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇස්තමේන්තුවල තියෙනවාද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිතුමාට ඒක දාන්න කිවුවා. ඒක දිගටම දාන්න කිවුවා.

**ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** බොකරමුල්ලගොඩ, නරිදූව මාර්ගය සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ පාර කාපට් කරනවා.

**ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඒ පාරේ ප්‍රමාණය හදලා ඉවර වුනහම ඉතුරු කොටස මිනිස්සු අල්ල ගනීවි කියලා කියනවා. ඒ නිසා ඒකත් එක්කම පස් දාලා හදන්න ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාසනා මන්ත්‍රීතුමිය ඉඩමක් හොයා ගන්න. සභාවේ බැකෝ යන්ත්‍රය යොදවලා පස් දාමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** වැඩේ ඉවර වෙනකන් ඉන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලු දේවල් ඉවර වුනාට පස්සේ, රිටෙන්ෂන් එකක් ගෙවලා කර්මාන්තය ඉවර වුනාට පස්සේ ඔබතුමිය ඒ දේ ලිඛිතව දෙන්න මේ පාර දෙපසට පස් දාන්න ඕන කියලා. අපි බැකෝ යන්ත්‍රය යොදා ගෙන පස් දාමු.

**ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** බොහොම ස්තුතියි සභාපතිතුමා.

<u>**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ- 17.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නම්කරන ලද නාම පුවරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් පමණක් නම් කිරීමටත් අරාබි භාෂාව හෝ වෙනත් භාෂාවකින් නම් කිරීම සපුරා තහනම් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල නම් තාම නෑ මේක. වෙනත් බල ප්‍රදේශවල පාරවල්වල අරාබි භාෂාවෙනුත් නාම පුවරු ප්‍රදර්ශනය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අරාබියේ නම් අරාබි භාෂාවෙන් තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ඇරෙන්න වෙන භාෂාවකින් නාම පුවරු ප්‍රදර්ශනය කරන්න එපා ඒකයි මගේ යෝජනාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ලංකාවේ නැගෙනහිර ඇරුනම කොහේ හරි එහෙම තියෙනවද?. ඔබතුමා එක තැනක් කියන්න. බොහොම කරුණාවෙන් ඉල්ලනවා ජාති වාදය අවුලන වැඩ කරන්න එපා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** පිළිගත් භාෂා තුනක් තියෙනවා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි කියලා. ඒ භාෂා තුනෙන් විතරක් නම් කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- එහෙමනම් චීනෙන් පාරක් හදන කොට චීන භාෂාවෙන් බෝඩ් දාන්නත් දෙන්න එපා. ජපානෙන් පාරක් හදන කොට ජපන් භාෂාවෙන් බෝඩ් දාන්නත් දෙන්න එපා. දැකලා ඇතිනේ ඔබතුමා. ඒකත් එහෙම නම් තහනම් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක හැදුවහම බලමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- අරාබි භාෂාව හෝ වෙනත් භාෂාවකින් නම් කිරීම තහනම් කරන්න කියලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ- 18.** උළුවිටිකේ රිපිස් ඉලේපෙරුම මාවතේ ඉලේපෙරුම මහතාගේ නිවසේ සිට උඩු පැත්තට ඇති මාර්ගය (අන්නාසිවත්ත ගොඩකන්ද දක්වා) සභාව මගින් සංවර්ධනය කර ඇතත්, එහි අවසාන කොටසේ ගේට්ටු සවිකර අනවසර තාප්පයක් බැඳ ඇති බැවින්, එම මාර්ගයේ ගමන් කරන ජනතාවගේ ගමන් මාර්ගය අවහිර වී ඇත. එය ඉවත් කර අනවසර තාප්පයද සභාව මගින් ඉවත්කර එම ජනතාවට ගමන් මාර්ගයේ ඉඩ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් යෝජනා කරමි. තවද, මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මීට පෙරද සභාවට ඉදිරිපත් කර තිබූ නමුත් ඒ පිළිබඳව මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් දැඩි අර්බුධකාරි තත්ත්වයකට පත්ව ඇති බැවින්, මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- මීට පෙරත් ඒ මිනිස්සු සභාවට ලියුමක් ඉදිරිපත් කරලා තිබුණා ගේට්ටු දෙකක් දාලා තියෙනවා කියලා. ඒ පාර සභාවෙන් හදලා තියෙන්නේ. ඒ පාර හරහා ගේට්ටු දෙකක් දාලා තියෙනවා. ඒකට වහාම පියවරක් ගන්න. ඒ ගේට්ටු දෙක අයින් කරන්න. ගිහින් බලන්න. ඔබතුමා මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලේ ඒ පාර හදලා තිබුණේ. බොහොම අමාරුවෙන් දිල්රුක් මන්ත්‍රීතුමාට කියලා පාර හැදුවේ කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේ සභාවේ නෙමෙයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- ඉස්සෙල්ලා සභාවේ. දැන් ඒ වුනාට ගේට්ටු දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- මෙහෙම ගැටළුවකුත් තියෙනවා. මේ සිද්ධියට පොලිසියට ගිහින් කිවුවේ සභාවේ මන්ත්‍රීවරුන්ට සල්ලි දුන්නා කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- මම ඒකයි සල්ලි කතාවක් කියන්නේ නැතුව බොහොම අමාරුවෙන් ඒ පාර හදාගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කොතනද ඒ ගේට්ටුවක් දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- සභාවේ ඉඳපු ලොකු මහත්තයලගේ ගෙවල් ගාවින් යන පාර. ගේට්ටු දෙකක් දාලා වහලා තියෙනවා. අනවසර තාප්පයකුත් බැඳලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතනින් එහාට පාර තියෙනවාද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- පාර තියෙනවානේ. ඒක ගිහින් පරීක්ෂා කරලා බලන්න. අද හෙටම වහාම ඒක කඩන්න ඕන. මම එහෙම නොකිවුවේ ඒකයි. දිල්රුක් මන්ත්‍රීතුමාට කියලා බොහොම අමාරුවෙන් පාර හදා ගත්තා කියලා පොලිසියේදී කියලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ පාර හදලා අවුරුදු 08 ක් විතර වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** ඃ- දැන් ගේට්ටු දාලා වහලා තියෙනවා. සභාවකින් හදපු පාරක් එහෙම ගේට්ටු දාලා වහන්න බැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන්න. ඒ සැලැස්ම අරගෙන බලන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** තාප්පයට මෙහායින් යන්න ගියත් ඒ මිනිස්සු විරුද්ධයි. පව් ඒ මිනිස්සු. මගේ හිතවතෙක් තමයි ජයසිංහ මහත්මයා. අපේ පාක්ෂිකයෙක්. මට දේශපාලන හිතවත්කම වැඩක් නෑ. අහිංසක මිනිස්සු දෙපලක් ඉන්නවා සොහොන් පිට්ටනියේ ගෙවල් හදාගෙන. අපි ඒ මිනිස්සුන්ට උපකාර කරන්න ඕන. අපි දේශපාලන වාසි බලන්න හොඳ නෑ. මටත් පාඩුවක් වෙනවා තැනක. ඒ වුනාට අහිංසක මිනිස්සුන්ට අපි උපකාර කරන්න ඕන. ලියනගේ මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ මේ ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාරේ ඉවරවෙන තැනද කොතනද කියලා අපි දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සුහදව කතා කරලා කාටත් පරිහරණය කරන්න අවස්ථාව අරන් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ- 19.** සංසරතන මාවත අඩි 18 ක් පළල මාර්ගයක් වුවද දැනට එහි දෙපස විවිධ ගස් වර්ග වවා ඇති බැවින් එය විශාල ගස් බවට පත්වන බැවින් එම මාර්ගය හෝළුවාගොඩ මාර්ගය දක්වා දෙපස පවිත්‍ර කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අද නම් පාර සුද්ධ කරන්න ගිහින්. බොහොම ස්තූතියි. ඒ පාර දෙපස ගස් කොලන් හිටවලා, තේ හිටවලා, කුරුඳු හිටවලා තියෙනවා. පහුගිය දවස්වල වර්ෂාවට කෙසෙල් ගස් කඩන් වැටිලා අපිට පාර සුද්ධ කරගෙන යන්න වෙලා තියෙනවා. ඒ පාර දෙපස ගස් කොළන් ඉවත් කරලා පාර පවිත්‍රව තියෙන්න අරින්න.

කුණු ගොඩක් තියෙනවා ඊට මෙහා. සභාවේ ඉඩමක් ඒක. ඩෙංගු හැදෙනවා. පොල් කෝම්බ, යෝගට් කෝප්ප කුණු ගොඩවල් ඔක්කොම ගෙනත් දාලා තියෙනවා. වාසනා මන්ත්‍රීතුමිය ඊයේ පෙරේදා ගියා බලන්න. යෝජනාව දාන කොටම පාර සුද්ධ කරපු එක ගැන මම ස්තූති වෙනවා. ඒ පාර දිගටම සුද්ධ කරන්න ඕන. ඉදිරියේදී අපිට පාර පළල් කර ගන්න බැරිවෙනවා ගස් කැපුවේ නැතිනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි. පොදුවේ කවුද කින්ද මන්ද කියලා බලන්නේ නැතුව මොන පාරේද තියෙන්නේ ඒවා ඉවත් කරන්න. ඒක තාක්ෂණ නිලධාරීගේත් වගකීමක්. පාරේ යනවා එනවානේ. කවුරු චෝදනා කරත් නැතත් ඒක කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යෝජනාව මීට කලිනුත් ආවා. පාර දෙපස රිසවේෂන් ඒක මිනිස්සු අත්පත් කරගෙන වැවිලි කරනවා. මල් වවනවා, පොල් ගස් හිටවනවා. එළවළු වවනවා. මම කියන්නේ මිනිස්සුන්ට අයිතිය තියෙන බිම් ප්‍රමාණය ඉඩ මදි ඇති. මේක වෙනස් කාරණයක්. පොදු පාර අවහිර වෙන විදියට වැඩ කරන්න බෑ. සභාවේ තියෙන සියලු පාරවල්වල මේවගේ තියෙන අවහිරතාවල් ඉවත්කර ගන්නවා නම් හොඳයි. සුද්ධ කරලා දාන්න. මේක ඉක්මනට ක්‍රියාත්මක කරන්න කියලා අප ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 20.** දෙවන අත්සන්කරු ලෙස චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීම සම්බන්ධව සභාවට සහ පළාත් පාලන කොමසාරිස්තුමාට කරුණු වසන් කරමින් අවශ්‍ය සුදුසුකම් සපුරා නැති අයෙකු පත් කිරීම නිසා නිලධාරීන් අතර, සේවා අසහනයක් මෙන්ම දූෂණයට ඉඩකඩ විවරව ඇත. එම නිසා ඒ පිළිබඳව සාකච්ඡා කොට සුදුසු නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතන්නේ ගරු සභාපතිතුමනි, මේ සේවකයෝ, නිලධාරීන් අපිත් එක්කත් කතා කරනවා. ඇත්තටම ඉන්න ජ්‍යෙෂ්ඨතම නිලධාරියා පත් කරනවා නම් මේ ප්‍රශ්නය එන්නේ නෑ. විශ්වාසය කියන එක තුළ පහුගිය කාලේ අනවශ්‍ය තරමින් චෙක් අත්සන් කරලා තිබුණා. අපි දන්නේ නෑ ඒවා කොහොම වුනාද කියලා. එහෙම කතා යනවා. සේවකයින් අතර ප්‍රශ්නයක් තියෙනවා මේක ක්‍රමයකට සිදු වෙලා නෑ කියලා. තියෙනවා කෙරෙන්න ඕන ක්‍රමයක්. ඒ ක්‍රමයට සිදු වෙලා නෑ කියලා කියනවා. ඒ නිසා මේක නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ ප්‍රකාශ කරන එක ගැන ගැටළුවක් තියෙනවා. 2019.04.11 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීන්දුවක් අරගෙන තියෙනවා. කොතනකටවත් වසන් කරලා කරපු කාරණයක් නෙමෙයි. ඔබතුමා දැන් නින්දෙන් නැගිටලා වගේ කියන එක පිළිබඳව ගැටළුවක් තියෙනවා. 2019.04.11 දින පවත්වපු සභා රැස්වීමේ තීරණය දැන් මගේ ලග තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ යෝජනාව ටිකක් කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ ලිපිය කියවන්නම්.

ලේකම්,

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව,

**<u>සභා තීරණ අංක ඃ- ඇ.02</u>**

2019.04.11 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ පහත සඳහන් කරමි.

02. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම සඳහා ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මැයෙන් සභාවට ඉදිරිපත් වූ පහත ලිපිය පිළිබඳ මහා සභාව විසින් සලකා බලන ලදී.

03. ලිපියේ විස්තරය ඃ- චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම - බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

එකී ලිපිය අනුව අප ප්‍රාදේශීය සභාවේ පොදු ගිණුම (ගිණුම් අංක 0000400935), කර්මාන්ත ගිණුම (ගිණුම් අංක 0003528344), සේවක ණය ගිණුම (ගිණුම් අංක 0003528365) හා නාගරික සංවර්ධන ගිණුම (ගිණුම් අංක 0075833867) යන ගිණුම් වල දෙවන අත්සන්කරු ලෙස ප්‍රධාන කළමනාකරණ සහකාර ඉසුරුණි රන්මිණි ලංකාපුර මෙය වෙත බලය පවරා තිබීම මහ සභාව විසින් අනුමත කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එකී ලිපිය අනුව කියලනේ කිවුවේ. එකී ලිපිය ටිකක් කියවන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවා පළාත් පාලන කොමසාරිස්තුමාට කරුණු වසන් කරා කියලා. පළාත් පාලන කොමසාරිස්තුමා පළාත් පාලන කොමසාරිස්තුමා ලංකා බැංකුවට ලිපියක් යවනවා මේ සම්බන්ධව. මම ඒකත් කියවන්නම්.

කළමනාකරු,
ලංකා බැංකුව,
ගාල්ල.

**<u>චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම - බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් මා අමතන ලද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ අංක BP/PS හා 2019.04.01 දිනැති ලිපිය හා බැඳේ.

02. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පහත අංක සඳහන් ජංගම ගිණුම්වල දෙවන අත්සන්කරු ලෙස චෙක්පත් අත්සන් කිරීම සඳහා කේ. අයි. සී. රත්නමාලි මිය වෙත පවරා තිබූ බලය මෙම ලිපියේ සඳහන් දින සිට අවලංගු කරන බව කාරුණිකව දන්වමි.

03. ඒ වෙනුවට එම ගිණුම්වල දෙවන අත්සන්කරු ලෙස ප්‍රධාන කළමනාකරණ සහකාර ඉසුරුණි රන්මිණි ලංකාපුර මෙය වෙත බලය පවරමින් එම නිලධාරියාගේ ආදර්ශ අත්සන සහිත අත්සන් කාඩ්පත් සහතික කොට අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

පොදු ගිණුම 0000400935
කර්මාන්ත ගිණුම 0003528344
සේවක ණය ගිණුම 0003528365
නාගරික සංවර්ධන ගිණුම 0075833867

රනිල් වික්‍රමසේකර,
පළාත් පාලන කොමසාරිස්,
දකුණු පළාත.

පිටපත ඃ- ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. - අ.ක.ස.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා සභා තීන්දුව ගනිපු ලිපිය කියවන්න කියලා. ඒ ලිපිය කියවන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ලිපිය තමයි දැන් කියෙව්වේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවට දාපු යෝජනාව මොකක්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ බලය පවරපු ලිපිය සභාවේ අනුමත කරලා තියෙනවා. ඒ ලියුම තමයි දැන් කියෙව්වේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවට කරපු යෝජනාව කියවන්නකෝ බලය පැවරීම සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මේ විදියටනේ සිද්ධ වුනේ. අපේ සීසී මිස් විදියට හිටියේ රත්නමාලි මිස්. රත්නමාලි මිස් ස්ථාන මාරු ගියානේ. නමුත් ඒ වෙනුවට නිලධාරියෙක් ආවේ නෑ. මෙතන පරිපාලන කටයුතු පිළිබඳව ප්‍රධාන නිලධාරියා තමයි ලේකම්තුමා. එතුමා ඒ වගකීම දරනවා. එතුමා රනිල් වික්‍රමසේකර පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලලා තියෙනවා මේ නිලධාරිනියට චෙක්පත් අත්සන් කරන්න බලය පවරන්න කියලා. එතුමිය සීසී විදියට පත්කරලා නෑ කොතනකවත්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා පොඩි බාධාවක් කරනවා. දැන් ඒ පළාත් පාලන කොමසාරිස්ට යවපු ලියුම කියවන්නකෝ. දැන් ඔබතුමා මෙතන කියනවා සීසී විදියට පත්වෙලා නෑ කියලා. ඔබතුමා ඒ ලිපිය ආයිම කියවන්නකෝ. දැන් ඒ සීසී නෙමෙයිද ප්‍රධාන කළමනාකරණ සහකාර කියන්නේ.

ගරු සභාපතිතුමනි, ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර කියන්නේ සීසී තමයි. ඔබතුමා දැන් කිවුවා සීසී බවට පත්කරලා නෑ කියලා. ඒක තමයි ප්‍රශ්නය තියෙන්නේ. මේ කාරණය ගැන මට කතා කරන්න පොදු වගකීමක් තියෙනවා. මන්ත්‍රීවරයෙක් හැටියට නෙමෙයි සේවාවේ වෘත්තීය සමිති නියෝජිතයෙක් විදියට.

පළවෙනි කාරණය අපේ සේවාවේ, කළමනාකරණ සහකාර සේවාවේ තියෙනවා පොදු සම්ප්‍රදායන් ටිකක්. විශේෂයෙන්ම ඒවා අනෙක් සේවාවන් වලත් තියෙනවා. සේවාවේ පළපුරුද්ද හා ජ්‍යෝෂ්ඨත්වය අනුව වගකීම් පවරනවා. ඒක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. ඒකේ ඇති වැරැද්දකුත් නෑ. ඔහු යම් තනතුරකට පත් වෙලා තියෙන්නේ සුදුසුකම් අනුව. අඩුපාඩු තියෙන්න පුළුවන් මිනිස්සුන්ගේ විවිධත්වය අනුව. පුද්ගල හැකියාව වෙනස් වෙන්න පුළුවන්. එවැනි කාරණා වලදී මේ සේවාවේ අවස්ථාව තියෙනවා පුහුණුවීම් ලබා දීලා ඒ සුදුසුකම් සම්පූර්ණ කරලා ඒකට යොදවන්න. නමුත් අපිට ජ්‍යෝෂ්ඨතාවය නොසලකා කෙනෙක් හැල්ලුවට පත්වෙන පරිදි වැඩ කරන්න බෑ.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. එතුමියට ඒ සීසී ස්ථානයේ වාඩි වෙන්න දෙන්නේ නෑ කෙනෙක් එනකන්. අපි දිගින් දිගටම ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා කියන දේ තේරෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් කරලා ලේකම්තුමාට කරුණු පැහැදිලි කරන්න අවස්ථාව ලබා දෙන්නද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවේ මම කරුණු පැහැදිලි කරනවනේ. එතකන් ටිකක් ඉන්න. ඔබතුමා කියනවා ප්‍රධාන කළමනාකරණ සහකාර පුටුවේ වාඩිවෙන්න දෙන්නේ නෑ කියලා. ලිඛිතව පළාත් පාලන කොමසාරිස්ට, සභාවට ඉදිරිපත් කරලා තියෙනවා ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුරේ කියලා. ඒක නීත්‍යානුකූලයි. මේක වචනයෙන් වෙන දෙයක් කියලා ලිඛිතව බලය පවරලා, ඒක සුදුසු නැද්ද කියලා ඒක තීරණය කරන්න. මම කියන්නේ පුද්ගල අඩුපාඩු මිනිස්සුන්ගේ තියෙනවා නම් ඒක සම්පූර්ණ කරන ක්‍රමවේද තියෙනවා. ඒවා සකස්කර ගන්න. විශ්වාසය සම්බන්ධ කාරණාව ලේකම්තුමා ඉදිරිපත් කරනවා. විශ්වාසය පෞද්ගලිකව නම් ගෙදර එක්කෙනා ගැන කියන්න පුළුවන් මට විශ්වාස නෑ කියලා. තනතුරක මේ ප්‍රශ්න තියෙනවා. ඒවා සකස්කර ගන්න ක්‍රමවේද තියෙනවා. ඔහුට අවවාද කරන්න පුළුවන්. නැත්නම් චෝදනා පත්‍රයක් දෙන්න පුලුවන්.

මේ කාරණාව සභාව ඇතුලේ මමත් කතා කරා. සමහරුන්ට පෞද්ගලිකව අපිට මතුවෙන ගැටළු තියෙන්න පුළුවන්. හැබැයි රාජකාරියේදී, සේවාවක් සම්බන්ධ කටයුත්තකදී, එවැනි පෞද්ගලික ප්‍රශ්නවලට විසඳුම් දෙන්න බෑ. ඒවාට තියෙනවා ක්‍රමවේදයක්. නිලධාරියෙකුට තමන්ගේ තනතුරට අදාල වෙන විදියට චෝදනා පත්‍රයක් දීලා එහෙම නැත්නම් ඔහුට විනය පරීක්ෂණයක් කරලා, අවවාද කරලා, තරවටු කරලා දඬුවම් දෙන ක්‍රමවේද ආයතන සංග්‍රහයේ පැහැදිලිව තියෙනවා. ඒ දඬුවම් වලට යටත්වුන කෙනෙකුට තාවකාලිකව අපිට අත්හිටවලා තියාගන්න පුළුවන් යම් තනතුරක වගකීම ලබාදෙන එක. හැබැයි එහෙම හේතුවකුත් නොදන්වා ජ්‍යෙෂ්ඨයත්වය නොසලකා, විශ්වාසයි මට කියලා, එහෙම නැත්නම් ඊට වැඩිය දැනුම තියෙනවා කියලා අපේ තීර්ණායක මත තව කෙනෙකුට බලය පැවරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තියෙනවා. ආයතනයක් විදියට අපි මේ තීන්දු තීරණ ගන්නේ එතකොට සභාවක් විදියට අනුමත කරන්නේ ඒ ආයතනයේ බලය පැවරිලා තියෙන විදිය අනුව. ඒක අපි නිවරදිව කරන්නේ නැතුව, ඊට පටහැනිව ක්‍රියා කරනවා නම් ඒක සාධාරණ වෙන්නේ නෑ කියන එක තමයි මගේ තීරණය. ඔබතුමා කල්පනා කරන්න ඕන ඒ විදියට. ආයතන ප්‍රධානියා ඔබතුමා. ආයතන ප්‍රධානියා විදියට ඔබතුමා දකින්න ඕන සේවකයන් සියල්ලන්ගේම පොදු ප්‍රශ්නයක් විදියට. ඒ පුද්ගලයාට ස්ථාන මාරුවක් ලැබිලා කියලා සඳහන් කරනවා. හැබැයි තාම ස්ථාන මාරුව ක්‍රියාත්මක වෙලා නෑ. ඒ නිසා ඔහු ඒ ආයතන ඇතුලේ නිලධාරියෙක්, සේවකයෙක්. යන්න ඉන්නවා කියලා ඔහුගේ විෂයපථය අයින් කරලා නැනේ. මම මේ ප්‍රශ්නය පිළිබඳව මැදිහත්වෙලා කතා කරන්නේ විරෝධතාවය දක්වන එක නෙමෙයි. අර පුද්ගලයට වැඩි දක්ෂතාවයක් තියෙන්න පුළුවන්. ඒක වෙනම කාරණයක්. ඒක එහෙම කියලා අපිට අයිතියක් තියෙනවද කෙනෙක්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා තව කෙනෙකුට වගකීම පවරන්න. එහෙම බෑ. එහෙම කරොත් ඒක වැරදියි. ඒ නිසා මේක ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරනවා සභාව ඇතුලේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම එකක් තියෙනවා. අපි මේ කතා කරන දේවල් එළියට ගිහිං ඒ නිලධාරිනියට යන්න පුළුවන් අපි මෙහෙම විරුද්ධ වුනා කියලා. ඇත්තටම අපි මොන විදියකින්වත් කියන්නේ නෑ ඒ නිලධාරිනිය මහා දූෂිත නිලධාරිනියක් කියලා. එහෙම එකක් නෙමෙයි. හැබැයි මෙතුමා ඉතා පැහැදිලිව රාජ්‍ය සේවකයෙක් විදියට විග්‍රහ කරපු ආකාරයට ඒ දේ ඉතා නිවැරදියි. එතකොට ඒ ඇරෙන්න ඊට ඉහළින් ඉන්න අය ඒ ගැන කතා කරනවා. මේ ප්‍රශ්න තියෙනවා කියලා. ඊලඟට එකක් තියෙනවා මේ නිලධාරිනිය තාම පරිවාස කාලයේ ඉන්නේ. මෙහෙම තියෙද්දී මේ තත්වය තුළ අපි දන්නවා සමහර වෙලාවට චෙක්පත් පවා අත්සන් කරලා තියා ගන්න වෙනවා. එතුමියට තියෙන වගකීම මොකක්ද ඇත්තටම. මම කියන්නේ සභාපතිතුමා වෙන ප්‍රශ්නයක් උඩ නෙමෙයි, මෙතුමා බොහොම පැහැදිලිව කිවුවා ස්ථාන මාරුවක් ක්‍රියාත්මක වෙන්න තියෙනවාද, ඒ ස්ථාන මාරුව ක්‍රියාත්මක වෙනකම් විෂයක් භාරදීලා තියෙනවා, මෙතන සේවකයෙක්.

ඊලඟට ඉදිරිපත් කරපු ලියුමේ බොහොම පැහැදිලිව කියලා තියෙනවා විශ්වාසය අරවා මේවා ගැන. රාජ්‍ය සේවයට විශ්වාසය කියලා එකක් නෑ. රාජ්‍ය සේවකයෙක් නම් රාජ්‍ය සේවකයෙක්. ඒක විශ්වාසය උඩද කියන එක ප්‍රශ්නයක් තියා ගන්න බෑ ඒ තනතුර භාරදෙනකොට. ඒ නිසා සභාපතිතුමනි, ඒ පිළිබඳව ක්‍රියා මාර්ගයක් ගන්න. මේක පරිපාලනයේදි වෙච්ච ලොකු වැරැද්දක්. ඉතාම නරක වැරැද්දක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිලධාරීන් පිළිබඳ සම්පූර්ණ පාලනය සිදු කරන්නේ ලේකම්තුමා. මේ ලිපිය ලේකම්තුමාගේ ඉල්ලීම අනුව ආපු එකක්. ඒකට ලේකම්තුමාගේ අදහස් සභාවට ඉදිරිපත් කරන්න මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්.එච්.අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- සේවකයන්ගේ වැටුප් ගෙවීමට ඇති නිසා මෙම පත්කිරීම ක්ෂණිකව සිදුකල බව
- ජ්‍යෙෂ්ඨත්වයට ඉඩ දී කාර්යාලය කඩා වැටීමට ඉඩ සැලැස්විය නොහැකි බව
- ජ්‍යෙෂ්ඨත්වයට වඩා දක්ෂතාවයට තනතුරු ලබා දී ඇති බවට පූර්වාදර්ශ
- දක්ෂතාවයට හා උගත්කමට තැනක් නැති නිසා රාජ්‍ය තන්ත්‍රය මේ තත්වයට පත්වී ඇති බව
- ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර පාලනය සිදු කරන ආකාරය
- චෙක්පත් අත්සන් කිරීමේ ක්‍රියාදාමය තුලදී දූෂණයක් සිදුවීම අවම බව
- කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකුගේ අඩුවක් පවතින බව
- සභාවේ සිටින සියලුම කළමනාකරණ සහකාර නිලධාරීන් III ශ්‍රේණියේ බව
- I ශ්‍රේණියේ කළමනාකරණ සහකාර නිලධාරියෙක් පැමිණිවිට ඔහුට මෙම තනතුර ලබාදීමට කටයුතු කරන බව
- චෙක්පත්වල පළමු අත්සන්කරු සභාවේ ලේකම් බව
- කළමනාකරණ සහකාර නිලධාරීන් වෙනුවට සංවර්ධන නිලධාරීන් වැඩ බලන බව සහ ඊට උදාහරණ
- අදාල නිලධාරිනියගේ සේවයට ඇති කැපවීම
- අදාල නිලධාරිනියට චෙක්පත් අත්සන් කිරීමේ බලය පමණක් පවරා ඇති බව

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ කාරණය පැහැදිලියි ඉන්දික මන්ත්‍රීතුමා. දැන් ඔබතුමා කියන්න කවුද මෙතනට පත්කරන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරි පැහැදිලියි සුගත් මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් පත් කරන්න වෙන්නේ කැෂියර් එකේ ඉන්න මිස්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙහෙම කතා කරන්න. ඉදිරිපත් කරන කොට කිවුවා කැෂියර් එකේ ඉන්න මිස් ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩිම කෙනා කියලා. ඊළඟට ඉන්න කෙනාට ස්ථාන මාරුවක් ලැබිලා තියෙනවා කිවුවා. ඒ සියලු දෙනා වගකීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කරලා තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් සිය පාරක් විතර කිවුවේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ඒ පත්කිරීම සිදු කරා. කොතනකවත් කියලා නෑ මන්ත්‍රීතුමා ජ්‍යෙෂ්ඨත්වය මත පත්කරන්න කියලා. කොතනද කියලා තියෙන්නේ කියලා මට පෙන්වන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රාජකාරි ක්‍රමවේදය අනුව තනතුරුවල වගකීම පවරන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුව. ඒක තමයි සම්ප්‍රදාය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්ප්‍රදායේ කතාව වෙනම දෙයක්. කොතනද කියලා තියෙන්නේ කියලා මට කියන්න ජ්‍යෙෂ්ඨත්වයට පත් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාලා රාජකාරි කරන කොට වුනත් බලන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක හරි. එහෙම නොවී පත්වුන අවස්ථා තියෙනවා. කවුරුවත් සංතෝෂ කරන්න කොහොමවත් බෑ. මම උදාහරණයක් කලින් කිවුවේ. වර්තමානයේ යුධ හමුදාපතිවරයා හමුදාවෙනුත් අයින් වෙලා රට ඉඳලා ගෙන්වලා හමුදාපති කරා. එහෙමනම් පහළ ඉන්න මිනිස්සු කොච්චර අවුල් වෙන්න ඕනද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එතන ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ ප්‍රශ්නයක් නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** පහළ කෙනෙක්ද පත්කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නැත්නම්. ජ්‍යෙෂ්ඨයෝ හතර දෙනෙක් ඊට උඩින් ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** කාර්යාල ක්‍රමවේදය අනුව අපේ සේවාවේ තියෙන්නේ අරහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වික්‍රමසිංහ මහත්තයා ඉන්නකොට පූජිත් ජයසුන්දර මහත්තයව පොලිස්පති කරා. ඕවා මේකේ හැමතැනම සිද්ධ වෙච්ච දේවල්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** කාර්යාලය ඇතුලේ සේවකයන් අතෘප්තියට පත් වෙලා තියෙනවා මේ කාරණාව නිසා. ඒ අවස්ථාව නොලැබුණ අය කලකිරීමට ලක් වෙලා තියෙනවා. ස්ථාන මාරුවක් තියෙන කෙනෙක්ව මෙතන රඳවා ගත්තා කියලා දෙයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ අය කලකිරීමට ලක් වෙන්න දෙයක් නෑ. බොහොම වගකීමෙන් කියන්නේ සීසී කෙනෙක් දෙන්න ඕන අපිට. අපෙන් සීසී කෙනෙක් ගියහම එක්කෙනෙක් එන්න ඕන. ඒ එන ප්‍රමාදය විතරයි මෙතන තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒ එන ප්‍රමාදය තුළ වුනත් අසාධාරණ විදියට කෙනෙක්ගේ වරප්‍රසාද අහිමි කරන එක යුක්ති සහගත නෑ. අපි ඉදිරිපත් කරන කාරණය ඒකයි. තාවකාලිකව වුනත් ඒ පත්කිරිම කරන්න ඕනේ ඒ සුදුසුකම් අනුව, ජ්‍යෙෂ්ඨත්වය අනුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** හැබැයි මෙහෙම දෙයක් තියෙනවා. මේකත් මම වගකීමෙන් කියන්න ඕන. ඔය කවුරු වුනත්, පත්කරපු කෙනා හෝ පත්වීමට සුදුසු කෙනා හෝ මේ දක්වා කවුරුවත් ආයතන ප්‍රධානියා විදියට මාත් එක්ක කතා කරලා නෑ. ආයතන ප්‍රධානියා විදියට කාටහරි ප්‍රශ්නයක් තියෙනවානම් මාත් එක්ක කතා කරන්න ඕන. අද වෙනකන් මේක මම වගකීමෙන් කියනවා මාත් එක්ක කතා කරලා නෑ. ඒ නිසා මම හිතනවා ප්‍රශ්නයක් නෑ කියලා. කාටහරි අසාධාරණයක් වෙනවා නම් ආයතන ප්‍රධානියා එක්ක කතා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ගරු සභාපතිතුමා මෙතුමා කියන නීතිත් හරි. ලේකම්තුමා තමයි පරිපාලන ප්‍රධාන නිලධාරියා. මූල්‍ය කටයුතු සම්බන්ධව වගකීම තියෙන්නේ එතුමට. සභාවට අයිතියක් නෑ ඒවාට එහෙම නීති රීති පනවන්න. එතකොට සභාවේ පරිපාලන ප්‍රධාන නිලධාරියා විදියට එතුමාට විශ්වාසවන්ත නිලධාරියෙක් අදාළ තනතුරට පත්කර ගන්න හැකියාව තියෙනවා. ලේඛනවල ඒ කියන ජ්‍යෙෂ්ඨත්වය තියෙනවා. ඒත් ඒවා බලපාන්නේ නෑ. ආයතන ප්‍රධානියාට තමුන් එක්ක විශ්වාසයෙන් වැඩ කරන්න පුළුවන් නිලධාරියෙකු පත්කර ගන්න පුළුවන්. මම කිවුවනේ ඔබතුමාලගේ තර්කයත් හරි. ඒක ඔබතුමාලා නායකත්වය දරණ තැනකට ගැලපෙනවා. මෙතුමා මෙතන නායකත්වය දරණ නිසා මෙතුමාට විශ්වාසවන්ත නිලධාරියා තමයි පත්කර ගන්නේ. ඒ වගේ මෙතුමාට වැඩ කටයුතු පහසු කර ගන්න පුළුවන් නිලධාරිවරිය පත්කරගෙන තියෙනවා. වගකීම එතුමාට තියෙනවා. අපිට තියෙන්නේ ඒකේ පොඩි ප්‍රශ්නයක්. ප්‍රධාන කළමනාකරණ සහකාර විදියට වැඩබලන කියන එක දාන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මාත් ඒක පිළිගන්නවා. ඔබතුමා හරියට හරි. එතන තමයි වැරැද්ද වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ප්‍රධාන කළමනාකරණ සහකාර වැඩබලන විදියට ඒක එන්න ඕන. ඒ කටයුත්ත එතුමලට පරිපාලන වැඩ කටයුතු පහසු වෙන ආකාරයට යොදා ගෙන තියෙනවා. ඒක බාධාවක් කරගෙන දීර්ඝ ලෙස කතා කරන්න හොඳ නෑ.

රමේෂ් මහත්තයා පිළිබඳ සභා වාර්තා අරගෙන බලන්න. පළවෙනි වාර්තාවේ ඉඳලා එතුමා ගැන යම් කිසි ඇගයීමක් මම දීලා තියෙනවා. හැමදාම දීලා තියෙනවා. මොකද මට තේරුම් ගියා යම් කිසි විධිමත් විදියකට යනවා කියලා. ඒක අද වෙන කොට ඔප්පු වෙලා තියෙනවා. ඒක නිසා අපි පරිපාලනය එක්ක ගැටෙන්නේ නැතුව මන්ත්‍රීවරු විදියට සභාවට පහසු ආකාරයට ඒ නිලධාරීන්ව පහසු ආකාරයට යෝජනා සාකච්ඡා කරමු. කාලය නාස්ති කරලා කල් මරන්න ඕන නෑ. ලේකම්තුමාට ඒ වගකීම තියෙනවා. ලේකම්තුමාට ගැලපෙන සුදුසු විශ්වාසවන්ත කෙනා පත්කර ගනීවි. ජ්‍යෝෂ්ඨත්වය අදාළ නෑ වැඩ කරන්නේ නැත්නම්. ඔබතුමාලගේ තර්කය හරි. මෙතුමාලාගේ වැඩ කටයුත්තත් හරි. එතකොට ආයතන සංග්‍රහයේ, චක්‍රලේඛවල තියෙන දේවල් අපිත් දන්නවා. ඒ වැඩ බලන නිලධාරියාට ඔබතුමාලා ලිඛිතව වැඩ පවරන්න ඕන. එතුමියට ඉදිරි උසස් වීමකදී ඒක වැදගත් වෙනවා. ඒ ඇගයීම වැදගත් වෙනවා. ඒක ගැන මගේ පැත්තෙන් මම කරුණු දැක්වූවේ. වැඩක් නැති දේකට කාලය නාස්ති කරන්න එපා කියන එක මගේ වගකීම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ යෝජනාව ස්ථිර වුනානේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව ස්ථිර වුනා. නමුත් දැන් නිලධාරියෙක්ව පත් කරලා තියෙනවා. වෙන I ශ්‍රේණියේ නිලධාරියෙක් ආවට පස්සේ මේක ක්‍රියාත්මක වෙනවා. සුදුසු නිලධාරියෙක් පත්කරන්න කියලා ඔබතුමා යෝජනා කරලා තියෙන්නේ. සුදුසු නිලධාරියෙක් ඒකට පත් කරලා තියෙනවා. ඔබතුමා ඕනනම් ඊට විරුද්ධව කරන්න පුළුවන් දේවල් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙනත් සුදුසු නිලධාරියෙක් පත්කරන්න කියලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙනත් සුදුසු කතාවක් නෑ. සුදුසු නිලධාරියෙක් පත්කරලා තියෙන්නේ. ඔබතුමාට පුළුවන් ඊට විරුද්ධව ඔබ තුමාගේ මට්ටමින් ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ රාජ්‍ය සේවයේ පත්කරපු ක්‍රමයට විරුද්ධ නිසා තමයි මේ යෝජනාව ගෙනාවේ. ඒක නිසා මම මේකට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව ස්ථිර වෙලා තියෙන්නේ. මගේනම් විරෝධතා නෑ. සුදුසු නිලධාරියෙක් පත්කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ දේවල් බොහොම පැහැදිලිව සභා වාර්තාවේ සඳහන් වෙන්න ඕන. මම කියලා තියෙන්නේ, මේ නිලධාරියා සුදුසුද කියන එක ගියපාර සභාවේදී සාකච්ඡා කරා. අපිට කරුණු වසන් වෙලා තිබුණනේ. අපි දන්නේ නෑ එයා පරිවාස කාලයේ ඉන්නවද? නැද්ද කියලා. අපිට ඒවා ඉදිරිපත් කරේ නෑ. බොහොම පැහැදිලිවම එදා දවසේ ඉදිරිපත් කරේ නෑ. සීසී කියලා පත්වීම දීලා තියෙනවා. ඒවා අපිට කිවුවේ නැනේ එහෙම දෙනවා කියලා. කොටින්ම කතාවේ මේ ටික සඳහන් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ අදහසක් තියෙනවා මේකට වැඩ බලන විදියට ඒ පත්වීම වෙනස් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව කියලා තියෙනවා මේ පිළිබඳව ප්‍රශ්න ආවහම ඒ සියලු දෙනා මුහුණ දෙන්න ඕන ඒවාට. මම මේ යෝජනාව ගෙනල්ලා තියෙන්නේ බොහොම පැහැදිලිව. ඒ යෝජනාවට සංශෝධනයක් ඕන නම් ඒ විදියට තමයි මම ගෙනාවේ. අපිට කරුණු වසන් කරලා කියන එක පැහැදිලියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද කරුණු වසන් කරලා තියෙන්නේ. සභා තීන්දුවකුත් අරගෙන තියෙනවනේ පළාත් පාලන කොමසාරිස් එවන ලියුමට. ඒකට කවුරුවත් විරුද්ධ වෙලා නෑ. ඒකට සභා තීන්දුවක් අරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස් එවපු ලියුමට නෙමෙයි. න්‍යාය පත්‍රයට ආපු එක තියෙනවා එදා මේ පත්කිරීම ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට ආව එක තමයි මේ. මේ තියෙන්නේ කොමසාරිස්තුමා එවපු ලියුම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවට දාපු යෝජනාවක් ඇති නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට යෝජනාවක් දාලා නෑ. මෙතන ස්ථාන මාරු ගියාට පස්සේ සභාවට දදා ඉන්න බෑ ඊළඟ කෙනා පත් කරන්න. ලේකම්තුමාට බලයක් තියෙනවා. ඒ ගියපු ගමන් නිලධාරියෙක් ආවේ නෑ. එතුමා නිලධාරියෙක් පත් කරලා කොමසාරිස්තුමාව දැනුවත් කරා. කොමසාරිස්තුමා එවපු ලියුම තමයි මේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවට යෝජනාව දැම්මා. සභාවට දැම්මේ නෑ කියන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැම්මේ මේ යෝජනාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕක නෙමෙයි. සභාවට ආවා යෝජනාවක් න්‍යාය පත්‍රයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ප්‍රශ්නයක් ඇත්තෙම නැනේ. සභාවට යෝජනාවක් ආවනම් අදාළ නිලධාරියා පත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අප දන්නේ නෑ මන්ත්‍රීවරු විදියට මෙයාගේ සේවාකාලය කොච්චරද කියලා. හැම මන්ත්‍රීවරයෙක්ම දන්නවද ජ්‍යෙෂ්ඨත්වය ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ යෝජනාවක් ආවානම් මන්ත්‍රීතුමා කිසි ප්‍රශ්නයක් නැනේ. ඔබතුමා සභාවේ යෝජනාවක් ආවේ නෑ කියනවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවට යෝජනාවක් ආවා අදාළ නිලධාරිනියට චෙක්පත් අත්සන් කරන්න බලය පවරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනාවක් ආවා. ඒ කොමසාරිස්තුමා එවපු ලියුමට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ස්ථිර පත්වීමක් කරලා නෑ සභාවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්‍රියන්ත මන්ත්‍රීතුමා මෙතන තියෙන වැරැද්ද පිළිබඳව ඔබතුමාලාට වැඩි දවසක් යන්න කලින් තේරෙනවා. එතකන් පොඩ්ඩක් ඉන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දූෂණයක් තියෙනවානම් ඒකට විරුද්ධයි අපි. මෙතන මොකක් හරි අක්‍රමිකතාවයක් වෙනවාද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ඔක්කොම වෙන්න පුළුවන් වෙන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. මමත් රජයේ සේවකයෙක් විදියට පුද්ගලිකව එකඟ නෑ මේකට. මම කියන්නේ පුද්ගලිකව එකඟ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඔබතුමාට තමයි අවසානයේදී ප්‍රධාන විධායකයා විදියට මේකට කරගහන්න වෙන්නේ. ලේකම්තුමාට නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චුට්ටක් ඉන්නකෝ. නමුත් මම මෙහෙම කියනවා. මම බොහොම විශ්වාසයෙන් ලේකම්තුමා එක්ක වැඩ කරනවා. නිලධාරීන්ගේ පාලනය පිළිබඳ මම මැදිහත් වෙන්නේ නෑ. ලේකම්තුමාට ප්‍රශ්නය බේරා ගන්න බැරුව නිලධාරියෙක් ඇවිල්ලා මට කිවුවොත් මම එවෙලෙම ලේකම්තුමා එක්ක සාකච්ඡා කරනවා. මේක ගාල කඩා ගත්තා වගේ මමත් මැදිහත්වෙලා නිලධාරීන් පාලනය කරන්න ගිහිල්ලා, ලේකම්තුමත් මැදිහත්වෙලා නිලධාරීන් පාලනය කරන්න ගිහිල්ලා මේක ආරාජික කරනවට වැඩිය මම ඒ වගකීම එතුමාට දීලා තියෙනවා. කාටහරි අසාධාරණයක් වුනානම් ඒක ගැන ඇවිත් මාත් එක්ක කතා කරන්න තිබුණා. මාත් එක්ක කතා කරා නම් මම ලේකම්තුමාගෙන් අහනවා මොකක්ද මේ වෙච්ච දේ කියලා. අද වෙනකන් මාත් එක්ක කිසි කෙනෙක් කතා කරේ නෑ. ඒක එක කාරණාවක්.

දෙවැනි කාරණාව තමයි ලේකම්තුමාට අවශ්‍ය කෙනෙක්, එතුමට සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන් කෙනෙක් එතන ඉඳීම පිළිබඳව වගකීම එතුමාගේ. එතුමා ඒ වගකීම අරගෙන තියෙනවා.

වැරැද්දක් වුනානම් ඒ වගකීම එතුමා අරගනීවි. ඒ බලය එතුමාට මම දීලා තියෙනවා. මොකක් හරි වුනොත් ඒකේ වගකීම අපි ගන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා අපිට කරුණු වසන් කරා කියන එක සඳහන් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 21.** විගණන වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්, විගණනයට යවන පිළිතුරු එසේ යැවීමට පෙර සභාවට ඉදිරිපත් කරන ලෙසත් යෝජනා කරමි.

දැන් මේ කාලය තුළදී විගණන වාර්තා ඇවිල්ලා තියෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විගණන වාර්තා ආවට පස්සේ සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා සභාවේ දිගටම ඉඳපු මන්ත්‍රීවරයෙක් නේ. ඔබතුමා කියන්නේ සභාවට විගණන වාර්තා ඉදිරිපත් කරාද? නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඇහුවේ දිගට කතාව නෙමෙයි මේ මාස දෙක තුනක කාලය ඇතුළත ආවද කියලා. ඊළඟට විගණනයට යවන පිළිතුරු යවන කොට අපිව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවද විගණන වාර්තා මේ සභාවට ඉදිරිපත් කරාද? නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පසුගිය කාලෙක දුන්නා. මම ඇහුවේ මේ මාස දෙක තුනක කාලයකදී දුන්නේ නැති නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආවට පස්සේ එපැයි දෙන්න අබේසේකර මන්ත්‍රීතුමා. එන්න කලින් දෙන්න බැනේ. ඔබතුමා දන්නවාද 2018.12.18 තිබුණ සභාවේදී විගණන වාර්තා ඉදිරිපත් කරලා තියෙනවා. 2019.01.17 තිබුණ සභාවේදීත් විගණන වාර්තා ඉදිරිපත් කරලා තියෙනවා. අද න්‍යාය පත්‍රයේත් තියෙනවා. අද තව එකක් සභාවට ඉදිරිපත් කරනවා. ඔබතුමාට පුදුම හදිසියක් තියෙන්නේ විගණන වාර්තා ටික අරගන්න. ඒකයි මේ ගැටලුව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි ගැටලුවක් කියන්නේ. ඒක මන්ත්‍රිවරයෙක්ගේ අයිතිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඉදිරිපත් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ විතරක් නෙමෙයි පිළිතුරු යවන කොට ඒ පිළිතුරුත් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යැව්වට පස්සේ දෙන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලිව කියනවා ඔබතුමාලා මේක තේරුම් ගන්න. ඇහුන්කන් දෙන්න ගරු මන්ත්‍රීවරු කරුණාකරලා. එහෙම කියන්නේ වෙන දෙයක් හින්දා නෙමෙයි. මම අත්දැකීමෙන් දන්නවා වීදුරු ගෙනල්ලා මෙහේ අධිභාරයක් කරා. ඒ අධිභාරය කරන කොට උත්තර යැව්වා. හැබැයි මේ මන්ත්‍රීවරු දන්නේ නෑ මොනවද යවපු උත්තර කියලා. හැබැයි තම තමන්ටත් උත්තරයක් තියෙනවා නිවැරදි කරන්න. එදා මං හිටියේ නෑ, මම ඒකට සම්බන්ධ වුනේ නෑ කියලා කියන්න පුළුවන් වෙන්න ඕන. ඒකට ඉඩකඩ හම්බ වුනේ නෑ. ඒවගේම ඒක යැව්වට පස්සේ කියන්නම් කියන්නේ මේ මන්ත්‍රීවරු දැනගන්න ඕන නැති දෙයක් තියෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි ප්‍රශ්නය. සති දෙකක් ඇතුළත උත්තර යවන්න ඕන. සභාවට දදා ඉන්න වෙලාවක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලිව එකක් කියනවා. අපි මේවා ඉදිරිපත් කරලා තියෙන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි. මේ විගණනයේදී කවද හරි ආවොත් එහෙම අපි නොදැනුවත්ව අපි සම්බන්ධ වුණ දෙයක් අපේ වගකීමක් නෑ ඒ සම්බන්ධයට. මොකද ඒ යවන උත්තරය නිවැරදිද, වැරදිද කියලා අපි දන්නේ නැත්නම් අපේ කිසිම සම්බන්ධයක් නෑ. අපේ කිසිම වගකීමක් නෑ. ඒක බොහොම පැහැදිලිව සඳහන් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමා හැමදාම කියන දේ නේ. හැම සභාවකම ඕක කියනවා. මුදල් කමිටුවකට ආවත් ඕක කියනවා. වෙන මොකක් හරි එකකට ආවත් ඕක කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාලා අපි ඉන්න කාලේත් ඕක කිවුවා. ඔබතුමත් සම්බන්ධයිනේ. ඒක නිවැරදියිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කියන්නකෝ මන්ත්‍රීතුමා සති දෙකක් ඇතුළත උත්තර යවන්න ඕන එක නොයැව්වොත් චෝදනාව එන්නේ කාටද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මතක තියාගන්න. සති දෙකක් ඇතුළත කිවුවට ඕනම එකක සති තුනක් ගන්න පුළුවන්, සති හතරක් ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විගණනයට ඒක කරන්න බෑ මන්ත්‍රීතුමා. විගණන කටයුතු වලට එහෙම කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හරි දැන් ඒක ඇති නේ.

**22.** පසුගිය විශේෂ කොමසාරිස් පාලන කාලය තුල මිලදී ගැනීම් සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන මෙන් යෝජනා කරමි. (තොරතුරු පනත යටතේද මෙම ඉල්ලීම කර ඇති අතර, මෙතෙක් එය ලබා දී නැත. එය දඩුවම් ලැබිය හැකි වරදකි. 2018.04.24 දිනැති ලිපිය මගින් සභාපතිතුමා වෙත ලිපියකින්ද ඉදිරිපත් කොට ඇත. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2018.11.19 මහ සභාවට ඒක ඉදිරිපත් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට දෙන්න කියලා ඉල්ලලා තියෙන්නේ බලන්න නෙමෙයි. මම තොරතුරු පනත යටතේත් ඉල්ලුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන එකක් තියෙනවා මන්ත්‍රීවරු ඕන නම් ඡායා පිටපත් කරලා ඉල්ල ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉල්ලලා තියෙනවා මට දෙන්න එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට විතරයි මේක ඕන. වෙන කාටවත් ඕන නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කෝ දෙන්න මට.

**23.** සභා න්‍යාය පත්‍රයේ අංක 03 ස්ථානයට ප්‍රගතිය ගත යුතු බවට යෝජනා කරමි.

මම මේක බොහොම පැහැදිලිව කියන්නේ. මෙතෙක් කල් තිබුණ සියලුම සභාවල මේ දේ කෙරුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑ. එහෙම ගන්න හැකියාවක් නෑ. රීති වල තියෙන අනුපිළිවෙලට තමයි අපි සභාව කරගෙන යන්නේ. රීති බලන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රීති වල තියෙන්න පුළුවන්. ඒ රීති වෙනස් කර ගන්න පුළුවන්. මම කොමසාරිස් කාර්යාලයෙනුත් අහලා තියෙනවා. කොමසාරිස් කාර්යාලයත් බොහොම පැහැදිලි මතයක් දරනවා එහෙම කිරීම හොඳයි කියලා. මොකද හේතුව පහුගිය සභාවේ වෙච්ච දේ, මොනවද වුනේ, මොනවද කරේ කියලා බලලා තමයි ඊළඟ යෝජනා වලට යන්න ඕන. ඔබතුමාලා අපි ඉඳපු සභාවල කෙරුණේ එහෙම. ඒ සභාවලට වැඩිය මේ සභාව හොඳද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි උපදෙස් අරගෙන යන්නේ. ඔබතුමා පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ගන්න. ප්‍රධාන අමාත්‍යතුමාට විතරයි ඒක වෙනස් කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවට පුළුවන් වෙනස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සභා තීන්දුවකින් වෙනස් කරන්න පුළුවන්. එකක් තියෙනවා බොහොම පැහැදිලිව. පහුගිය දිගටම තිබුණු සභාවල් වැරදියි එහෙමනම්. දැන් තමයි නිවැරදිව සභාව යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් අපිට පුළුවන් විදියට නිවැරදිව කරනවා. ඔබතුමා මෙතනට ආපු වෙලාවක ඔබතුමාට අවශ්‍ය විදියට කරන්න. මම රීති අනුව ඒ වැඩ කටයුතු ටික කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒ කාලේ සභාවේ දෙවතාවක් හිටියා. රීති දැනගෙන හිටියා නම් විරුද්ධ වෙන්න එපැයි ඒ කාලේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙන්න මම ඉල්ලපු ඉල්ලීමක් නෙමෙයිනේ. ඔබතුමා දිගින් දිගටම සභාපතිවරුන්ට බලපෑම් කරලා ඕක දා ගත්තා උඩට. මම ඉල්ලපු එකක් නෙමෙයිනේ. නමුත් දැන් රීති අනුව තමයි වැඩ කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 24.** බැකෝ යන්ත්‍රයේ අලුත්වැඩියාව පැහැදිලිවම අක්‍රමිකතාවයක් බැවින් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට පුළුවන් ඒ පිළිබඳ පරීක්ෂණයක් වෙනම ඉල්ලන්න. අපි කියන්නේ කරපු දේ හරි. මිල ගණන් කැඳවලා සෙනොක් එකට දීලා තියෙන්නේ. සෙනොක් එකෙන් තමයි කරලා තියෙන්නේ. ඒක හරියට කරලා තියෙනවා. ඉංජිනියර් රිපෝට්ස් තියෙනවා. ඔබතුමාට පරීක්ෂණයක් ඕන නම් ඉල්ලන්න පුලුවන්. සභාවේ මන්ත්‍රීවරු විදියට අපි පරීක්ෂණයක් ඉල්ලන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මේ යෝජනාවට බෙදීමක් ඉල්ලනවා. මට කමක් නෑ මේක පරාද වුනාට. හැම කෙනෙක්ගෙම හෘද සාක්ෂිය ඒක දන්නවා. මේ සභාවේ ලක්ෂ 16 ක් විතර වියදම් කරලා ඒක හැදුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කතා කරාට පස්සේ ඔබතුමා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් කියන එකත් වැරදියි දැන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද එක වගේනේ සභාපතිතුමා. එහෙම ඔව් කියලා කියන්න ඕන නෑ.

ඊළඟට ගෙනල්ලා ඉවර වෙලා, අර වඩම්මව ගෙන ඇවිල්ලා, මාස ගාණක් තිබිලා රෙපෙයාර්එක කරලා ආයේ ගිහින් දාලා ලක්ෂ ගාණක් වියදම් කරලා තමයි ගත්තේ. ඉතිං මම අහන්නේ මොකක්ද මේ බැකෝ තියෙන තේරුම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද තවත් ලක්ෂ ගාණක් වියදම් කරපු කතාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රු. 91,000.00 ක් ද කොහෙද වියදම් වුණානේ. මාර වැඩක් නේ බොහොම පැහැදිලිවම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ලක්ෂ 16 ට අමතරව තවත් මුදලක් වියදම් වුනාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ 16 නෙමෙයි ලක්ෂ 14 යි. ලක්ෂ 14 ට කරේ. මේක මේ මන්ත්‍රීවරු දැනගන්න ඕන කාරණාවක්. ලක්ෂ 14 න් කරේ එන්ජිම රෙපෙයාර් කරපු එක. මම මේක පැහැදිලි කරලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පළවෙනි සභාවේදී මේක හදන්න යෝජනාව දානකොටම කිවුවා තවත් යන්නේ නෑ සියලු වගකීම් ගන්නවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නිකං තිබිලා ඔයිල් සීල් කරවෙලා. වැඩ කරද්දි තමයි හයිඩ්‍රොලික් එළියට පැන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවා ටෙස්ට් කරලා ගන්න ඕන. හෙට දවසෙත් එයි මොකක් හරි ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන්න පුලුවන්. වාහන වැඩ කරන කොට තමයි ප්‍රශ්න එන්නේ. ඒක එහෙම නොවෙනවා කියලා කොයිම වෙලාවකවත් කියන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි බොහොම පැහැදිලිව මේ යෝජනාව පිළිබඳ විශේෂයෙන්ම දිගින් දිගටම අකමැතියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවේ බැකෝ එක හදලා ගේන කොට කැඩුණා නේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ගේනකොට කැඩුණා. නැවත හදලා පටවාගෙන ආවා. ඊට පස්සේ හදපු එකේ වැරැද්දක් කියලා එන්ජිම අරගෙන ගියා කොළඹ. ඊට පස්සේ ආයේම ඒ අය මැෂින් එක සවි කරා. අපි ඒකට ශත පහක්වත් වියදම් කරේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ශත පහක්වත් වියදම් කරන්න ඕන නෑනේ ඒක එයාලගේ වගකීම නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියනකන් ඉන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට මේ කාලය ඇතුළතදී ඇතිවුන අවශ්‍යතාවලදී ජේ. සී. බී. එකක් රෙන්ට් එකට අරගෙන වියදම් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ මැෂින් එක වැඩ කරන කොට හයිඩ්‍රොලික් ලීක් වුනා ඔයිල් සීල් වලින්. ඊට පස්සේ ඉංජිනියර්ගේ වාර්තාව අරගෙන මිල ගණන් ඉදිරිපත් කරලා අළුත්වැඩියාව සිදු කලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලක්ෂ ගණන් වියදම් කරලා හදපු එකට වගකීම් කාලයක් දුන්නේ නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එන්ජිමට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා අපි කියන කොට පැහැදිලිව කිවුවා දීර්ඝ අත්දැකීම් තියෙන නිසා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට වුනත් ඔයිල් සීල් කරවෙලා යන්න පුළුවන්. හෝස් යන්න පුළුවන්. අළුත්වැඩියා කරේ එන්ජිම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔයිල් සීල් සවිකරේ කොහේද?. සෙනොක් එකෙන්මද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. සෙනොක් එකට යවලා තව අවුරුද්දක් විතර බලන් ඉන්නද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් එදා එන්ජිම රෙපෙයාර් කරපු අයට ඕක කරන්න බැරිද?. එයාලට වගකීමක් නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අදටත් ඉන්න මතය මන්ත්‍රීතුමා, අපි වෙනතැනකට දාලා කරා නම් සෙනොක් එකෙන් නැතුව වෙන ගරාජ් එකකට දැම්මානම් ඕක ලක්ෂ 06 කින් 07 කින් කරගන්න තිබුණා. මුල ඉඳන් කිවුවා. සෙනොක් එකට දාලත් ඔහොම නම් ඔයගොල්ලෝ කතා කරන්නේ වෙන තැනකට දැම්මානම් හිතාගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ අපි කතාකරනවා ඒ විදියටම. ඔබතුමා දන්නවානේ ඕනම දෙයක් හදන්න දුන්නම දෙන්න ඕන කාලයක් තියෙනවා. ඕක හදන්න ගියපු කාලය දන්නවානේ. අපි කොච්චර වියදම් කරාද ඒ කාලය ඇතුළත. අපේ පාරවල් නඩත්තු කරන්න, ඇළවල් හාරන වැඩවලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් බලන්නකෝ ඉස්සරහට මොකද වෙන්නේ කියලා. ඔබතුමාට රිදෙන්නේ ඒකයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට බොහොම පැහැදිලිව ප්‍රශ්නයක් තියෙනවා ඇයි මේ සභාවෙන් යවන්න බැරි යෝජනාවක් විදියට පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ අපි යවන්නේ නෑ. ඔබතුමාට ප්‍රශ්නයක් තියේ නම් ඔබතුමා යවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව කියලා තියෙනවා මේක දූෂණයක්. මම මේකට විරුද්ධයි. මේ යෝජනාව ස්ථිර වෙලා තියෙනවා. මම මේකට බෙදීමක් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපි විවෘතව කතා කරමුකෝ. කලින් සභාවලත් ඔහොම ප්‍රශ්න වෙච්ච වෙලාවල් වලට අපි කරේ මොකක්ද?. ඔබතුමයි, මමයි කරේ මොකක්ද?. සභාවේ තීන්දුවක් අරගෙන යැව්වේ නෑ කොයි වෙලාවකවත්. ඔබතුමයි, මමයි ඒකට කැමති මන්ත්‍රීවරු අත්සන් කරලා යැව්වා පරීක්ෂණයක් කරන්න කියලා. ඒකනේ කරේ මන්ත්‍රීතුමා. අපි දෙන්නා අත්සන් කරලා යවපු ගොඩක් තියෙනවානේ. වැරදි දැකපුවට පරීක්ෂණ කරන්න කියලා යැව්වා. ඒක තමයි ඔබතුමාට කියන්නේ. අපි සභාවක් විදියට කොයි වෙලාවකවත් යැව්වේ නෑ. සභාවෙන් කරපු දෙයක් ගැන සභාව වැරදිකරුයි කියලා පරීක්ෂණ කරන්න යවන්න බෑ. ඒක තේරුම් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව වැරැද්දක් කරලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඔබතුමා මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව නෙමෙයි වැරැද්දක් කරලා තියෙන්නේ ඒ ආයතනය. මේ ආයතන හරියට වැඩ කරලා නෑ. අපි ඒ ආයතනයෙන් අය කර ගන්න ඕන. ඇයි ඒ අයකරගන්න එකට තියෙන ප්‍රශ්නය. ඔබතුමා එක්ක අපි ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකටද අය කරන්නේ. දැන් ජේ. සී. බී. එක වැඩ කරනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මාස ගාණක් ගියා හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි ඉතිං. එන්ජිම රෙපෙයාර් කරන කොට එහෙම වෙනවා. කාලය පිළිබඳ පරීක්ෂණයක් කරන්න කියන්න බෑ අපිට. ජේ. සී. බී. එක වැඩ කරන්නේ නැතුව ආයිම රෙපෙයාර් කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව හරි, වැරදි කියන්න නෙමෙයි මම මේක ගෙනාවේ. වැරැද්දක් වුනා මෙතන. ඔබතුමාට වැරැද්දක් පේන්නේ නැත්නම්, අඩුපාඩුවක් වුණා කියලා තේරෙන්නේ නැත්නම්, ඒ අඩුපාඩුව නිසා අපිට කී දාහක් අලාභ වුනාද කියලා දන්නේ නැත්නම්, ඒක තේරුම් ගන්න බැරි ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා දැන් ජේ.සී.බී. එක වැඩ කරනවානේ. ශත පහක්වත් අය කරන්නේ නැතුව ගෙනල්ලා දුන්නේ වගකීම් කාලය ඇතුළත.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙහෙමයි සභාපතිතුමා. දැන් අපෙන් වාහනය හදන්න දුන්නහම එයාලා දින දෙනවා මාස තුනකින් හදලා දෙනවාද, මාස හයකින් හදලා දෙනවාද කියලා. ඊට පස්සේ අවුරුදු ගාණක් ගියා. සභාව ආදායමක් උපයන යන්ත්‍රයක් මේක. එතකොට මේක එහේ නතර කරගෙන ඉන්නකොට සභාවට විශාල පාඩුවක් වුණා. කාලය ඕනවට වඩා ඉක්මවා ගියා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කරපු අලුත්වැඩියාව මොකක්ද කියලා බැලුවට පස්සේ දැන ගන්න පුළුවන් මෙච්චර කාලයක් ඒ අළුත්වැඩියාවට යනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. මම කලින් කියපු දේම තමයි නැවත කියන්න වෙන්නේ. ඕක වෙනත් ගරාජ් එකකට දැම්මානම් අපිට අඩු මුදලකින් ඉක්මනට කර ගන්න තිබුණා. නමුත් වැඩේ විනිවිදභාවයෙන් කරන්න ඕන හින්දා තමයි සෙනොක් ආයතනයට දැම්මේ. ඒක අලෙවි නියෝජිත ආයතනය. මමත් කීපපාරක්ම ගියා බලන්න. ඒ ගියපු කාලය පිළිබඳ අපිට කරන්න දෙයක් නෑ. ඒ තමයි නියෝජිත සේවා ආයතනය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නියෝජිත ආයතනය නිසා ඒකට දෙන එක සම්බන්ධයෙන් බලපෑමක් නැත්නම්, අනිත් ආයතන වලින් මිල ගණන් කැඳවලා ප්‍රසම්පාදන ක්‍රියාවලියට ගිහින් වෙන වෙන ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන් හින්දා තමයි පහසුවට කවුරුත් කරන්නේ අළෙවි නියෝජිත ආයතනයට ලබා දෙන එක. ඒක සමහර විට මිල වැඩි වෙන්න පුළුවන්. නමුත් අපිට ප්‍රශ්නය වෙලා තියෙන්නේ මිල නෙමෙයි. ඒ රෙපෙයාර් එක කරන්න ගතවුන කාලය ඇතුළත විශාල පාඩුවක් වෙලා තියෙනවා සභාවට. ඒ කරපු රෙපෙයාර් එක චෙක් කරලා බැලුවට පස්සේ ඒ රෙපෙයාර් එකට මෙච්චර ගාණක් යනවද, මෙච්චර වියදමක් කරලා කරන්න ඕන රෙපෙයාර් එකක්ද කියලා බලන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කාලසීමාවක් දීලා නැනේ. මෙන්න මෙච්චර කාලසීමාවක් ගතවෙනවා කියලා එයාලා දීලා නෑ. ඉතිං ඒකට ඒ අය එක්ක අපිට කරන්න දෙයක් නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට කල් ඇතුව කියන්න බැනේ. අපි රෙපෙයාර් එක මොකක්ද කියලා දන්නේ නෑ නේ. රෙපෙයාර් එක කරාට පස්සේ එයාලා කියනවා අහවල් අහවල් අළුත්වැඩියාවන් සිදු කරා කියලා. ඕන කෙනෙකුට තේරෙනවා ඒක බැලුවහම මේ අළුත්වැඩියාව කරන්න කොච්චර කාලසීමාවක් ගත වෙනවාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. ඉංජිනේරුතුමාගේ අධීක්ෂණය මත තමයි කරලා තියෙන්නේ. මේකේ වැරැද්දක් වුනානම් වෙන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ. අපෙන් වැරැද්දක් වෙලා නෑ. අපිට පරීක්ෂණය අදාළ නෑ. ඔබතුමාට ප්‍රශ්නයක් තියෙනවානම් පරීක්ෂණයක් ඉල්ලන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙතුමා පරීක්ෂණය ඉල්ලන්නේ සභාවට පාඩුවක් වුනා මෙච්චර කාලසීමාවක් අළුත්වැඩියාවට ගත වුනා කියලා. ඒ වෙනුවෙන් පරීක්ෂණයක් ඉල්ලන්න කියලා මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මෙතුමා කියන්නේ ඒක නෙමෙයි. බැකෝ යන්ත්‍රයේ අලුත්වැඩියාව පැහැදිලිවම අක්‍රමිකතාවයක් බැවින් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ අක්‍රමිකතාවය අර්ථයෙන් කියන්නේ අළුත්වැඩියාව පමා වුණා කියන එක. මේ ගොල්ලෝ එහෙමනම් අවුරුදු ගණන් තියා ගන්න පුළුවන්නේ. මේ කතා කරන්නේ අළුත්වැඩියා ප්‍රමාද වුන නිසා ඇතිවුන අලාභය පිළිබඳ. අක්‍රමිකතාවය පිළිබඳ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒකේ කමිටුවේ හිටියේ මම. මගේ ප්‍රධානත්වයෙන් කමිටුව තිබුණේ. අදාළ ආයතනය තීරණය කරේ කමිටුවෙන් ඔක්කොමත් එක්ක. ඉතිං අපි අපිටම විරුද්ධව පරීක්ෂණ කරන්න බෑ. ඕන නම් මන්ත්‍රීවරුන්ට පුළුවන් තමන් කැමති නම් පරීක්ෂණයක් ඉල්ලලා දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක කවුරුවත් එහෙම කළ යුතු නෑ. මම බෙදීමක් ඉල්ලනවා. මම බොහොම පැහැදිලිව බෙදීමක් ඉල්ලනවා. ඒක ගත්තහම ඉවරයිනේ. නැත්නම් ඕකම කතා කර කර ඉන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි දිනුවත් පැරදුනත් කමක් නෑ. බැකෝ එක වැඩ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. පරීක්ෂණ යනකං බැකෝ එක වැඩ නොකර ඉන්න පුළුවන්. එහෙම කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මාර කතාවක් නේ. අපිව බය කරලා ගන්න හදන්නේ. එහෙම කරන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නඩු භාණ්ඩයක් නෙමෙයි මේක. පැත්තකින් තියලා පරීක්ෂණය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉන්න මතය මේකයි මන්ත්‍රීතුමා. අපි විසින් කරපු දෙයකට, අපි විසින් පරීක්ෂණ ඉල්ලන එක සදාචාරාත්මක නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි නෙමෙයිනේ වැරැද්ද කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මෙහෙම කරමු. සෙනොක් ආයතනය නිසා මෙහෙම වුනා. සෙනොක් ආයතනය ගැන පරීක්ෂණයක් කරන්න කියමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොහෙන්ද වුනේ කියලා හොයන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න බළලා මල්ලෙන් එළියට පැන්නා. එහෙමනම් සෙනොක් ආයතනය විසින් මේ බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියාව සිදු කිරීමේදී මේ තරම් කාලයක් ගත වුන එක ගැන ගැටලුවක් තියෙනවා. දෙවරක් එන්ජිම අලුත්වැඩියා කරා. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා යවන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට සාධාරණ කාලයක් තුළ ලබා නොදීපු නිසා අපිට මූල්‍යමය හානියක් වුනා. හැදුවට පස්සේ දෙවැනි සැරේටත් කැඩිලා. ඒක දාන්න. ඒක ප්‍රශ්නයක් නෑ. එතකොට සංශෝධනය වෙලා යන්න ඕන. සෙනොක් ආයතනය වැඩිපුර කාලයක් ගත්තා මේකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකේ වෙලා තියෙන ගැටළුව, බැකෝ එක කැඩුණා. කැඩුණට පස්සේ අපි මිල ගණන් කැඳවන්නේ නැතුව අලෙවි නියෝජිත ආයතනයට අළුත්වැඩියාව සඳහා භාර දුන්නා. ඒ අය දීර්ඝ කාලයක් මේක තියාගෙන හිටියා. ඒ අය අපිට එහෙමනම් කියන්න ඕන මේකට මේ තරම් කාලයක් ගත වෙනවා කියලා රෙපෙයාර් එකේ ප්‍රශ්නයක් නිසා. ඒ අය රෙපෙයාර් එක අවසානයේදී කියනවා මේ මේ අළුත්වැඩියාවන් සිදු කරා, මේකට මේ මුදල අය කරනවා කියලා. ඒ නිසා අළුත්වැඩියාව කරපු දේට ගනිපු කාලය සාධාරණද කියලා බලන්න ඕන. ඒ කාලය ඇතුළේ අපි අමතර පිරිවැයක් දරලා තියෙනවා සභාවේ අරමුදල් වලින් බලප්‍රදේශයේ වැඩ කටයුතු කරන්න. ඒ වෙච්ච හානි සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලන්නේ. සභාවට මූල්‍යම හානියක් වෙලා තියෙනවානේ මේ කාලය ඇතුලත. ඒ නිසා මේක ඇතුළේ කවුරුවත් හොරකම් කියලා නෙමෙයි ඉල්ලන්නේ. වෙනත් පිට කෙනෙකුට බලපෑමක් කරලා ප්‍රමාද කරවන්න පුළුවන්නේ. මොකක් හරි සම්බන්ධයක් තියෙනව නම් බලකරලා තියාගෙන ඉන්නවා. එහෙම කල් තියාගෙන ඉන්න බෑනේ. ඒ කාරණාව අපි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් එක මේකට අපි කවුරුවත් වග කියන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට වගකියන්න ඕන මැදිහත් වුණ පුද්ගලයෝ. අපි නෙමෙයි වගකියන්න ඕන. අපිට වෙලා තියෙන්නේ පාඩුවක් විතරයි මේකෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරිද දැන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව පහත සංශෝධනයට යටත්ව සිදු කරන්නේ.

සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්.) සමාගම මඟින් බැකෝ යන්ත්‍රයේ එන්ජිම දෙවරක් අළුත්වැඩියාවට ලක් කිරීම නිසා සභාවට හානියක් සිදු වී ඇති බැවින් ඒ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කිරීම.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 25.** ප්‍රාදේශීය සභාව සතු සියලුම රථවල ''බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව'' යන්න පැහැදිලිව පෙනෙන ආකාරයෙන් සඳහන් කිරීම සහ පළාත් පාලන චක්‍රලේඛ අංක 1993/13 අනුව ක්‍රියාකරමින් ඉදිරි සෑම සභාවකටම වාර්තාවක් ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

2018 අප්‍රේල් 24 සභාපතිතුමා වෙත යොමු කරන ලද යෝජනාවල මෙම යෝජනාව පැහැදිලිව ඉදිරිපත් කොට ඇති අතර, සභා සම්මත විය. මේ වන තෙක් සභාව විසින් පැහැදිලි විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කොට නැත. එය තදබල දූෂණයට ඉඩසලසන ක්‍රියාවකි. එම වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

(ඉහත යෝජනාව 2018 අප්‍රේල් 24 ඉදිරිපත් කරන ලද්දේ මහජන නියෝජිතයන් එකොළොස් දෙනෙකුගේ අත්සනින් යුතුව බවද, සඳහන් කරනු කැමැත්තෙමි.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ නම ගහලනේ තියෙන්නේ. මොන වාහනයේද ගහල නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කැබ් එකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැබ් එකේ ඉස්සරහ බෝඩ් එක තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගලවන්න පුලුවන් බෝඩ් එකක්නේ ඒ තියෙන්නේ. වෙන කැබ්වල ගහල තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන කැබ් වලද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දකුණු පළාතේ තියෙන හැම කැබ් එකකම ගහලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොද ගහලා තියෙන්නේ මට පෙන්වන්න. පළාත් සභාවේ කැබ්වල ගහලා තියෙනවා. ප්‍රාදේශීය සභාවේ කැබ්වල ගහලා නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එහෙම ගහන්න අවශ්‍ය නෑ. මම නම් කියන්නේ සභාපතිතුමාගේ කැබ් එකට ඒ බෝඩ් එක ප්‍රමාණවත් කියලා. ඒ ඉදිරියෙන් තියෙන බෝඩ් එක ප්‍රමාණවත් සභාපතිතුමාගේ කැබ් එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අබේසේකර මන්ත්‍රීතුමාට මොකක්ද තියෙන ප්‍රශ්නය. මම පාවිච්චි කරන වාහනය ගැන ඔබතුමාට තියෙන ප්‍රශ්නය මොකක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම ගැහුවා කියලා මොකද වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මම ගහන්නේ නෑ. ඔබතුමා කරන්න පුළුවන් දෙයක් කරන්න. මම ගහන්නේ නෑ ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා චණ්ඩියෙක් වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ වාහනය පාවිච්චි කරන විදිය මම දන්නේ. ඔබතුමාට ඒක අදාළ නෑ. කැබ් එකේ ඉස්සරහ බෝඩ් එකක් තියෙනවා. මම අවශ්‍ය වෙලාවට ගහනවා. මට ඕන නැති වෙලාවට ගලවනවා. ඒක මගේ අයිතිය. ඔබතුමාට ඒක නැති කරන්න බෑ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකත් චක්‍රලේඛනයේ තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන චක්‍රලේඛනයේ තිබුණත් මම කරන්නේ මට ඕන විදියට මම පාවිච්චි කරන කැබ් එක සම්බන්ධව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගහන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපති කියලා බෝඩ් එකක් තියෙනවා ඉස්සරහ වීදුරුව යට. ඒක මට ඕන වෙලාවට තියනවා. ඕන නැති වෙලාවට ගලවනවා. ඒක නිල වාහනයට අදාළ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නිල වාහනයට අදාළ නැත්තේ කොහේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ඔබතුමා මට කියන්න දිසාපතිතුමාගේ කැබ් එකේ ගහල තියෙනවද, ප්‍රධාන ලේකම්තුමාගේ එකේ කැබ් එකේ ගහලා තියෙනවද, කිසි කෙනෙකුගේ නිල රථයේ ගහලා නෑ. ඔබතුමා නිකන් කුහක යෝජනා ඉදිරිපත් කරන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මතක තියා ගන්න කුහකකමට ඉදිරිපත් කරනවානම් අද නෙමෙයි මේක ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න අනිත් වාහන නොගහපු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගහලා තියෙනවානම් ප්‍රශ්නයක් නෑ. මම ඒවා ඊළඟට ගන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒක ගෙනාවේ මේකට නෙමෙයි. ඔබතුමා ගෙනාපු එකත් මම කියන්නම්. ඔබතුමා ඒක ගෙනාවේ අනිත් වාහනයට. උප සභාපතිතුමා ඉඳලා හිටලා ඒ වාහනය පාවිච්චි කරනවා. මම ඒක විවෘතව කියනවා. උප සභාපතිතුමාගේ කකුල අමාරුයි ඔබතුමා දන්නවා. නඩුවට යනකොට මම කැබ් එක ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හෙන ගහන කතා කියන්න එපා. මම ගෙනාවේ ඔබතුමාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙරිගුඩ්. එහෙමනම් ඒක කියන්න ඕන. එහෙම දෙයක් කිවුවේ නෑනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි මෙච්චරකල් බලාගෙන හිටියා. ඔබතුමා අරහේ යනවද මෙහේ යනවද අපි බැලුවේ නෑ. එකක් තියෙනවා. බොහොම පැහැදිලිවම ඔබතුමා මේ සභාවේ මන්ත්‍රීවරුන්ට සලකන විදියට, මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට සලකන විදියට අපිත් හිතනවා ඔබතුමාට අයිති නැති ඒ කෙරිල්ල නතර කරන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි පුළුවන්නම් නතර කරන්නකෝ. මට අනුමත ලීටර් 500 ට වැඩිය මම ගිහිල්ලා නෑ. මම රජයට ගාස්තුවක් ගෙවනවා. මෙතෙක් කිසිම සභාපතිවරයෙක් නොකරපු රජයට ගාස්තුවක් මම ගෙවනවා මාසිකව. මට මළගෙදරකට යනකොට, මගුල් ගෙදරකට යනකොට ත්‍රීවිල් හයර් කරගෙන යන්න බෑ. ඒක සභාපතිවරයාට තියෙන බලතල. ඔබතුමා ඒක මට උගන්වන්න එන්න එපා මන්ත්‍රීතුමා. ඔබතුමාට කරන්න පුළුවන් දෙයක් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දෙයියන්ට කියන්න යන්න පුළුවන්. මගුල් ගෙවල්වල යන්න පුලුවන්. ඕන තැනක යන්න පුළුවන්. ඒකේ ප්‍රශ්නයක් නෑ. දෙයි හාමුදුරුවන්ට කියන්න කතරගම යන්න ඕන වුනොත්, මගුල් ගෙදරක් වෙලා යන්න ඕන වුණොත් යන්න බැරිනම් වැඩක් තියෙනවාද සභාවේ වාහනෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුරාධපුරේ, පොලොන්නරුවෙත් ගියා ඒ කැබ් වල. ඒකේදි මට මගේ කැබ් එක භාවිතා කරන විදිය ඔබතුමා කියන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා පෞද්ගලික විදියට ගහන්න යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි බළලා මල්ලෙන් එලියට පැන්නා ලස්සනට. ඔබතුමා ඕක ගෙනාවේ, මම දැනුත් කියන්නේ උප සභාපතිතුමා භාවිතා කරනවට. මම දැනුත් කියනවා ඒක. ඔබතුමා මට නෙමෙයි ගෙනාවේ. වෙන කරන්න දෙයක් නැතුව එහෙම ප්‍රකාශ කරනවා. ඔබතුමා ගෙනාවේ උප සභාපතිතුමා ඉඳලා හිටලා කැබ් එක පාවිච්චි කරනවාට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** උප සභාපතිතුමාට ඉඳලා හිටලා හරි ඒ කැබ් එක ලබා දීම සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගන්න තියෙන අමාරුව කොච්චරද කියලා අපි දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන ඔබතුමා තැනින් තැන විවේචන කරපු එකත් මම දන්නවා. කොහොමද උප සභාපතිතුමාට වාහනය දෙන්නේ කියලා විවේචනය කරපු එකත් දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව කියනවා. බල්ලොන්ට ජාතක වැඩ මම කරන්නේ නෑ. මම එහෙම කරලා තියෙනවානම් අද යන්න හම්බ වෙන්න එපා. හෙන ගහන්න ඕන. මම කවදාවත් කතා කරලා නෑ. මම ඒකට නෙමෙයි තමුන්නාන්සේටවත් කතා කරලා නෑ. දැන් තමයි කියන්නේ. මම බොහොම පැහැදිලිව මේ මට්ටමට ගියේ ඊයේ පෙරේදා. මොකද ඔබතුමා කරන කියන දේවල් අපි දන්නවා. මේ මන්ත්‍රීවරුන් ගැන, අපිට තියෙන සැලකිල්ල ගැන දන්නවා. අපි බොහොම පැහැදිලිව කියලා තියෙනවා මේ සභාව ගෙනියමු, එක්කාසුවෙලා වැඩ කරමු කියලා. ඒවා කියලා තියෙන්නේ හැංගි හොරා නෙමෙයි. අපි මේ සභාවේ ඉන්න බොහෝ මන්ත්‍රීවරුන්ට කියලා තියෙනවා. නමුත් ඔබතුමා කවදාවත් ඒක කරේ නෑ. ඒ සියලු අයුතු වැඩ කරමින් තමයි ඒ දේවල් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොනවද කරපු අයුතු වැඩ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ දේවල් ආයේ ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ කැබ් එක පාවිච්චි කිරීම අයුතු වැඩක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ. අයුතු දේවල් වලට පාවිච්චි කිරීමයි වැරදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයුතු දේවල් වලට කොයි වේලාවකවත් පාවිච්චි කරලා නෑ. මාව දකිනවා ඇති සමහර මන්ත්‍රීවරු දරුවාව ඉස්කෝලෙන් ගේන්න පවා මෝටර් සයිකලයෙන් ගිහින් ඉන්නවා. සමහරු දැකලා ඇති.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි දන්නවා. අපි කියන්න ගියේ නෑ. මේ කියපු හින්දා කියන්නම්. අපි දන්නවා. යසරත්න මන්ත්‍රීතුමාගේ කඩේ ළඟ ඉන්න කොට අරහෙට ළමයි එක්ක ගිහින් එනවා. මෙහෙට එනවා. අපි කවදාවත් මෙච්චර කල් ඒවා කිව්වේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රදේශය තුළ මම යනවා. යසරත්න මන්ත්‍රීතුමාගේ කඩේ කොතනද, මගේ බල ප්‍රදේශය තුළ මට යන්න බැරි කමක් නැනේ.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එපා කිව්වේ නෑ. නැහැයි කියලා කියපු නිසා කිව්වේ.

**26.** රජයේ සංවර්ධන වැඩපිළිවෙල කඩා කප්පල් කිරීමේ පරමාර්ථයෙන් මාර්ග සංවර්ධනය සඳහා ගම්පෙරළිය සහ මන්ත්‍රී ප්‍රතිපාදන වෙන් කරන ලද මාර්ග සඳහා ප්‍රීමික්ස් සහා අනුමැතියකින් තොරව යෙදීම නතර කරන ලෙස යෝජනා කරමි.

ඒ පිළිබඳව මම ඉදිරිපත් කරා කරුණු කාරණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු කාරණා වැරදියිනේ මන්ත්‍රිතුමා. ඔබතුමා ඒ කියපු කාරණා වැරදියි කියලා ඔප්පු වුනානේ. ඔබතුමා කියපු පාරේ නෙමෙයි වෙන පාරක තමයි ප්‍රීමික්ස් දාලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම වෙන කට්ටිය වගේ පටලවන්න හදන හදන පාරට කිය කිය යන්නේ නෑ. දැන් හරි ඒක. මම වැරදියි. නමුත් දැන් මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ ප්‍රීමික්ස් දානවානම් පාරවල් වලට සභාව පොඩ්ඩක් දැනුවත් කරන්න. මොකද අපි මුදල් ගේනවා කොහෙන් හරි. අපිට සභාවේ මුදල් දෙන්නේ නෑ නේ. ප්‍රතිපාදන දෙන්නේ නෑ නේ. ඒ නිසා අපිව දැනුවත් කරන්න. දැන් දාලා තිබුණනේ සුගත් මන්ත්‍රීතුමා මේ පාර

ප්‍රීමික්ස් කරලා දෙන්න කියලා. එහෙම යෝජනා දැම්මම අපි දන්නවා ඒ පාරට අපි මුදල් යොදවන්න ඕන නෑ කියලා.

**27.** ඉතා හදිසි අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකමින් නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, පතල් හා භූ විද්‍යා යන ආයතනවල නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මන්ත්‍රී මණ්ඩලය සමඟ සාකච්ඡාවක් සඳහා දිනයක් නියම කරගන්නා මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගැන මම කියන්න ඕන. මේ සභාවට ගෙනාපු යෝජනා තොගයක් කියන්නම්. එකක්වත් එහෙම කෙරිලා නෑ. මොකක්වත් ඕන නෑ. උදාහරණයකට කිවුවොත් මේ මෑතම වතුර පිළිබඳව අපි තීන්දුවකුත් ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් අපි කමිටුවකුත් හදලා කැඳෙව්වා. දෙවැනි පාර කවුරුවත් ආවේ නෑනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ කට්ටිය කැඳවන්න ඕන නිලධාරීන් එක්ක. මේ අය දරුණු ගණයේ වැරදි තොගයක් කරනවා. සභාපතිතුමත් දන්නවා. ඔබතුමාම මට යෝජනා කරලා තියෙනවා රොස්වුඩ් එකේ ඒ තොරතුරු ටික ගෙන්න ගන්න කියලා නාගරික සංවර්ධන අධිකාරියෙන්. අද වෙනකන් ඒක කෙරිලා නෑ. ඒකට අපි කවුරුත් විරුද්ධයි. නමුත් ඒකට ක්‍රියාත්මක වෙන්න ඕන ඔබතුමා. වැඩපිළිවෙලක් තියෙනවානම් හරි. ඒක කෙරෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 28.** කපුහෙම්පල වෙන්දේසි කිරීමට යෝජිත ඉඩමේ බිම් කොටස් සඳහා ජලය නල ළිඳක් මගින් ලබා දීමට කටයුතු කර ඇත. එම නල ළිඳේ ජලය පරිභෝජනයට සුදුසු නොවන බවට වගකීමෙන් කරුණු ඉදිරිපත් කරන අතර, වහාම එම වතුර සාම්පලයක් අප මන්ත්‍රීවරු සහභාගිවන කමිටුවක් මඟින් ලබා ගැනීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

ඒකෙත් ඒ නල ළිඳ හදලා තියෙන්නේ පාරේ බොහොම පැහැදිලිවම. මොකද වෙන තැනක වතුර ගෙනිහින් දාලා තමයි ඒ සහතිකය ගත්තේ. මම බොහොම පැහැදිලිව වගකීමෙන් කියන්නේ. අනිත් එක සුදුසු තැන නෙමෙයි හදලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ ඒ තැන වෙනස් කරානේ. ඒක ගැන දැනුවත්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගැන දන්නේ නෑ. ඒක දැනුවත් කරන්න ඕන නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා හැමදේම දන්නවා ඒක දන්නේ නෑ. තැන වෙනස් කරා. පාර අයිනේ තිබුණ එකට අපි අනුමැතිය ලබා දුන්නේ නෑ. ඒ නිසා තැන වෙනස් කරා. ටැංකියත් මාරු කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ යෝජනාව ස්ථිර වුනාද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔක්කොම එකට ස්ථිර කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 29.** පලාගල කන්ද ජනතාවට පානීය ජල ප්‍රශ්නයක් පවතින බැවින් පලාගල කන්ද පහළ ළිඳ සිට කඳු මුදුනේ ටැංකියක් නංවා ජලය ලබා දීම සඳහා කඩිනමින් ඇස්තමේන්තුවක් ලබා දෙන මෙන් යෝජනා කරමි.

මෙන්න මේකට අපි ඉල්ලන්නේ ඇස්තමේන්තුවක් හදලා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජල සම්පාදන මණ්ඩලයෙන් ඒකට ටැංකියක් හදනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 30.** රටට ආදර්ශයක් වශයෙන් අප සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ මහජනතාවට දැක ගත හැකි සේ අප සභාවේ නමින් වෙබ් අඩවියක් නිර්මාණය කොට එහි ප්‍රදර්ශනය කිරීමට යෝජනා කරමි.

අපේ දැන් හැමෝගෙම ප්‍රශ්නයක් තියෙනවා. මම හිතන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තොගයක් වෙබ්සයිට් එකට දාලා තියෙනවා වත්කම් බැරකම් ප්‍රකාශ. මම හිතන්නේ අපිත් බොහොම නිහතමානීව ඒක කළ යුතුයි. අපිට වත්කම් බැරකම් පෝරම ලබා දීමට කටයුතු කරන්න කියලා ඉල්ලනවා. ගිය අවුරුද්දේ දීපු එක පුරවලා භාර දුන්නා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වත්කම් වැඩිවෙලා නෑ. වත්කම් අඩුවෙලා තියෙන්නේ දැන්.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 31.** අපේගම තරංග මාවත දකුණු පස පැති කාණු පද්ධතිය ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 32.** ආනන්ද මාවත ප්‍රභාත් බුක් ෂොප් අසල පලාගල කන්ද මාර්ගය ආරම්භක ස්ථානයට අඩි 12 ක් දිගට සිලින්ඩර යොදා කාණුව සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි තියෙන්නේ ශෝක යෝජනාවක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ඒක නිසා ඒ සඳහා මම අවසර ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වේලාසනින් කිව්වා නම් උදෙන්ම කරන්න තිබුණානේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මගේ යෝජනා වලදී තියෙන්නේ මන්ත්‍රීතුමා.

**33.** දිවංගත හිටපු අමාත්‍ය ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමාගේ ආදරණීය බිරිඳ සහ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ මෑණියන් වූ විජිතා පතිරගේ මැතිණියගේ අභාවය වෙනුවෙන් අප සභාවේ ශෝකය ප්‍රකාශ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීවරියනි, මාධ්‍යවේදී මහත්වරුනි, මහත්වරියනි,

දිවංගත අමාත්‍ය ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමාගේ ආදරණීය බිරිඳ සහ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ඇතුළු දියණිවරුන් දෙදෙනෙකුගේ ආදරණීය මෑණියන් වූ විශ්‍රාමික ගුරු විදුහල් කථිකාචාරිනි විජිතා පතිරගේ මැතිණියගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කරනුයේ ඉමහත් ගෞරවයෙනි.

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය, ඕමත්ත නම් වූ ගම්මානයේදී වර්ෂ 1937 ක් වූ ජනවාරි මස 23 වන දින ජන්මලාභය ලැබූ විජිතා පතිරගේ මහත්මිය සහෝදර සහෝදරියන් පස් දෙනෙකුගෙන් යුතු පවුලේ වැඩිමහල් දියණිය වූවාය. කාලයාගේ ඇවෑමෙන් පාසල් අධ්‍යාපනයට යොමු වූ ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධියක් හිමිකර ගත්තාය. පාසල් ගුරුවරියක ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසි එතුමිය ගම්බද පාසල්වල සුවහසක් දූවා දරුවන්ට අධ්‍යාපනය ලබා දෙමින් සිටියදී ඩී. පී. රිචඩ් නම් වූ පාසල් ගුරු මහතෙකු සමග විවාහ වී කපුහෙම්පල හා කිතුලම්පිටිය යන ප්‍රදේශවල ජීවත් වෙමින් ඉරෝෂ්, රමේෂ්, දිනූෂා නම් වූ දරුවන් තිදෙනෙකු රටට දායාද කළාය.

වර්ෂ 1983 දී මෙරට ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි තම ආදරණීය ස්වාමිපුරුෂයා වූ රිචඩ් පතිරණ මැතිතුමාගේ දේශපාලන කටයුතු වලදී එතුමාට අනුපමේය සහයෝගයක් ලබා දුන්නාය. ගරු රිචඩ් පතිරණ ඇමතිතුමා පසු කලෙක විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය, සභානායක දක්ෂිණ සංවර්ධන අමාත්‍ය වැනි ධූරයන් හොබවමින් ප්‍රායෝගික නායකයෙකු ලෙස ඉතා අවිවේකි ජීවිතයක් ගත කළේය. ස්වාමියාගේ මහජන සේවය තේරුම්ගත් විජිතා පතිරගේ මැතිණිය ඒ සඳහා තම සහයෝගය සහ කැපකිරීම මැනවින් ලබා දෙමින් පැසසිය යුතු නිහඬ සේවයක් ඉටු කළාය. කාර්යය බහුලත්වය කොතරම් තිබුණද වැඩි දුර අධ්‍යාපන කටයුතු වලින් ජයග්‍රාහණය ලැබූ ඇය ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරියක් බවට පත්ව පුහුණුවන ගුරු බවතුන් හට දැනුම ලබා දුන්නාය. නිල නිවාස, නිල රථ, වරප්‍රසාද, නිල බලය කිසිවිට භාවිතා නොකළ විජිතා පතිරගේ මැතිණිය අද සමහර දේශපාලන නායකයින්ගේ භාර්යාවන්ට මනා පූර්වාදර්ශයක් විය යුතුය. එතුමිය කිසි විටෙකත් උඩගු නොවූවාය. තමාට ආවේණික වූ ආගමික හා සරල ජීවිතය සැහැල්ලුවෙන් ගත කළාය.

මව් පදවිය සියල්ලටම වඩා උතුම් කොට සැලකූ එතුමිය දරුවන් තිදෙනාට අසීමිතව ආදරය කළ අතර, එකම පුතණුවන් වෛද්‍යවරයෙකු බවට පත් කිරීමටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මහජන සේවයට යොමු කරලීමටත් ඇය වාසනාවන්ත වූවාය. ඇමති බිරිඳක, පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකුගේ මවක වශයෙන් ඇය ඉටු කළ කාර්යය කොතරම් බරපතල විය හැකිදැයි ඔබට තේරුම් ගත හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි. ගරු රිචඩ් පතිරණ මැතිතුමාත්, ගරු රමේෂ් පතිරණ මැතිතුමාත් ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට මහජන සේවකයන් ලෙස ඉටු කරනු ලැබූ මහජන සේවයට යම් දායකත්වයක් විජිතා පතිරගේ මැතිණියටත් හිමි විය යුතුය. එබැවින් අප සියලු දෙනාම මහජන නියෝජිතයන් වශයෙන් එතුමිය සිහිපත් කළ යුතුය. අප ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ජීවත්ව සිටි පළවෙනි ප්‍රභුවරිය වශයෙන් එතුමියගේ අභාවය වෙනුවෙන් අප සභාවේ ශෝකය ප්‍රකාශ කිරීම යුතුකමක් කොට සලකමි. දේශයේ පිනට උපන් මහජනතාවට මහත් වූ සේවයක් ඉටු කළ ජීවිතයේ සැබෑ යථාර්ථය තේරුම්ගත් එතුමියට අපි සදා ණය ගැති වෙමු.

දහසක් ගුරුනට දැනුම බෙදා දී - දහසක් සිසුනගේ නෙත පෑදූ

නායකයන් පිටුපස සිට ගනිමින් - ඔවුනට නිරතුරු මඟ සෑදූ

සඳමඩලට ළං වූ බ්‍රහස්පතිය නුඹ - ජනහඳ තුළ පිවිතුරු ගුණ රැන්දූ

මැතිණියනි ඔබ නිවනට යොමු වේවා - අපේ අමා මෑණියන් සත හට පැවසූ

සියලු දෙනාටම ඉතාමත් ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- මම හිතන්නේ අපි සියලු දෙනාම ඒ යෝජනාවට පක්ෂයි. විජිතා පතිරගේ මහත්මිය කියන්නේ ඇත්තටම ආදර්ශමත් දේශපාලඥයෙකුගේ බිරිඳක්. මම එහෙම කියන්නේ වෙන දෙයක් හින්දා නෙමෙයි. බොහෝ දේශපාලඥයන් විනාශ වෙලා ගිහින් තියෙන්නේ වෙන කිසි දෙයක් හින්දා නෙමෙයි. බිරින්දෑවරු හා ළමයින්ගෙන්. නමුත් ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා වාසනාවන්ත වුණා විජිතා පතිරගේ වගේ බොහොම නිහතමානි, නිරහංකාර කාන්තාවක් හා විවාහ වෙන්න. ඇත්තටම එතුමිය සමාන කරොත් කිසිම වැරැද්දක් නෑ ආර්යාව කියලා. මම උප්පත්තිගත යූ.එන්.පී. කාරයෙක් නොවුනට අනුහස් නායකයෙක් වෙච්ච ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාට හිටියා කාටවත් වචනයක් කියන්න බැරි හොඳ ආර්යාවක්. ඉතිං මම හිතනවා ඒක දේශපාලන භේදයකින් තොරව පිළිගන්න ඇති. මේ අවස්ථාවේදී ඇත්තටම එතුමියට අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා යෝජනා කළා වගේම අපි බෞද්ධාගම්කාරයෝ හැටියට අමා මහ නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 34.** 1991 වසරේ සිට ප්‍රාදේශීය සභාව මදුරු තෙල් ඉසීම කරගෙන ගියද, එම කාර්යය දැනට නැවතී ඇත. මේ නිසා ඩෙංගු උවදුර හා වෙනත් මදුරු උවදුරු වැඩි වී ඇත. එම නිසා නැවත මදුරු තෙල් ඉසීමේ වැඩපිළිවෙලක් සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 1991 වසරේ සභාව ආරම්භ කරේ. ඒ ආරම්භ කරන කාලයේදී මදුරු තෙල් ඉසීම මේ ප්‍රදේශයේ සිද්ධ වුනා. ඒ ගැනත් කියනවානම් වැඩි විස්තර අවශ්‍ය නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන සුගත් මන්ත්‍රීතුමා අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා එක්ක සාකච්ඡා කරලා වැඩපිළිවෙලක් හදන්නම්. දැනට මදුරු තෙල් ඉසින්නේ නැති වුනාට ධූමායනය යම් කොටසක් කෙරෙනවා. මදුරු තෙල් ඉසීම තාවකාලික පිළියමක් විදියට තමයි පිළිගන්නේ. මදුරු තෙල් ඉස්සම හිතන්නේ ඒ වැඩේ ඉවරයි කියලා. නමුත් ඒක වෙනත් ව්‍යසනයකට මුල් වෙනවා කියලා තමයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ අදහස. ඒ හින්දා ඊට වැඩිය පිළිගත් විධිමත් ක්‍රමයක් තමයි සැකසෙන්න ඕන. ඒක ගැන ඔබතුමාගේ අදහස හොඳයි. ඒක ගැන අපි යම් වැඩපිළිවෙලක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා එක්ක සාකච්ඡා කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කෙසේ හෝ මේ ප්‍රදේශයේ තියෙන මදුරු උවදුර නැති වෙන්න ඕන. ඒක තමයි මහජනතාවගේ අවශ්‍යතාවය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ ඔබතුමාගේ කොට්ඨාශයේ ඇලබඩ ප්‍රදේශය ධූමායන කටයුතු සිදු කරා. වැඩිපුර ඩෙංගු රෝගීන් වාර්තා වෙන ප්‍රදේශ තියෙනවානම් අපිව දැනුවත් කරන්න. අපිට පුලුවන් ධූමායන කටයුතු සිදු කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අද උදෙත් ඒ ප්‍රදේශයට ගියා මම ඇලබඩ ජිනරතනාරාම පන්සලේ සෝමරතන හාමුදුරුවන්ගේ ඉල්ලීමක් තියෙනවා නැවත වතාවක් මේ ප්‍රදේශයට ධූමායන කටයුත්ත ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 35.** පියදිගම සිට ඇලබඩ දක්වා පාර ප්‍රීමික්ස් යොදා සකස් කර දෙන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ පාරට අපි මුලින් දවසක් හෝ දෙකක් ප්‍රීමික්ස් යෙදුවා. නමුත් බොහොම අඩු ප්‍රමාණයක් ආවේ. ඒක ප්‍රමාණවත් වුනේ නෑ. මම මෙහෙම කියන්න හේතුව මොකද නම් කරලම යෝජනාවක් විදියට ගෙනාවේ මේ පාර හදන්න ගියොත් ලොකු වියදමක් යනවා. නමුත් දැනට තියෙන තත්ත්වය අනුව ප්‍රීමික්ස් යොදා ප්‍රතිසංස්කරණය කර ගත්තොත් අපිට තව වැඩි කාලයක් මේ පාර පාවිච්චි කරන්න පුළුවන්. ඒ නිසා ඉතා ඉක්මනින් ඒ පාර සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මම දන්නේ නෑ අනිත් මන්ත්‍රීවරුන්ට කෙසේ වුනාද කියන එක. මටත් අඩුම ප්‍රීමික්ස් ප්‍රමාණයක් තමයි ආවේ. කුමන හේතුවක් නිසාද කියලා මම දන්නේ නෑ. ඒ නිසා මගේ වැලිපිටිමෝදර කොට්ඨාශයට තියෙන අවශ්‍යතාවය ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාරේ කොටසක් ප්‍රීමික්ස් කරා නේද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කොටසක් ප්‍රීමික්ස් කරා. දිනූෂ මහත්තයා දන්නවා ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඉක්මනට කරලා දෙන්න සුගත් මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම තමයි සභාපතිතුමා කොට්ඨාශ දොළහටම අත්‍යාවශ්‍ය ප්‍රමාණයට, බෙදිලා යන විදියට ඒ කටයුත්ත කරන්න ඕන. ඒක නොකෙරුනොත් මම හිතන්නේ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔබතුමාගේ ඒ පාර දෙකට බෙදෙන ප්‍රශ්නයක් තියෙනවා. එක පැත්තක් කෙරුණනේ. ඔබතුමා දැන් කියන්නේ ඒ පාරේ අනිත් පැත්ත. කොට්ඨාශ 12 සඳහා මුල් වටය ක්‍රියාත්මක වුනා. දෙවැනි වටය දැන් පටන් අරගෙන උප සභාපතිතුමාගේ අවස්ථාව දැන් තියෙන්නේ. ඒ අනුව ඉදිරියේදී ඔබතුමාට ලැබේවි. මම වුණත් තාම එක පාරයි කරේ. පටන් ගත්තේ පෝද්දල පැත්තෙන්. චමින්ද මන්ත්‍රීතුමාගෙන් පටන් ගත්තේ. මේ සැරෙත් චමින්ද මන්ත්‍රීතුමාගෙන් පටන් ගත්තා. ඒ පැත්ත ඒ පිළිවෙලට කරගෙන එනවා. ඔක්කොටම එක පාරයි කෙරුණේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 36.** මා නියෝජනය කරන වැලිපිටිමෝදර කොට්ඨාශය සඳහා වීථි ලාම්පු සවි කිරීමට මසකට දින දෙකක් වෙන්කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ කොට්ඨාශයට අපි වැඩ කරන්න ඕන නේ. දැන් මට තියෙන ප්‍රශ්නය මගේ කොට්ඨාශයට වීථි ලාම්පු සවිකරන්න මාස දෙකකින් විතර හම්බ වුනේ නෑ. ලොකු අඩුපාඩුවක් තියෙනවා. සභාපතිතුමාටත් ඒක කියනවා ඇති. ලේකම්තුමාටත් ඒක දැනුම් දෙනවා ඇති ප්‍රදේශයේ ජනතාව. දුරකථනයෙන් කතා කරලා කියනවා, සභාවට ඇවිත් පොතේ ලියලා යනවා, දැඩි ඉල්ලීමක් තියෙනවා. ඉල්ලන හින්දනේ දෙන්න බලන්නේ අපි. ඉල්ලුමට සැපයුම. එහෙමනේ සාමාන්‍යයෙන් වෙන්නේ. ඒක හින්දා අපි ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. මට මේක පැහැදිලි නෑ. අලුත් ලයිට් සෙට්ද, රෙපෙයාර් ගැන ද මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** රෙපෙයාර් ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට රෙපෙයාර් සඳහා මාසෙට දවස් දෙකක් නෙමෙයි දවස් පහක් වුනත් ලබා දෙන්න පුළුවන්. ඒක ඕන තරම් ලබා දෙන්න පුළුවන්. අදත් මම කිවුවේ පොතේ ලියලා තියෙන රෙපෙයාර් ටික හදන්න කියලා. වාසනා මන්ත්‍රීතුමියත් එකක් කිවුවා.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** වාහනය හම්බ වුනාට වැඩක් නෑ. දාන්න ස්විච් නැතිලු. එහෙම වාහනේ හම්බ වෙලා වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ අඩුපාඩුවක් තියෙනවා. වර්තමානයේ අපේ මූල්‍යමය හිඟතාවය උඩ පොඩි අපහසුතාවයක් තියෙනවා. බැහැයි කියන්න බෑ. නමුත් බ්‍රහස්පතින්දා වගේ වෙනකොට ඒ සියලු උපාංග ලැබේවි. සිකුරාදා ඉඳගෙන වැඩ කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මේක තේරුම් බේරුම් කරගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් කාරණාවක් තියෙනවා. ඒකත් පැහැදිලි කරන්න ඕන. අපි එක එක ආයතන වලින් තමයි අවශ්‍ය භාණ්ඩ මිලදි ගන්නේ. වයර් වල මිල අඩු කොහේද අපි එතනින් මිලදී ගන්නවා. එතන මම දකින අඩුපාඩුවක් තියෙනවා. නමුත් විනිවිදභාවයෙන් මේක කරන්න ඕන හින්දා මිල ගණන් කැඳවලා වයර් මිල අඩු කොතනින්ද, වයර් ටික මිලදී ගන්නේ එතනින්. බල්බ් එක මිලදී ගන්නේ තව තැනකින්. ස්විච් ටික මිලදී ගන්නේ තවත් තැනකින්. ඒ මේක විනිවිදභාවයෙන් යන්න ඕන හින්දා. එහෙම අර්බුදයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කාරණය අපිට පැහැදිලිව තේරෙනවා. දවස් පහක් දුන්නට වැඩක් නෑ එහෙම. දවස් දෙකක් දෙන්න හරියට නම් කරලා. දැන් අමුතු ක්‍රමයක් පුරුදුවෙලා තියෙන්නේ. අපි ගිහින් ලයිට් එක හදන්න ඕන තැන පෙන්වන්න ඕන. ජනතාව පුරුදු වෙලා ඉන්නවා අපිට කියන්න. අන්න අතන ලයිට් එක වැඩ කරන්නේ නෑ කියනවා. අපිට දිනයක් ලබා දෙන්න පුළුවන්නම් හොඳයි. මම කියන්න යන්නේ වෙන මුකුත් නෙමෙයි. අපිට දිනය දැනුවත් කරාම ඒ ප්‍රදේශයේ ජනතාවට කියන්න පුළුවන් මෙන්න මෙදාට ලයිට් හදන්න එනවා එදාට ගිහින් සවිකර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිශ්චිත දිනයක් ලබාදීමේ අපහසුතාවයක් තියෙනවා සුගත් මන්ත්‍රීතුමා. සමහර වෙලාවට බැනර් කපන්න දානවා. කරන්න පුළුවන් අනෙත් කටයුතුත් ඒ වාහනයෙන් කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දිනයක් දා ගන්න අඩුගානේ. එතකොට රස්තියාදුවක් ඇති වෙන්නේ නෑ. අද අපේ වැඩ කරන සේවක මහත්වරු අතින් සමහර වෙලාවට සවිකිරීම අතපසු වෙනවා. ඒ අතපසු වෙන එකට හේතුව තමයි අපි හරියට තැන කියන්නේ නෑ. ඊට පස්සේ එයාලා තැන දන්නේ නෑ කියලා කියනවා. සම්බන්ධීකරණයේ ගැටලුවක් තමයි තියෙන්නේ. මාසෙට දින

දෙකක් ලබා දෙන්නම්. කොට්ඨාශ 12 ට මාසෙට දින 24 යි එතකොට. දින දෙකක් අපිට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නම් කිරීමේ ගැටළුවක් තියෙනවා. මාසෙට දවස් දෙකක් දෙන්නම් පාර සුද්ධ කරන්න යන දවසටම දෙන්නම්කෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි. කොට්ඨාශයේ ලයිට් හයි කරන්න නැත්නම් අල්ලපු කොට්ඨාශය කුරුඳුවත්ත. ඒකට යන්න පුළුවන්. එහෙම නැත්නම් වක්වැල්ල කොට්ඨාශයට යන්න පුළුවන්. මේ වැඩේ කරන්න. මේ වැඩේ කරොත් සභාවට එන බැනුම් ප්‍රමාණය ගොඩක් අඩුවෙයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සමහර ප්‍රදේශ වලට ලයිට් හදන්න ඇවිල්ලම නෑ. දින වෙන්කිරීමක් කරන්න මාසේ මුල ඉඳලා කොට්ඨාශ 12 ට. ඒ අතරතුර මොකක්හරි ප්‍රශ්නයක් වුනොත් කතාකරලා විසඳගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි යන්නේ. නමුත් සෙනසුරාදා, ඉරිදා අත ඇරෙනවානේ. මොන කොට්ඨාශ වලටද ඇවිල්ලා නැත්තේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගොඩකන්ද පැත්තට ඇවිල්ලම නෑ. කපුහෙම්පලට ආවේ නෑ ලයිට් වාහනය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩිපුරම කපුහෙම්පල තමයි ලයිට් වාහනය තියෙන්නේ. ගොඩක් වෙලාවට යනවා. අවශ්‍ය තැන කියන්න. සම්බන්ධීකරණයේ අඩුවක් තියෙන්නේ. උප සභාපතිතුමා මට කතා කරලා කියනවා මේ ලයිට් ටික පිච්චිලා කියලා. මම ලයිට් වාහනය යවනවා. ඔබතුමා මට කතාකරලා කියන්නේ නැනේ. ඒක පිළිවෙලක් නැතුව ගිහින් තමයි මේ ප්‍රශ්නය ඇති වුනේ. මේ අය ලයිට් හදන්න ගියාම කොට්ඨාශ මාරු කරලා හදන්නත් යනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම කියන්නෙත් ඒක තමයි. අපේ කොට්ඨාශ වලට දෙන්නකෝ. එතකොට ගිහින් අපිට මේ වැඩ හරියට කර ගන්න පුළුවන්. අපෙත් ප්‍රශ්න තියෙනවා. වෙනත් රාජකාරි වැඩ වලට අපි යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුළුවන් තරම් කම්කරුවෝ දෙන දවසට යොදවන්න බලන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට කොට්ඨාශයේ දිරපු ටියුබ් ලයිට් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ ටික මාරු කරන්න කිවුවා. තාම මාරු වුනේ නෑ. මාස 07 ක් 08 ක් තිස්සේ කියනවා. දිරලා තියෙන්නේ ඒවා. තාම ඒවාට අලුතෙන් ලයිට් සෙට් දාලා නෑ. ලයිට් හදන්න ගියහම CFL ලයිට් 10 ක් විතර සඳහන් කරලා ඇවිල්ලා තියෙනවා. ඒ අවට මිනිස්සු කරුවලේ ඉන්නේ. ඒ ටියුබ් ලයිට් ටික මාරු කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම වුනත් කරන්නේ එහෙමයි. රෙපෙයාර් කරන්න බැරි ඒවා අයින් කරලා අලුතෙන් ලයිට් සෙට් හයි කරනවා. වැලිපිටිමෝදර කොට්ඨාශයේ ඒක සිදු වෙලා තියෙනවා. අපේ ගොඩක් ලයිට් සවිකරන්න නෑ ඇත්තටම. ලයිට් හදන්න එන දවසට ලයිට් සෙට් 04 ක් විතර සවිකරාම අපිට ඇති. එතකොට දවස් 03 ක් 04 ක් සවිකරන කොට ඒ කාර්යය ඉවර වෙනවා. ඒක හදා ගත්තම අපිට ලේසියි. ගොඩක් ප්‍රශ්න වලින් මිදෙන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-  37.** ඇලබඩ සන්බීම් පාර්ක් හි ඇති ප්‍රාදේශීය සභාවට අයිති පහත් බිම් ප්‍රදේශය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා ඇත. මෙම ඉඩමේ ප්‍රජා ශාලාවක් සෑදීම සඳහා යෝජනා කරන අතර, සභා බල ප්‍රදේශයේ ඇති ඉවත් කරන ලද ගල්, වැලි සහ පස් යොදා ගොඩකරන ලෙසත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මේක කලින් සභාවලත් යෝජනා කරලා තියෙනවා. ඒ ඉඩම වෙනත් කාරණයකට භාවිතා කරන්න බෑ පහත් බිමක් නිසා. කඩා ඉවත් කරන ගල් කෑලි, ගඩොල් කෑලි තියෙනවානම් ඒක ගොඩකර ගන්න පසුබිමක් හදා ගන්න පුළුවන්. පස් දැම්මොත් විශාල පස් ප්‍රමාණයක් දාන්න තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුණු දාන්න බැරිද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කුණු දැම්මොත් වැඩේ අවුල් වෙනවා. අනිත් ඒවා දැම්මට කමක් නෑ. කුණු දැම්මොත් ගගත් එක්ක හොඳට හිටීවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 38.** මංගලිකා ගුණවර්ධන මහත්මියගේ පරගහ ඕවිට යන ඉඩම කැබලි කර, කැබලි 06 ක් පමණ විකුණා ඇත. මෙම ඉඩම විකිණීමේදී ප්‍රාදේශීය සභාවේ හෝ වෙනත් කිසිම ආයතනයක අවසරයක් ලබා ගෙන නොමැත. මෙම ප්‍රදේශ පවුල් 200 ක් පමණ භාවිතා කරන කාණු පද්ධතියක් සහිත ජල පෝෂක ප්‍රදේශයකි. මෙම විකිණු ඉඩම් කැබලි වැසි ජලයෙන් යටවෙන තත්ත්වයක් පවතී. තවත් ඉඩම් කැබලි කීපයක් විකිණීමට කටයුතු සූදානම් කොට ඇත. එම නිසා ඉඩම් කැබලි විකිණීමේදී ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත යුතු අනුමැතිය ලබා ගෙන විකිණීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අනවසර ඉඩම් වෙන්දේසියක් පිළිබඳව මම මේ සභාව දැනුවත් කරන්නේ. මේක අබේසේකර මන්ත්‍රීතුමත් දන්නවා ඇති. වටරැක පාලම ගාවින් යනකොට තියෙන ඉඩම මේ. මේ ඉඩම කැබලි කරලා කැබලි 06 ක් විතර දැනට විකුණලා තියෙනවා. අපිට ඉඩම විකුණ ගත්තට කමක් නෑ. අනුමැතිය අරගෙන විකුණ ගන්න කියන්න. මොකද මෙයා දෙයක් කිව්වට අහන කෙනෙක් නෙමෙයි. බොහොම අත්තනෝමතිකව, නීතියක් ගැන බලන්නේ නැතුව වැඩකරන්නේ. ඒක පරීක්ෂා කරන්න යන මන්ත්‍රීවරුන්ටත් දොස් කියනවා. ඒ වගේම නිලධාරීන්ටත් දොස් කියලා තියෙනවා. මම හිතන්නේ ඒ ප්‍රදේශයේ ජනතාව අමාරුවේ දාන වැඩපිළිවෙලක් යන්නේ. ඒ නිසා ඉඩම් විකිණීමේ නීතිය ගැන මෙයාට අවබෝධයක් ලබා දීලා මේ කාරණය කරාට කමක් නෑ. මෙම ඉඩමේ කිසිම ඉඩම් කැබැල්ලක් විකිණීමට නොහැකි බවට බෝඩ් එකක් දාන්න ඕන. බැනර් එකක් හරි දාන්න ඕන. ප්‍රාදේශීය සභාවේ අනුමැතිය නොමැතිව මෙම ඉඩම් කැබලි විකිණීමට නොහැක කියලා ප්‍රදර්ශනය කරන්න. ඒක මම විශේෂ යෝජනාවක් විදියට ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒවගේම තමයි සභාපතිතුමා වටරැක පාලම කිට්ටුව සෝමදාස මහතාගේ නිවස අසල බෝක්කුවක් තියෙනවා. මේ බෝක්කුව තිස්ස මන්ත්‍රීතුමාටත් අදාළයි. එතුමාගේ ප්‍රදේශයේ තමයි තියෙන්නේ මේ බෝක්කුව. ඒ මහත්තයා සෑම දිනකම ඒක මතක් කරනවා. ලියුමකුත් ලබා දුන්නා. ඒක පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරක්. ඒක සුද්ධ කරන්න පුළුවන් බෝක්කුවක්. ඒකේ මඩ ගතිය තියෙන්නේ. උදැල්ලක් දාලා මඩ ටික අදින්න පුලුවන්. අපේ ග්‍රාම නිලධාරිතුමාටත් මම ඒක පෙන්නුවා. ඒක එක්කෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට කියලා කරන්න ඕන. එහෙම නැත්නම් සභාවේ කවුරුහරි යොදවලා ඒ කාරණය ඉෂ්ට කරන්න ඕන. තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ තියෙන්නේ. ඒක මම යෝජනා කරනවා.

ඒ වගේම ප්‍රගතියට එන්න ඕන කාරණයක් තියෙනවා. අර මාර්ග අවහිරතා ඉවත් කිරීම සම්බන්ධව. බෝපෙ එගොඩ කනත්ත පාරේ. තාක්ෂණ නිලධාරිතුමිය දන්නවා ඒක. බම්පර් එකක් දාලා තියෙනවා. ඒක ඇත්තටම අපි කියන්නේ කාටත් සාධාරණයක් වෙන විදියට පරීක්ෂණය කරලා ඒක අවශ්‍ය විදියට කරන්න. අපි කියන්නේ නෑ ඒක කරන්න ඕන මෙහෙමයි කියලා. ඒක තාක්ෂණ නිලධාරියාගේ උපදෙස් පරිදි කරන්න කියලා සභාවට දැනුම් දෙනවා. පරීක්ෂණයක් කැඳවන්න කියලා ලියුම් දාලා තියෙනවා. එක්කො පරීක්ෂණය කරලා හරි සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පොඩි අවස්ථාවක් ලබා දෙන්න අවමංගල්‍ය ස්තුතියක් කරන්න තියෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ ආදරණීය පියාණන්ගේ වියෝවත් සමඟම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ඒ වගේම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් රෝහලටත්, නිවසටත් ඇවිත් මට සහයෝගය ලබා දුන්නා. මාගේ දුක නිවන්න කටයුතු කරා. ඒ වගේම හැකි පමණින් ශක්තිය ලබා

දුන්නා මූල්‍යමය වශයෙනුත්. සභාවක් විදියට ලේකම්තුමා, නිලධාරීන්, සේවක මහතුන් සියලු දෙනාම ලොකු සහයෝගයක් ලබා දුන්න. ඒක මට විශාල ශක්තියක් වුණා ඒ අවස්ථාවේ. ඒ නිසා සභාවේ සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය ඒ වගේම ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලයත් සේවක මහත්වරුන්ටත් මාගේ හදවතින්ම ස්තුතිය පුද කරනවා.

ඒ වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ, ඒකාබද්ධ විපක්ෂයේ අපේ ආසනයේ නායකතුමා, රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ශක්තියක් වුණා. එතුමාටත් මේ අවස්ථාවේදී මම ස්තුතිය හදවතින්ම පුද කරනවා. ඒ වගේම ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාත් සහයෝගය ලබා දුන්නා. අපේ නිවසේ ගොඩක් වෙලා රැඳී සිටිමින් මට ශක්තියක් වුනා. ඒවගේම මොහාන්ද සිල්වා මැතිතුමා, චානක මාදුගොඩ මැතිතුමා ඒ දේශපාලන අධිකාරියේ සියලු මන්ත්‍රීවරුන් සිහිපත් කරමින් මගේ සහ පවුලේ අයගේ ස්තුතිය පුද කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ගරු සභාපතිතුමා බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ පොලිතින් භාවිතය අවම කර ගැනීම කාලෝචිත ලොකු වැදගත් කාර්යයක්. ඉතාමත්ම විශාල ව්‍යසනයක් මේක. පසුගිය දවසක වීඩියෝ ක්ලිප් දාලා අපිට වැඩසටහනකුත් කරා. මම යෝජනා කරනවා සභාව දැනට සාකච්ඡාවට බඳුන් කරලා මේ සම්බන්ධව පරිසර නිලධාරීන් මැදිහත් කරගෙන චිත්‍රපටි වැඩසටහන් පවත්වන්න කොට්ඨාශයට එකක් වෙන්න හරි. දැනට සභා බලප්‍රදේශයට ඇතුල්වෙන තැන්වල ඉඳලා හන්දිවල ප්‍රධාන නාම පුවරු සවිකරන්න. පොලිතින් වලින් තොර කලාපයකට පිවිසෙනවා කියලා. ඒ දැනුවත් කිරීම කරමු. මහා විශාල ව්‍යසනයක් මේක. ඒක එකක්.

ඊළගට මම අහන්න කැමතියි ජල බවුසර් සඳහා අපි තැන්පත් මුදලක් තියලා තියෙනවද ජල සම්පාදන මණ්ඩලයට අපේ ඩඩ්ලි මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** එහෙමනම් මම යෝජනා කරනවා. මට මළ ගෙයක් වෙලා පසුගිය දිනවල ලැබුණ ඇත්දැකීම් එක්ක. ඒ මිනිස්සු දන්නේ නෑ මන්ත්‍රිවරුන්ට කියනවා ඕන දෙයක් කරන්න පුළුවන් පුද්ගලයෝ කියලා හිතලා. අපෙන් සහයෝගය ඉල්ලනවා. ඒ අවස්ථාවේ අපිට එන්න විදියකුත් නෑ. ඒ මිනිස්සුන්ට ව්‍යසනයක් වෙච්ච වෙලාවක්. අපි දුරකථන ඇමතුමක් ලබා දුන්නම සභාවට මුදල් බඳින්න කියන කාරණාව කිවුවම අපි අපහසුතාවයට පත් වෙනවා. එන්න කෙනෙක් නැති වෙන්න පුළුවන් අවස්ථා තියෙනවා. දින තුනක් හරි කල් දෙන්න. ඒ මන්ත්‍රීවරයා ඒ වගකීම ගන්නවා. ඒ ජල බවුසරය ලබා දෙන්න කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක කරන්න බෑ මන්ත්‍රීතුමා. ඒක කිරිමේ හැකියාවක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** මම හිතන්නේ සභා තීන්දුවක් හරි අරගෙන එහෙම දෙන්න පුළුවන්නම් හොඳයි. අපි මුදල් බැඳීම කරන්නම්. සභාවේ මුදල් ජල සම්පාදනයට බැඳලා තියෙන නිසා ජලය ලබා ගන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බෑ. මොකක්ද වගකීම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** මන්ත්‍රීවරයා ගෙව්වේ නැත්නම් ඒක දීමනාවෙන් හරි කපා ගන්න පුළුවන්නේ. අපි යෝජනාව සම්මත කරලා තියාගන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** වතුර බවුසරය ගන්න ඕන. කොළඹින් පිට ඉන්න අවස්ථාවක මන්ත්‍රීවරයෙකුට සභාවට එන්න බෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අන්තිමට මන්ත්‍රීතුමා කිවුවොත් මම කිවුවේ නෑ කියලා මම දන්නේ නෑ කියලා කොහොමද අය කර ගන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ඒ අදාළ නිලධාරීන් නිකන්ම බවුසරයක් යවන්නේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අවශ්‍යතාවය කර ගත්තට පස්සේ මන්ත්‍රීවරයත් හිරවෙන වැඩක් ඕක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- දීමනාවෙන් අඩු කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අවශ්‍යතාවය කර ගත්තට පස්සේ මන්ත්‍රීවරයාත්, අපි අතරත් ප්‍රශ්නයක් ඇති වෙන එක වෙන්නේ මේකෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- නැහැනේ. මම යෝජනාවක් කරන්නේ. අපි දින තුනක් කල් දෙමු. ඒ දින තුන ඇතුළත ගෙව්වේ නැත්නම් ඔහුගේ ඊළඟ දීමනාවෙන් අඩු කර ගෙන 10% ක් අධිභාරයක් එක්ක අයකිරීම් කටයුතු කරන්න. හැමෝටම ඒක ප්‍රශ්නයක් වෙන එකක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක විධිමත් විදියට සභාවේ න්‍යාය පත්‍රයට දාලා ගේන්න. ඊට පස්සේ අපි බලමු පළාත් පාලන කොමසාරිස්තුමාගෙනුත් අහලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- ඒකෙම තව එකක්. ඔබතුමාගේ කොට්ඨාසයේ මරණ දෙකක් වුණා. ඔබතුමත් සහභාගි වුණා. ජල බවුසර්වල ප්‍රශ්නය ආවා. අපේ සහෝදර මන්ත්‍රීතුමාගේ ගෙදරත් ඒ වෙලාවේ මළ ගෙදරක් තිබුණේ. මම යෝජනා කරනවා ලීටර් 1000 ජල ටැංකි තුනක් ස්ටෑන්ඩ් තුනක් ගහලා සකස් කරලා තියන්න. ඒ ටැංකි අවශ්‍ය ගෙදරින් පුරව ගනීවි. අපි දිනකට රුපියල් දෙසීය පනහක විතර අය කිරීමකට යටත්ව ඒ කටයුත්ත කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකත් මන්ත්‍රීතුමා න්‍යාය පත්‍රයෙන් එන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- මොල්ලිගොඩ වත්ත ප්‍රධාන මාර්ගයේ දෙපස තාප්ප බැඳලා තියෙනවා. ගෙපල් කපලා තියෙනවා අවිධිමත් විදියට ඉදිකිරීම් කරලා තියෙනවා. ඒ සීමාවන් ලකුණු කරලා දෙන්න මාර්ගය මැද ඉඳලා. ප්‍රීමික්ස් කරපු ස්ථානත් නැවත කැඩී බිඳී ගොස් තියෙනවා. ඒ නිසා ඒවා නැවත ප්‍රීමික්ස් මිශ්‍රණය යොදා ගෙන සකස් කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඒකටම සම්බන්ධ දෙයක් මටත් කතාකරන්න ඕන සභාපතිතුමා. කැළි කසල ප්‍රශ්නය ගැන කතා කරන කොට අපේ ගමේ, මම දැනට ගම්වාසීන් පිරිසක් එකතු කර ගෙන පරිසර කමිටුවකුත් පිහිටුවා ගෙන තියෙනවා. ඒ හරහා දැන් කුණු එකතු කිරීමේ තැනකුත් හදලා ඒ කුණු එකතු කරන ගෙදරට ගෙනත් දෙන්න කියලා කුණු ප්‍රශ්නයට සාමාන්‍ය විසඳුමක් විදියට කුණු භාරගන්නා මධ්‍යස්ථානයක් හදලා තියෙනවා. ඒක අපේ සියලු කොට්ඨාස වලට දැනුවත් කිරීමේ වැඩසටහනක් කරොත් හොඳයි. භාවිතා නොකරන පර්චස් 03 ක බිම් ප්‍රමාණයක් තිබුණොත් ඇති. පොඩි මඩුවක් හදලා කුණු භාර ගන්නා තැනක් හදා ගන්න පුළුවන්. ගමේ රැකියාවක් නැති කැපවීමෙන් වැඩ කරන්න පුළුවන් මනුස්සයෙකුට ඒක භාර දෙන්න පුළුවන්. ඒ කුණු ටික අදාළ තැනට භාර දුන්නම එතනින් යම් මුදලක් ලැබෙනවා.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- ඒක පැහැදිලි මදියි මන්ත්‍රීතුමිය. ප්ලාස්ටික් ඒවත් ගන්නවද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- සියලු දේ වෙන් කරලා ගෙනල්ලා භාර දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- ඉඳුල් ඒවාත් ගන්නවාද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඉඳුල් ගන්නේ නෑ. එදා වැඩසටහනේදී කිවුවේ එහෙමනේ. කුණු ටික වෙනම වෙන් කරලා දෙන්න ඕන. ප්ලාස්ටික් වෙනම, පොලිතින් වෙනම භාර ගන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- කුස්සියේ කුණු භාර ගන්නේ නැද්ද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඉඳුල් භාර ගන්නේ නෑ. ඒක තමන්ට කොම්පෝස්ට් බවට පත්කර ගන්න පුළුවන්කම තියෙනවානේ. ඒක දැන් මමත් ගමේ පටන් අරගෙන තියෙනවා. ඒක ගැන මම සභාපතිතුමාව දැනුවත් කරේ මේ සභාවේදී ඒවගේ පොඩි පොඩි වැඩසටහන් කරන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ කරන විදිය ගැන මන්ත්‍රීවරු දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කරේ අපේ ගමේ පිහිටෙව්වා පරිසර කමිටුවක්. ගමේ ක්‍රියාකාරි අය ඉන්නවානේ ශ්‍රමදාන වලට සහභාගි වෙන, ඇල්මක් දක්වන, දේශපාලනය පැත්තකින් තියලා ඒ අයට කියලා ගමේ කුණු ප්‍රශ්නය ගැන මෙන්ම මෙහෙමයි කැළි කසල ප්‍රශ්නය විසඳන්නේ කියලා ඒකට භූමි ප්‍රමාණයක් වෙන් කරලා අපි එතන ලැලි වලින් මඩුවක් හදලා සෙවිලි තහඩු ගහලා, බිමට සිමෙන්ති දාලා තියෙනවා. කැමැත්තෙන්ම එක්කෙනෙක් ඉදිරිපත් වුනා කුණු භාර ගන්න. ඒ කුණු ටික එහාට ගිහින් දෙනවා. බොහෝවිට හොඳයි ගෙවල් වලට අත්පත්‍රිකාවක් ගෙනිහින් දෙන එක. කුණු දෙන කොට වෙන් වෙන් වශයෙන් දෙන්න කියලා දැනුවත් කරන්න. අපි ඉඳුල් කොහොත්ම භාර ගන්නේ නෑ. බෑග් එක ගෙනත් දුන්න ගමන් භාර ගන්නේ නෑ. ඒ කුණු එක හලලා පිළිවෙලකට තියෙන්න ඕන. ඒක ඒ මනුස්සයා තෝරලා ගන්නවා. ඊටත් වඩා හොඳයි ගෙදරින්ම වෙන් කරලා ගේනවා නම්. ඒ ආකාරයට තමයි කුණු භාර ගන්නේ. ඒ වැඩසටහන මන්ත්‍රීවරු හරහා ගෙනියලා කැපවීමෙන් ගෙවල් වලට ගිහින් කොට්ඨාශවල ජනතාව දැනුවත් කරලා භාර දුන්නොත් හොඳයි. දැනට වක්වැල්ල ප්‍රදේශයේ ඒක කරනවා. පටන් ගැන්ම හොඳයි. ටික ටික මම බලාපොරොත්තු වෙනවා කට්ටිය දැනුවත් කරලා ඒක කරන්න හැම පැත්තෙන්ම. ඒක හොඳයි.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ සහෝදර චනක චමල් මන්ත්‍රීතුමාගේ ආදරණීය පියාණන් පසුගිය දා අභාවප්‍රාප්ත වුණා. ඒ පිළිබඳව ගොඩක් මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් අවමගුල් උත්සවයට සහභාගි වුණා. මන්ත්‍රීවරු වශයෙන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ සියලු මන්ත්‍රීවරු සිය සංවේගය පුදකරා. මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා අපේ ගරු සභාපතිතුමාගේ, මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, ලේකම්තුමා, කාර්ය මණ්ඩලය ඒ සංවේගය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි මේ අවස්ථාවේ එතුමාට පුදකරනවා කියලා ප්‍රකාශ කරන්න කැමතියි.

<u>**(ඊ) කාරක සභාවල වාර්තා**</u>

<u>**01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.07.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මුදල් කමිටුවට අපි විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 09

විපක්ෂව - 09

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 02

**2019-07-09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
06. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
07. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
09. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා

**2019-07-09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
08. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-07-09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-07-09 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සභාපතිතුමාගේ තීරක ඡන්දයෙන් සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එදා මුදල් කමිටුවට ඉන්දික මන්ත්‍රීතුමා සහභාගි වුනාද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඇයි ඔබතුමාට ප්‍රශ්නයක්ද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔව්. සහභාගි වුනාද? නැද්ද කියලා බලන්න ඇහුවේ. නොපැමිණියි කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතන තමන්ගේ මතය ප්‍රකාශ කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මතයක් ගැන නෙමෙයි මම ඇහුවේ. සහභාගි වුනාද නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සහභාගි වුනාද, නැද්ද කියන එක ඡන්දය දීමට බලපෑමක් නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා සද්ද නැතුව ඉන්න එපැයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සද්ද නැතුව ඉන්න ඕන නෑ. ඇසිය යුතු ප්‍රශ්නයක් මම ඇහුවේ.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-** නැත

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව ඃ-** නැත

**04. පරිසර සහ පහසුකම් කමිටුව ඃ-** නැත

**(උ෧) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජුනි මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස.6)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජුනි මස ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ මැයි මස හා ජුනි මස සංසන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ තියෙන්නේ අරවම නේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාසික ප්‍රකාශ මේ දාලා තියෙන්නේ. මේවටත් විරුද්ධද? වැටුප් ගෙවන්නත් බෑ එහෙමනම්. ඡන්දයක් විමසන්න නෙමෙයි කිවුවේ ස්ථිර කරන්න කියලා කිවුවේ.

04. වෙනත් ලේඛන

I. ප්‍රගතිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජූලි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතිය ගැන කීමේදී, මම යෝජනා කරලා තියෙනවා 2019.05.21 සභාවේදී ඔබතුමා බොහොම පැහැදිලිව කියලා තියෙනවා දැන් කතා කරොත් ප්‍රශ්නයට යන්නේ මේක. ජේ.සී.බී. එක පිළිබඳව ඔබතුමා බොහොම පැහැදිලිව කියනවා "ඔඩිට් එකට දෙන්න බෑ පළාත් පාලන කොමසාරිස්තුමාට පරීක්ෂණයක් කරන්න දෙන්නම්" කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් සම්බන්ධවද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ජේ.සී.බී. එක සම්බන්ධව. ඔබතුමා එතනදී බොහොම පැහැදිලිව කියලා තියෙනවා 2019.05.21 සභාවේදී 27 වන පිටුවේදී "අපි පළාත් පාලන කොමසාරිස්ට දෙන්නම් පරීක්ෂණය කරන්න. වෙන අයට බෑ." කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ ටිකත් කියවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊට පස්සේ තියෙන්නේ ප්‍රේමලාල් අබේසේකර කතා කරන ටිකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟට මම කියපු ඒවා කියවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** " ඒ ටික පැහැදිලි කරන්න" කියලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හපුගල වතුර ටැංකිය ගැන කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මොකක්ද කියන්නේ. අද සම්මත වුණා නේ පරීක්ෂණයක් කරන්න කියලා. දැන් හරිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සම්මත වුණා නෙමෙයි. ඒ ප්‍රගතිය ගැන කියන්නකෝ. මැයි මාසේ සභාවේ ගෙනාවා. ගෙනාවම කිව්වා ඒකට නම් දෙන්න බෑ පළාත් පාලන කොමසාරිස්තුමාට පරීක්ෂණයක් කරන්න දෙන්නම් කිව්වා. දැන් ටිකකට කලින් ඒ යෝජනාව ආවම කිව්වා අපිට බෑ ඔයගොල්ලන්ට ඕන නම් ඉල්ලන්න කිව්වා. මම මේ කියන්න යන්නේ මේකේ දෙකක් තියෙනවා. එකක් මේක.

දෙවෙනි එක ඇත්තටම ගරු සභාපතිතුමා ඔබතුමා දන්නවා අපි හිටපු කාලේ, දිග කාලයක ඉඳන්. දැන් මේ පරිපාලනය පිළිබඳ ප්‍රශ්නය තියෙනවා. අපි යෝජනා ගේනවා. මේ යෝජනා වලට මොනවද වුනේ. ඉස්සර ඉඳපු සභාපතිතුමාලා, ලේකම්ලා අඩු තරමින් අපි යෝජනාවක් ගෙනාවම ඒ යෝජනාව යවන්න ඕන තැනට යවලා අපිට පිටපතක් එවනවා. අද වෙනකොට ඒ දේ සිද්ධ වෙන්නේ නෑ. ඒක හරි ලොකු නරක තත්ත්වයක්. ඒක හින්දා මේක හොඳ නෑ.

ඊළඟට බොහොම පැහැදිලිව ඒ සභාවේදීම 28 පිටුවේ තියෙනවා. මීපාවල මහා විද්‍යාලය ඉදිරිපිට පාර ගැන. අපි නිකන් කිව්වොත් කුලරත්න හිටපු මන්ත්‍රීතුමාලගේ ගෙදරට යන සමරදිවාකර මැතිතුමාලගේ ගෙදර අයිනෙන් තියෙන පාර. ඒකට බොහොම පැහැදිලිව ෆිනෑන්ස් ආයතනයෙන් මුදල් ගෙව්වා තාප්පය බඳින්න. අපිට දැන ගන්න ඕන බොහොම පැහැදිලිවම ඒ පාරට කොච්චර ගෙව්වද කියලා. අපි දන්න තරමින් ලක්ෂ 11 ක් 12 ක් ගෙව්වා. දැන් අද සිද්ධ වෙලා තියෙන්නේ ඒ පාර හදන්න විදියක් නෑ. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා මුදල් වෙන් කරලා තියෙනවා. නමුත් අතන හදන්නේ නැතුව පාර හදලා වැඩක් නෑ. ඇතුල්වෙන තැන පුනීලයක් වගේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අදහස මොකක්ද?. දැන් මේ සභාවේ මුදල් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම බැලුවා බැලුවා හම්බ වුනේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලිව ඒ මුදල් මේ සභාවේ තියෙනවා. ෆිනෑන්ස් ආයතනයෙන් ගෙවලා තියෙනවා. ඔබතුමා අපි ඉඳපු සභාවක ගෙව්වේ. ඒවා වියදම් කරලා. අපි බොහොම පැහැදිලිව කියන එකක් තමයි මේ සභාවේ මූල්‍ය පාලනයක් නෑ. මූල්‍ය පාලනයක් තියෙනවානම් අපි දැන ගන්න ඕන ඊළඟ සභාව වෙනකොටවත් හැකි ඉක්මනින් දෙන්න ගිණුම් වල තියෙන මුදල් ප්‍රමාණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙලා තියෙන්නේ ඉඩම දෙන්න සභාවට නෙමෙයි මුදල් දීලා තියෙන්නේ. අයිතිකාරයන්ට. සභාවට මුදල් දීමක් නෙමෙයි වෙලා තියෙන්නේ. එයා ඔප්පුවකින් පැවරුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉඩමේ අයිතිකරුවන්ට නෙමෙයි දුන්නේ. එයා ඔප්පුවකින් පැවරුවා. මුදල් දුන්නේ සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉඩම සභාවට පවරාගන්න පුළුවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය පාර සම්බන්ධව ප්‍රශ්නය නම්, ඒ ඉඩම වෙන්දේසි කරද්දි ඒ මිනිස්සු ඒ පාරට අදාල ප්‍රමාණයට තමයි ඉඩම වෙන්කරේ. පාර පළල් කරනකොට තාප්පය කඩනවට තමයි මුදල් ගෙව්වේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාප්පය හදනවට තමයි මුදල් වෙන්කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරීතුමාට සභාව දැනුවත් කරන්න කාරක සභා අවස්ථාවක් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරී දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- පාර අඩි 20ක් කිරීමට අදාළව ඉඩම් හිමිකරුගේ තාප්පය කැඩීමට එකඟ නොවූ බැවින් එම ස්ථානයේ පාර පළල අඩි 15ක් බව හා පාරේ අනිත් කොටස අඩි 20ක් පවතින බව

- ෆිනෑන්ස් ආයතනය අදාළ බිම් ප්‍රමාණය සඳහා ඉඩම් හිමියාට මුදල් ගෙවා එම බිම් කොටස සභාවට පැවරූ බව
- පාර පළල් කිරීමේදී තාප්පය කඩා ඉවත් කරනවා නම් සභාව විසින් තාප්පය සාදා දිය යුතුය යන කොන්දේසිය මත එම ඉඩම සභාවට පැවරූ බව.
- තාප්පය සෑදීමට යන මුදල ෆිනෑන්ස් ආයතනය විසින් සභාවට ලබා නොදුන් බව
- එම තාප්පය අසලට වෙනකම් පස් දමා ගොඩකර මාර්ගය පළල් කිරීම සිදුකල හැකි බව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 2019.03.19 දින පැවති මහා සභා රැස්වීමේදී මම ගෙනැල්ලා තියෙනවා යෝජනාවක්. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ භූමිය අවසතු කිරීම පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් යනවා. ඒ පරීක්ෂණය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් අද වෙනකම් ගරු සභාපතිතුමනි ලැබුණේ නෑ. මම කියන්නේ ඔබතුමාට මේ ඔක්කොම බලන්න බැරිවෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉල්ලලා තියෙන්නේ. තාම ලැබිලා නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉල්ලලා තියෙනවා නම් රාජ්‍ය සේවයේ ඉන්න කෙනෙක් විදියට එක්කෝ අපිව දැනුවත් කරන්න ඕනනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් දාපු නඩු දෙකම නිශ්ප්‍රභා කරලනේ තියෙන්නේ. මම ආපු ගමන් සභාපති විදියට මෙහෙන් දීපු සංවර්ධන බලපත්‍රය තහනම් කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි පටලවා ගන්න එපා. මේ කතා කරන්නේ ඕක ගැන නෙමෙයි. ඒ නඩු ගැන නෙමෙයි කතා කරන්නේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරා ඒක ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරා නම් ඒක නීතිපති දෙපාර්තමේන්තුවට උත්තර යවන්න ඇතිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ ප්‍රශ්නය වෙන්නේ මේක. මම කියන්නේ කවුරුහරි කියන කියන එක කියන්න යන්න එපා. දැන් හරි ක්‍රමයක් හදන්න. දැන් මේ යෝජනාව කරේ තුන්වෙනි මාසේ. දැන් හත්වෙනි මාසේ. ප්‍රගතිය ගැන අහනකොට මොකක්ද අපිට තියෙන තත්වය. මම ඉල්ලන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරා. ඒ පරීක්ෂණය කරපු එක ගැන මොකක්ද වර්තමාන තත්වය කියලා ඉල්ලන්නේ. ඒ ඉල්ලීම කරා නම් ඒ යෝජනාව කරපු කෙනාට ඒ ලියුමේ පිටපතක් යවන්න ඕන. ඉල්ලලා යැව්වම තමන් රාජ්‍ය සේවකයෙක් විදියට මොකද කරන්න ඕන. මේ සභාවේදී අපිව දැනුවත් කරන්න ඕන. මේ යෝජනාව ස්ථිර කරලා තියෙන්නේ විශ්වජිත් මන්ත්‍රීතුමා. එතකොට මොකක්ද සභාවක ප්‍රගතිය කියන්නේ. ඔබතුමාලා අපි ඉඳපු සභාවල ඇත්තටම මේක කෙරුණනේ. මහ ලොකුවට දැන් තමයි ඔක්කොම කරන්නේ කියලා කියනවා. නිලධාරීන් හැට හුට හමාරක් ඉන්නවා. හැබැයි ඒ කොච්චර හිටියත් බොහොම පැහැදිලිවම එහෙම එවන්න කියන එකේ තේරුමක් තියෙනවා. මේ සභාවල්වල වෙච්ච දේවල් තියෙනවා. අපිට කියනවා ඔව් යැව්වා කියලා. හැබැයි යවලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැවත ඒක යවලා අබේසේකර මන්ත්‍රීතුමාට පිටපතක් දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක රජයේ සේවකයන්ට පුරුදු කරන්න ඕන දෙයක් නෙමෙයි. නාවම සිහි කැඳවීමක් දාන්න ඕන. මොකද තාම ආවේ නැත්තේ සභාවෙන් අපෙන් ප්‍රශ්න කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැවත ප්‍රශ්නය අපේ පිටට ඇවිත් තියෙන්නේ. නඩු දෙකතින් නිශ්ප්‍රභා වෙලා තියෙන්නේ. දැන් නීතිමය පැත්තට ගියාම අපිට විරුද්ධව යන්න වෙනවනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ සභාපතිතුමා මතක තියා ගන්න. මේක ගැන පොඩ්ඩක්වත් බය වෙන්න එපා. වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලලා යවන්න. තව පරීක්ෂණයක් අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේත් යනවා පරීක්ෂණයක්. එතකොට මේක ගැන අහලා යවන්න අපි බොහොම පැහැදිලිව කියනවා. දැන් මේ නිකන් බොරුවට බය වෙන්න දෙයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොරුවට බය වෙනවා නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා. මම සභාපති වෙන්න කලින් ලබා දීපු සංවර්ධන බලපත්‍රය අහෝසි කරා. ඒක තේරුම් ගන්න ඕන. අහෝසි කරලා අපි උද්ඝෝෂණ වලටත් සහභාගී වුනා. ගස් කපන ඒවා ගිහින් නැවැත්තුවා. ඒ වැඩේට අපි කරන්න පුළුවන් හැමදේම කරා. පොලීසියත් ඒ වෙලාවේ යම් තරමක් දුරට සහයෝගය ලබා දුන්නා. එතනදි අපි ගිහින් පොලීසියත් එක්කත් කතා කරලා වැඩ කරා. කපන අයටත් කතා කරලා වහාම අරන් යන්න කියලා ඒ මට්ටමෙන් වැඩ කරා. ඊට පස්සේ නඩු දෙකක් දැම්මා. ඒ වෙනුවෙන් අපිට කරන්න පුළුවන් දේ අපි කරා. ඒ නඩු දෙකම දැන් නිශ්ප්‍රභා කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නිශ්ප්‍රභා කරලා තියෙන්නේ මෙතන නඩුවක් නෑ කියලා නෙමෙයි. මෙතන අහන්න බෑ කියලා. අපි දැන් ඒකේ නඩුව දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි එක නිශ්ප්‍රභා කළේ අහන්න බෑ කියලා. දෙවනි එක දැම්මානේ. දෙවෙනි එකත් නිශ්ප්‍රභා කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දෙවෙනි එක නිශ්ප්‍රභා කරේ මොකද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි ?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දෙවෙනි එක නිශ්ප්‍රභා කරේ මේ උසාවියේ නෙමෙයි අහන්න ඕන කියලා. ඉහළ උසාවියේ අහන්න ඕන කිවුවා. තේරුණාද?. මීට අමතරව එකක් තියෙනවා බොහොම පැහැදිලිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ පරීක්ෂණය යනවා. මම යෝජනා කරලා තියෙනවා තුන්වෙනි මාසයේ. ඒක හින්දා මේක ගැන ඔබතුමාට ඕන තරම් නිදහසට කාරණා තියෙනවාද කියන්න. ඔබතුමාගේ වගකීම, යුතුකම තමයි මේ පරීක්ෂණ වාර්තාව ගෙනල්ලා ඉඩම වෙන්දේසිය සඳහා ඉඩකඩ නොදීම. බොහොම පැහැදිලිව මොකද වෙනම පරීක්ෂණයක් යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ලියාපදිංචි තැපෑලෙන් යවලත් ඇයි අපිට එවන්නේ නැත්තේ. අපි ආයේම එහෙට දන්වලා ඔබතුමාට පිටපතක් දෙන්නම්. ඔබතුමා ලබන මාසේ සභාවට කලින් ඒක ඉවර කරන්නකෝ. ඔබතුමාට අදම දෙන්නම්. ඔබතුමා ඉවර කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට මම කියන්නේ ගරු සභාපතිතුමනි, මම නෙමෙයි මේ ඕනම මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙනාවහම ඒ යෝජනාව ක්‍රියාත්මක වුනානම් යෝජනා කරපු මන්ත්‍රීවරයාට ඒ යෝජනාව ක්‍රියාත්මක වුනා, කොහොමද ක්‍රියාත්මක වුනේ කියලා ලිපියක් යවන්න. ඒක අපිට අරුමයක් නෙමෙයිනේ. මෙච්චරකල් ඒක සිද්ධ වෙලා තිබුණා.

එතකොට මොකද දැන් තත්ත්වය. බටුවන්තුඩාව පන්සල ඉස්සරහ තියෙන අර ගේ පිළිබඳව. දැන් ඔබතුමා කියන්න. මේ කරුණු අපි ඉදිරිපත් කරලා තියෙන්නේ, මෙතන දහනායක හාඩ්වෙයාර් එක, දසනායක සර්විස් සෙන්ටර් එක ගැන අද ඊයේ නෙමෙයි. අනිත් පැත්තෙන් එනවා ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනය පිළිබඳ ප්‍රශ්නය. ලිපි ගොනු අස්ථාන ගත වෙනවා. ආයේ එනවා. ආයේ යනවා. ආයේම ඒවා හමුවෙනවා. මේක සම්බන්ධව ඇත්තටම අපි නඩු දාන්න කිවුවම ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ගොඩනැගිල්ල හදපු එකට නඩු දාන්නේ තාප්පයට

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට වෙන වෙනම නඩු දෙකක් දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවදද දැම්මේ. තාම දාලා නෑනේ. 2015 ඉඳලා යනවා මේ ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිඥයට භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිටත් ඒවා දැනුවත් කරන්න කවුද නීතිඥ මහත්තයා කියලා. මොකද හේතුව නීතිඥයාට භාර දුන්නම බලන්න ඕන මොකද නඩුව තාම දාලා නැත්තේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිඥ නාලනි අරුමප්පෙරුම මහත්මියට භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවදද නඩුව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිඥයාට භාර දුන්නට පස්සේ දැන්වීම් කරන්නේ ඒ අය. අපිට කියන්න බෑ නඩුව තියෙන දවස. ඒක ඒ අය තීරණය කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි නෙමෙයි උසාවියෙන් තීන්දු කරන්නේ. මට මේක ගැන කියන්න ඕන. දැන් බලන්න නාවින්න අරලිය වත්තේ ප්‍රශ්නය. ඒකට අපි ගියාට සටහන් අරගෙන නෑ. ඒවා අපි නෙමෙයි මෙහෙන් කරලා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා නීතිඥ මහත්තයට ඒක භාර දීලා තියෙන්නේ. අපිට ඒක කරන්න පුළුවන්නම් අපි කරනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට බැරි බව තේරෙනවා. එහෙමනම් නීතිඥයෙක් වෙනවානේ. අපි අහන්න ඕන මොනවාද දැන් තියෙන අඩු පාඩු කියලා. ඔබතුමා පෞද්ගලිකව නඩුවක් දැම්මානම් කාටහරි ඔබතුමා නීතිඥයාට භාර දීලා තියෙන්නේ කියලා නිකං ඉන්නවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ගිහින් බලනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් බැලුවද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් බැලුවම මොකද කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** භාර දුන්නේ ගිය සතියෙනේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කියන්න අමතක කරන්න එපා. මේක දීලා කොච්චර කල් වෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොච්චර කල් වුනත් ඔබතුමාට හදිසි විදියට අපිට බෑ. සැලසුම් කමිටු තීරණ ගන්න ඕන. තාප්පයට දැම්මනේ නඩු. ඔබතුමාට නඩු දාන එකත් වැරදිද?. ඔබතුමා මෙතෙක් කල් කෑ ගහනවා නඩු දාලා නෑ කියලා. නඩු දාපු එකත් වැරදිද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දා ගෙන ඉන්න. දාලා කියන්න ඕන. මෙන්න මෙදා මෙහෙම වුනේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට නඩුව භාර දීපු නීතිඥයාගේ නමත් කිවුවා. ඔබතුමා බලන්න එහෙමනම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නෙමෙයි මේක සභාව බලන්න ඕන එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් කිවුවේ නීතිඥයාගේ නම කියන්න බලන්නම් කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක බලනවා. සභාවේ වගකීමක් තියෙනවා. ලබන සභාව වෙනකොටත් මෙම තත්ත්වයම තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කරන්න දෙයක් නෑ. නඩුවක් භාර දුන්නාට පස්සේ නඩු දිනය තීරණය කරන්නේ අපි නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සාධාරණද මම අහන්නේ. ඔබතුමා යන්න ඕන නෑ. ඔබතුමාගේ කවුරුහරි නියෝජිතයෙක් ඇති නේ උසාවි යන. එයාව යවලා අහන්න මොකක්ද මේ නඩුවේ තත්ත්වය සභාවෙන් අහනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපි අහනවා. ගිය සතියේ භාර දුන්නේ. මේ සතියේ ගිහින් අහනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ කතාව විතරක් නෙමෙයිනේ දැන්. දැන් කියපු අනිත් ප්‍රශ්න ටික ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බටුවන්තුඩාවේ ගේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියෙන් පරීක්ෂණයක් යනවා. ස්ථානීය පරීක්ෂණයකුත් කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගිය සභාව වෙනකොට කිවුවේ අපි සිහිකැඳවීම් ලිපි යවන්න ඕන කියලා තුන්පාරක් සති දෙකෙන් දෙකට. දැන් අවුරුදු තුනක් විතර තිස්සේ මේ කතාව යනවා. තාමත් බැරි වෙනවා. සති දෙකේ ඒවා කීයක් තියෙනවාද?. සභාපතිතුමා සභාවක් තියෙනවා කියන එක තේරුම් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න කොයි කාලේ සිද්ධ වෙච්ච එකක්ද ඒ. දැන් මේ ඉක්මනට, තදේට මම ආපු ගමන් ඔක්කොම ක්‍රියාත්මක කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කරපු දේ කියන්න කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම කතා කරන්න එපා. මෙතුමා බලන්නේ සතියෙන්, සති දෙකෙන්, මාසෙන් මේ ඔක්කොටම තීන්දු ගන්න. ඔබතුමා පුද්ගලිකව නම් කරලා එක එක දේවල් එහෙමනම් තීන්දු ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං තීන්දු ගන්න ඕන නේ. කවුද තීන්දු ගන්න ඉන්නේ. ඔබතුමා තමයි තීන්දු ගන්න ඕන. නාගරික සංවර්ධන අධිකාරිය එක්ක එකතු වෙලා තීන්දු ගන්න ඕන ඔබතුමා. අපි නෙමෙයි ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් අබේසේකර මන්ත්‍රීතුමා එක එක නම් කරන්න එපා. පොදුවේ ලබා දෙන්න අනවසර ඉදිකිරීම් ගැන විස්තර. ඔබතුමා එකක් දෙකක් නම් කරලා එකින් එක අහනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ ලොකු මිනිස්සු ඔක්කොටම දාන්න. ඔබතුමා නඩු දාලා කරපු එකක් කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේක ආරවුලකට යන්න ඕන නෑ අබේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමා ඕවා අහන්නේ ඔය මට්ටමෙන් නෙමෙයි. දිගින් දිගට මිනිස්සු චෝදනා කරනවා ඔබතුමාගේ ඉඩමට එහා පැත්තේ ඉඩම ඒක වගුරක් ගොඩ කරලා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කාටවත් මම නීතිය ක්‍රියාත්මක කරන්න එන්න එපා කියලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරු ඔක්කොම දැන ගන්න ඕන. අපි නිශ්ශබ්ද වෙලා ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නිශ්ශබ්ද වෙලා ඉන්න එපා. නිශ්ශබ්දව ඉඳලා හරියන්නේ නෑ ඔබතුමන්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් හොඳම උදාහරණයක් කියන්නම්. මේවා කතා කරන්න ඕන. තැන තැන අපිවත් විවේචනය වෙනවා. දැන් අබේසේකර මන්ත්‍රීතුමාගේ උළුවිටිකේ පැත්තේ ඉඩමක් වෙන්දේසි කරානේ අවුරුදු ගාණකට කලින් ඒකේ බෝඩ් එකක් ගැහුවානේ. ඒ ඉඩම විකිණීම පිළිබඳ චෝදනාවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ඉඩම මම විකුණලා අවුරුදු ගාණක් වෙනවා. මම විකිණුවට පස්සේ ඒ ඉඩම විකුණලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගොඩකරන ලද ඉඩමක් කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගොඩකරපු ඉඩමක් නම් ගොවිජන සේවා මධ්‍යස්ථානය ඒකට තීන්දුවක් ගනීවි. ඒකට තීන්දුවක් ගත්තා අවුරුදු දෙකකට කලින්. ගොඩකරපු ඉඩමක් කියලා කිවුවා නම් ඒක එහෙන් අහගන්න.

මම කිවුවේ ඔබතුමන්ලා අපිනේ මේවට වැඩ කරේ. දැන් මොකද කියන්නේ රොස්වුඩ් ඉඩම ගැන, වතුර ටැංකිය පාරේ ඉඩමට ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? අද වෙනකන් නැනේ. දැන් මේ මාසෙත් ගියානේ. තරංගා ලැන්ඩ්ස් ආයතනය කරේ. ඒක නාගරික සංවර්ධන අධිකාරිය අධීක්ෂණය කරේ. සභාපතිතුමාට හිතෙන්නේ නැද්ද මේවා ගැන අපි හැමදාම ඇවිත් කතාකරනවා කියලා.

වතුර පිළිබඳ ප්‍රශ්නය තියෙනවා බෝපෙ පෝද්දලට. මේකට කියන්නේ ඔබතුමාලා කතා කරාම ඔබතුමාලගේ දේ කෙරෙන හින්දා කවුරුවත් යන්නේ නැතෙයි, සභාපතිතුමානම් ඕකට එන්නේ නැතෙයි කියලා. දැන් මාස කීයක් වෙනවාද?. ඔබතුමා දින දෙන්නම් කිවුවා. අපි කිවුවා එන්නම් කියලා ඔබතුමත් එක්ක. අද වෙනකන් ගියේ නැනේ සභාපතිතුමා. අපේද මේකේ වැරැද්ද තියෙන්නේ. ඇත්තටම බෝපෙ පෝද්දලට දීලා නෙමෙයිද දෙන්න ඕන.

නිර්ණායකයක් තියෙනවා හදාගෙන යන ගෙවල් වලට වතුර ලබා දෙන්නේ නෑ කියලා. ගොඩකන්ද සුව සෙවන අර ගේ මොන සැලැස්මක් අනුවද හදලා තියෙන්නේ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට වතුර ලබා දුන්නේ ජල සම්පාදන මණ්ඩලයෙන්. අපි සම්බන්ධ නෑ නේ ඒකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි සම්බන්ධ නෑ කියන්නේ, අපිට වගකීමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වගකීම තියෙන්නේ ජල සම්පාදන මණ්ඩලයට. ඒකෙන් වතුර දීපු එක සම්බන්ධව මට මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහජනතාවට වතුර ලබා නොදීම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. සුව සෙවනට ජල සම්පාදන මණ්ඩලයෙන් වතුර දුන්නට අපි පළිද?. අපි මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි අහන්නේ, ඔබතුමා කතා කරන කොට අහන්න ඕන ඔයාලා අරකට දුන්නා නම් ඇයි හදාගෙන යන ගෙවල් වලට දෙන්න බැරි, පදිංචි වෙන්න ඕන කියලා කියන්නේ ඇයිද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ තර්කය තියෙන්නේ, මම ඉන්න මතය, ඒක සභාවක් විදියට වෙනස් වෙන්න පුළුවන්. අඩුම තරමේ ජල සම්බන්ධතාවය ලබා දීපු අයට පැය 18 ක් වත් ජලය දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔය කතාවේ වැඩක් නැති පැත්තට යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩක් නැත්තේ නෑ. ඔබතුමා කොන විතරක් අල්ලගෙන දඟලන්න එපා. ඔබතුමාලගේ ආණ්ඩුවෙන් කරන වැරදි මේවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවේ ප්‍රධාන විධායකයා ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු 04 ක් ගියාට ටැංකියක් හදා ගන්න බැරි වුනා. ඇත්ත කතාව ඒක.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ගිය සභාවේදී ඔබතුමාට මම ප්‍රශ්න වගයක් ඉදිරිපත් කරා. සභාපතිතුමා මට කිවුවා මේ සභාවේදී ඒ තොරතුරු ටික ලබා දෙන්නම් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ ඉඩම අනුමත කරලා තියෙනවා නාකන්දගේ සෝමසිරි කියලා කෙනෙක් නේවාසික භාවිතය සඳහා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඒ තාප්පය හදන්න අවසර ලබා ගෙනද තියෙන්නේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ. තාප්පෙට අවසර අරගෙන නෑ. කොන්ත්‍රාත් කරන කෙනෙක් බඩු ගෙනත් දාන්න තාවකාලික හට් එකක් හදලා තියෙනවලු ඇතුළේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- එහෙමද ඒක අනුමත කර ගෙන තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක අනුමත කරන්නේ නෑ. ඉඩම අනුමත කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- බොහොම ස්තුතියි සභාපතිතුමා. ඒ තොරතුරු ලබා දුන්නාට. ඒ ගැන තව තොරතුරු හොයාගෙන මම ඉදිරිපත් කරන්නම්. ඒ ඉදිකිරීම් කිරීමේදී ප්‍රශ්නයක් තියෙනවා මොල්ලිගොඩ ක්‍රසන්ට් පාරේ කාණුවක් සකස් කිරීමේදී. වතුර බැහැලා යන්න ඉඩ තියලා නෑ. බොහොම සුහදශීලිව මම ඒක අයිති මහත්තයට දැනුම් දුන්නා. නමුත් ඒක ගැන මේ වෙනකන් ක්‍රියාමාර්ගයක් අරගෙන නෑ. කන්දෙන් එන වතුර පාර ගෙවල් ඇතුළට යනවා. ඒ නිසා මම ඉදිරියේදී සොයා බලා කටයුතු කරන්න සභාවට ඉදිරිපත් කරන්නම් තොරතුරු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මොකක්ද රූපානන්ද මහත්තයාගේ වැඩේට කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට උත්තර පළාත් පාලන කොමසාරිස්තුමාට යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඊළඟට අනතුරුදායක පොල් ගහේ ප්‍රශ්නය පිළිබඳව උළුවිටිකේ තුසිත මහත්තයාගේ තත්ත්වය මොකක්ද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා** ඃ- ඊයේ පෙරේදා ගසක් කඩා වැටුණා. ඔබතුමන්ලා අනතුරුදායක නැහැයි කියලා ආපු ගහක් ඒක. අනූනමයෙන් බේරුණේ. පන්සල පහළ ගන්දෙල් ගහේ අතු කඩන් වැටුණා, කුස්සියට හානි වුනේ. ඒ මනුස්සයාගේ ගේ උඩට අත්තක් කඩන් වැටුණේ. සභාවෙන් අනතුරුදායක ගස් කප්පවන්න. සිරියාවති මහත්මියගේ ගහ සුළඟට වැනෙනවා. ඒක කපන්න සභාවේ සල්ලි නැහැ කිව්වලු. ඒ මිනිස්සු කපන්න කැමතියි. අපි ඒ ගහ සභාවෙන් කපලා ගෙනල්ලා විකුණලා ඉවර වෙලා ඒ මිනිස්සුන්ට සල්ලි දෙමු. වෙන්දේසි කරන්න බැරිද ගහ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- ගහ කපලා අරන් එන්න. ගහ ඕන නම් සල්ලි දීලා අරන් යන්න කියන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- සභාවට පුළුවන් ගහ කපලා වෙන්දේසි කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- අනතුරුනම් මිසක් කපන්න නරකයි. මිනිස්සු ඔක්කොම ගස් ටික කපා ගන්න හදන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, ප්‍රගතිය සම්බන්ධව ගොඩක් දේවල් කතා කරානේ. දැන් ප්‍රගතිය සම්බන්ධ කාරණයේදී අපි කිවුවා සභාවේ ප්‍රගතිය අපේ ඉලක්ක ප්‍රමාණය මෙච්චරයි, අපි මේ වෙනකොට කොපමණ ප්‍රමාණයක් සාක්ෂාත් කරගෙන තිබේද යන්න සාකච්ඡා කරන්න තමයි ප්‍රගතිය සමාලෝචනය කරන්න වෙන්නේ. හැබැයි කණගාටුවට කාරණයක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ මාසේම කරපු යෝජනාවල කරපු ටික ඔය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- මේක එහෙම නෙමෙයි. සාමාන්‍යයෙන් සභාවට ප්‍රගතිය ඉදිරිපත් කරන කොට අපි දැනගන්න ඕන, වාර්ෂික අයවැය ඉලක්ක කරගෙන නේ අපි ප්‍රගතිය මනින්නේ. අපේ අයවැයේ ඉලක්ක තියෙනවානේ. එහෙම ඉලක්ක කරපු මූල්‍ය වටිනාකමක්

තියෙනවා. සංවර්ධනය වෙනුවෙන් ඒ අදාළ මූල්‍ය වටිනාකමෙන් මේ කාලය තුල වියදම් කරලා කොපමණ ප්‍රමාණයක් සාක්ෂාත් කර ගත්තද කියලා අපි දැනගන්න ඕන. එක එක්කෙනා වෙන වෙනම යෝජනා කරන ඒවා තියෙනවා. ඒවා වෙන වෙනම සාකච්ඡාවට බඳුන් කරන්න ඕන. මම හිතන්නේ පොදු අදහසක් ප්‍රගතිය සමාලෝචනය කර ගන්න අවශ්‍යයි. ප්‍රගතිය දැක්ක ගමන්ම අපිට පොදු අදහසක් ගන්න පුළුවන් වෙන්න ඕන. අපේ සභාවේ ඉල්ලීම් වලින් කොච්චර සාක්ෂාත් කර ගත්තද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවස්ථාව දීලා තියෙන්නේ මන්ත්‍රීතුමා සභාවේ මන්ත්‍රීවරු යෝජනා කරන දේවල් වාචිකව සාකච්ඡා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ දීලා තියෙන්නේ ආදායම් හා වියදම් ශේෂ. මාසික ප්‍රගතිය නෙමෙයි. අපි මෙතෙක් ඉල්ලුවෙත්, අපිට දැන ගන්න ඕනකම තිබුණෙත් වෙන මුකුත් නෙමෙයි අපේ අයවැයට ඉලක්ක ගත දේවල්. දැන් මාස හතක් ඉවරයි. මොකක්ද දැන් අපිට තියෙන ප්‍රගතිය. එහෙමයි දැන ගන්න ඕන. ඒකයි අපි කිවුවේ. දැකපු ගමන් අවබෝධ කර ගන්න පුළුවන් මට්ටමේ එකක් දෙන්න කියලා. මේ ගැන විස්තර ගොඩක් ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මන්ත්‍රීතුමා මේ තියෙන්නේ ඒකනේ. මේ මාසික වියදම් සාරාංශය. මේවා තමයි බලන්නේ. මේකෙන් ගන්න පුළුවන් අදහසක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ඒ මාසෙට වියදම් කරන ටික අපිට ලබා දෙනවා. මුල ඉඳන් අපි කිවුවේ ප්‍රගතිය අපිට පහසුවෙන් සමාලෝචනය කර ගන්න විදියක් ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේ ටික එකතු කරලා ඒක හදා ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම හදා ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මාසෙන් මාසෙට බෑ. වර්ෂ අවසානයේදී පුලුවන්. මේ අයවැය වෙන කොට පුළුවන් අපි කොච්චර ඉලක්ක වලට ගිහින්ද කියලා බලා ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ ඉලක්ක වලින් අපි කොච්චර ප්‍රමාණයක් සාක්ෂාත් කර ගත්තද කියලා දැන ගන්න ඕන, ඒ වුනාට මේකේ තියෙන්නේ "ජේ. සී. බී. යන්ත්‍රය සභාවට ගෙන එන ලදී. ජංගම සේවා පවත්වන ලදී." නමුත් ප්‍රගතියේ කියන්නේ අපි පරිපාලන කටයුතු නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටනම් තේරෙන්නේ නැහැ ඔබතුමා එකක් කියනවා. අබේසේකර මන්ත්‍රීතුමා එකක් කියනවා. ප්‍රගතිය දක්වනවා එක එක විදියට. පාරවල් හදන ඒවා දැම්මොත් ඒක එපැයි කියනවා. එක එක පරස්පරතා කියනවා. මොකක් දැම්මත් වැරදියි මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක ඉදිරිපත් කරපු කරුණු කාරණා වල තිබුණේ ඒ කරපු සමහර ක්‍රියාවලි වල ප්‍රශ්න. ඔබතුමා කියන කාරණය වටහා ගන්නේ නෑ. මොකක් දැම්මත් එපැයි කියන එක නෙමෙයි කිවුවේ. දැන් මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට අදහසක් ගන්න ඕන. මේ වර්ෂය තුල කොච්චර වැඩ වෙලාද, කොච්චර සාක්ෂාත් කරගෙනද කියලා. මම කියන්නේ ඒක. ඒක පහසුවෙන් ගන්න බෑ. අපි මේක කිය කිය ගණන් හදලා දෙන එක නෙමෙයි. අපි ප්‍රගති වාර්තාවකින් ප්‍රගතිය දැන ගන්න ඕන. එවැනි ලියවිල්ලක් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා බලාපොරොත්තු වෙන දේ අපිට හදලා දෙන්න. මෙන්න මේකයි ඕන කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට අපි ඉදිරිපත් කරන්නම්. ඒ ආකෘතිය ලබා දෙන්නම්. අන්න එහෙම හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.**

**1. පොදු ගෙවීම් :-** නැත

**2. කර්මාන්ත ගෙවීම් :-** නැත

**3. සේවක ණය ගෙවීම් :-** නැත

**III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** මුලන නැගෙනහිර සමෘද්ධි ළිඳ ලග පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. රු. 209,347.74

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම් :-** නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** යුනිවර්සල් සිටි ළමා උද්‍යානය අසල පිහිටි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ සේවා පියසක් සහිත ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සම්බන්ධ යෝජනාව පිළිබඳව. (ගයන්ත ද සිල්වා මයා, ප්‍රජා සංවර්ධන නිලධාරි,බෝ.පෝ.ප්‍රා.ස.)

යුනිවර්සල් සිටි මිත්‍රත්ව සංගමය එකඟතාවය පළකරලා තියෙනවා එයාලා කියනවා දෙමහල් ගොඩනැගිල්ලක් අවශ්‍යයි කියලා. එම නිසා,

යුනිවර්සල් සිටි ළමා උද්‍යානය අසල පිහිටි අප ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ ඉදිකිරීමට යෝජිත සේවා පියසක් සහිත ප්‍රජා ශාලාවේ සැලසුම ලබා ගෙන නාගරික සංවර්ධන අධිකාරියේ එකඟත්වය ලබා ගැනීම සඳහා යොමු කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ලබුදූව ක්‍රීඩාංගනය සහ අතුරු මාර්ග නම් කිරීම සම්බන්ධව. (සී. පී. හෙට්ටිආරච්චි මයා, ලේකම්, විශ්ව මිතුරු සංසඳය, ලබුදූව.)

එම ලිපිය අනුව ලබුදූව ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය ''පද්ම ශාන්ත සම්පත් ක්‍රීඩාංගනය'' යන නමින්ද, තුත්තිරිපිටිය වත්ත ප්‍රදේශයට යන මාර්ගය ''රණවිරු කපිතාන් උපුල් අනුර කීර්ති මාවත'' යන නමින්ද, සණස සමිතිය අසලින් කුරුන්ද කන්ද දෙසට ගමන් කරන අතුරු මාර්ගය ''රණවිරු සාජන් සුසිල් ප්‍රියංකර මාවත'' යන නමින්ද, නම් කිරීම සඳහා විරෝධතා කැඳවා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබුදූව ක්‍රීඩාංගනය පිළිබඳ ගැටළුවක් නෑ නේද. ප්‍රදේශයේ මිය ගිය රණවිරුවෝ තුන්දෙනෙකුගේ නමින් නම් කරන්නේ. සම්මත කරලා අපි උපදෙස් අරගමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ දවස් වල විරෝධතා කැඳවලා සියල්ල කරා. බාස්වත්තට යන මාර්ගය විජයබන්දු කහදූව මාර්ගය ලෙස නම් කිරීමට. ඉඳපු සභාපතිවරයෙක්ගේ නමින් නම් කරන නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

මේ වෙන විට කපුහෙම්පල කතාකරපු ඉඩමේ කොස් ගහක් වැටිලා කපාගෙන යන්න ලැස්තිවෙනවා. අපි ප්‍රාදේශීය ලේකම්ට මේ වෙන කොට දැනුම් දීලා තියෙනවා. ඔබතුමත් ඒකට අවශ්‍ය පියවර ගන්න. ඒක කපලා උස්සගෙන යාවී නැත්නම්.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** අර සණස බැංකුව ගාව කාණු පද්ධතිය වැහිලා තියෙන්නේ. ඒ කාණු පද්ධතියෙන් ගලා එන වතුර ඒ මිනිස්සුන්ගේ වැසිකිළි වළ දක්වා ගමන් කරනවා. සණස බැංකුව ඉස්සරහම ගෙදරට මේ ප්‍රශ්නය තියෙන්නේ. පොඩ්ඩක් ඒ ගැන අවධානය යොමු කරවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිතුමාව යවලා ඒ ගැන බලන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අර අබ්දුල් හසීස් මාවතේ පොකුණ කඩලා දාන්න ඕන. අර ජරා වෙච්ච පොකුණ. ඒක තාම කඩලා නෑ. ඒක පාරට පේන්නේ නැති නිසා මිනිස්සු අශීලාචාර ලෙස හැසිරෙනවා. කුඩු ගහනවා, නොයෙකුත් දේ සිදු වෙනවා. ඒක ගැන බලන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන වෙනම බලන්නම් සභාපතිතුමා.

**03.** "විරු බිමට සරු ගසක් " රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීම. (ජේ. ජේ. සී. එස්. ටී. ලියනගේ මයා, විශ්‍රාමික මේජර් ජෙනරාල්, සභාපති, රණවිරු සේවා අධිකාරිය)

ඒ යටතේ ජේ. සී. බී. යන්ත්‍රය ඉල්ලනවා වළවල් කැපීම සඳහා. මෙතන තියෙන ගැටලුව තමයි බලප්‍රදේශයෙන් පිට දෙයක් වීම. පින්නදූව අධිවේගි පිවිසුමේ සිට ගාලු පාර දක්වා අක්මීමණ බලප්‍රදේශයට තමයි අයිති. ජේ. සී. බී. එක ගෙනාවා විතරයි. අපේ වැඩ කටයුතු හිරවෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දැක්කේ ඇත්තටම රණවිරු සැමරුමට අවුරුදු 10 ක් සම්පූර්ණ වීම නිසා තියෙන වැඩ සටහනක් විදියට රුක්රෝපණ වැඩ සටහන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අක්මීමණ සභාවේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අක්මීමණ සභාවේ නෑ. මීට කලිනුත් අපි මේ දේට සහයෝගය ලබා දීලා තියෙනවා ඔබතුමන්ලා අපි ඉඳපු සභාවල අපිම යෝජනා කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රශ්න කරන්නෙත් ඔබතුමාලම තමයි. තව දේකට ඉල්ලුවොත්, බලප්‍රදේශයෙන් පිට දේකට ඇයි නොදෙන්නේ, ඇයි දෙන්නේ, තේරුණාද?. සභා බලප්‍රදේශය නෙමෙයි මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒකට ඕන තීන්දුවක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ මම දකින දේ. ඕන තීන්දුවකට මම එකඟයි. සභාව කතා කරලා ගන්න තීන්දුවකට මම එකඟයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක ජාතික වැඩ සටහනක්. පක්ෂ පාට වැඩක් නෑ. රණවිරුවෝ වෙනුවෙන් අපි ඕන දෙයක් කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවශ්‍ය දවස් ගණන සඳහන් කරලා නෑ. සතියක් විතර දෙන්න වේවිද දන්නේ නෑ. එක දවසක් නම් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එකවිටම ඒක ප්‍රතික්ෂේප කරාම විරෝධතාවයක් වගේ පේනවා. හොඳම දේ ඔබතුමා ඒ සඳහා විමසීමක් කරන්න අවශ්‍ය වන්නේ දිනකටද, දින දෙකකටද කියලා. ඊට එහා දෙන්න බෑ. ඔබතුමා කියන්න බලප්‍රදේශයේ වැඩ කටයුතු බහුල බැවින් දින දෙකකට වඩා ලබා දෙන්න අමාරුයි කියලා. එකසැරේම විරෝධතාවයක් දැක්වුවහම ඒක හොඳ නෑ. පක්ෂ පාට බලලා නෙමෙයි අපි කතා කරන්නේ. මේක ජාතික උත්සවයක් විදියට සලකන්න. මේක නරක වැඩකුත් නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැමදේම අපෙන් ඉල්ලන්නේ. පළාත් පාලන දෙපාර්තමේන්තුව ඉල්ලන්නෙත් අපෙන්. පුදුම වැඩක්. නගර සභාවේ බැකෝ තුනක් හතරක් තියෙනවා. වතුර බවුසරයක් ඉල්ලලාවත් දුන්නේ නෑ අපිට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පරිත්‍යාග කරන නිසානේ මේ වගේ ඉල්ලන්නේ.

අදාළ රුක් රෝපණ වැඩසටහන සඳහා වළවල් කැපීමට ජේ. සී. බී. යන්ත්‍රය අවශ්‍ය දින ගණන විමසා උපරිමය දින දෙකකට යටත්ව ජේ.සී.බී. යන්ත්‍රය ලබා දී අවශ්‍ය සහයෝගය ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා මේ වතුර බවුසර් නිකං දෙන එක නතර කරන්න ඕන. පන්සල්, පල්ලි, කෝවිල් සුද්ධ කරන්න ඉන්නවා ඒ ආගම් අදහන මිනිස්සු

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නිකං දෙන්නේ නෑ. සල්ලි බඳින්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, තව එක දෙයක් දැන ගන්න අවශ්‍යයි. 2019.06.18 මහ සභාවේදී ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රීතුමා යෝජනා කරා මන්ත්‍රී කණ්ඩායමේ ඡායාරූපය සියලු මන්ත්‍රීවරුන්ට ගෙවීමකින් තොරව ලබා දෙන්න කියලා. එම යෝජනාව මම ස්ථිර කරා. ඔබතුමා සඳහන් කරා ඒ ගැන පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසලා උත්තරය ලබා දෙන්නම් කියලා. ඒකට මොකද වුනේ කියන කාරණය දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මිල ගණන් කැඳවලා ඒකත් එක්කම යවන්න ඕන.

VI. විගණන විමසුම් පිළිබඳ වාර්තා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විගණන විමසුම් පිළිබඳ වාර්තා සභාගත කරනවා.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.08.20 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.